## මාසික මහ සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| ස්ථානය | :- | රඹුක්කන ප්‍රාදේශීය සභාව |
| දිනය | :- | 2025.07.08 |
| වේලාව | :- | පෙ.ව. 10.00 |

**සහභාගිත්වය**

ගරු සභාපති ,

1. ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,

2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
16. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
17. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
18. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
19. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
20. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
21. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
22. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
23. පී.ජී.මල්ලිකා මැතිතුමිය
24. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
25. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
26. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
27. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
28. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
29. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
30. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
31. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
32. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය

**නිලධාරී සහාභාගිත්වය**

- ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා ගරු සභාපතිතුමා විසින් පිළිගැනිමෙන් පසු තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ). 2025.06.20 දින පැවති මාසික මහා සභා වාර්තාව සම්මත කිරීම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.07.08 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද නොයඑසේ නම් 2025.07.08 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

සංශෝධන

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

දෙවැනි පිටුවේ සංශෝධනය කළයුතු දේවල් සංශෝධන වී නොමැති බව ප්‍රකශ කරන ලදි. ප්‍රතිපත්ති මාලාවේ ඇති පොහොසත් රටක් ලස්සන හෙටක් ප්‍රතිපත්තියට මා ඇතුළු කණ්ඩායම සහයෝගය ලබා දෙන බව සටහන් වී නොමැති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

නමවැනි පිටුවේ සඳහන් කමිටු සඳහා පත්කිරීම් වලට විරෝධතාවක් නොමැති බව සටහන් වී ඇතත් එය කමිටු සඳහා පත්කළ පුද්ගලයින්ට විරෝධතාවයක් නොමැති බව විය යුතු බවත්,ඊට අමතරව ඔබතුමා පැවසුවා අපගේ දේශපාලනයට සහය දුන් අය නිසා මේ අය පත් කළයුතු ය බව ඒක දේශපාලනීකරණය නොකරන ලෙස පැවසුවත් එය සටහන් වී නොමැති බව ප්‍රකාශ කරන ලදි.

දහවැනි පිටුවේ සඳහන් මහජන ගැලරිය විවෘත කිරීම පනතේ තිබෙන බැවින් ඒ සඳහා විශේෂ යෝජනාවක් ගෙන ඒමට අවශ්‍ය නොවන බවත්,අවශ්‍ය අයට සහභාගී වීමට හැකිබව ප්‍රකාශ කළ අතර එය සඳහන් වී නොමැති බව හා සංඛ්‍යාවක් ගැන සටහන් කර නැති බව ප්‍රකාශ කරන ලදි.

එකළොස්වන පිටුවේ සඳහන් මහසභා රැස්වීමේදී කණගාටුව ප්‍රකාශ කළා ලෙස සටහන් වී ඇති නමුත් එය මහ මැතිවරණය වෙනුවෙන් ලෙස නිවැරදි විය යුතු බව ප්‍රකාශ කරන ලදි.

දහතුන්වන පිටුවේ මාර්ග පළුදු කිරීම ගැන සඳහන් කරන විට මාර්ග කඩතොළු කිරීමට ඇප මුදලක් අය කරන බවත්,ඒ වගේම කාර්මික නිලධාරිනගේ පසු ඇගයීමට ලක් කිරීම කළ යුතු බව සටහන් වී නොමැති බව ප්‍රකාශ කරන ලදි.

දහසය වැනි පිටුවේ සඳහන් කරුණු දැක්වීම පිළිබඳ නොව ගාමිණී සමරකෝන් මන්ත්‍රීතුමාට මෙම මාර්ගය සඳහා විශේෂ සටහනක් කිරීමට අරාධනා කරනවා යැයි සටහන් වියයුතු බව ප්‍රකාශ කරන ලදි.ගියවර සභාවේ දිවුරුන් දෙන අවස්ථාවේ නොව දිවුරුම් දී පළමුවෙන් ශ්‍රමදායකත්වයෙන් මෙම මාර්ගය පිළසකර කළා ලෙස සඳහන් විය යුතු බවත්,මාර්ගය පිළිබඳ නිලධාරින් සමඟ සාකච්ඡා කළ බව හා අධිවේගී මාර්ගයට භාණ්ඩ ප්‍රවාහනය කරන මාර්ග පමණක් පිළිසකර කරන නමුත් මෙම මාර්ග කනක හේරත් මැතිතුමාගේ ප්‍රදානත්වයෙන් පිළිසකර කිරීමට යෝජනා විය. බවත්, වත්මන් ආණ්ඩුව ඒ යෝජනාවට කුමක් කරයිද කියලා මම දන්නේ නැති බව ප්‍රකාශ කළ ඇති බවට නිවැරදි විය යුතු බව ප්‍රකාශ කරන ලදි.

දහඅට වැනි පිටුවේ සඳහන් මංතීරු සකස් කිරීම නොව මංතීරු මැද කොටසේ මල් වගා කිරීමට යෝජනා කරන ලද බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

ගියවර මාසික මහසභා වාර්තාවේ විශාල සංශෝධන ප්‍රමාණයක් පෙන්වා දීම ගැන ස්තුතිවන්ත වන අතර කලින් ආණ්ඩු කාලයේ සභා වාර්තාව පිළිබඳ මෙවැනි උනන්දුවක් දක්වා තිබුණා නම් හොඳ බවද ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමන්ලා විවාදාත්මක කරුණකට යාම අවශ්‍ය නැත. අපි හරි දෙයට පමණක් විවාද කරමු.පසුගිය අවුරුදු 2 ක කාලයක් තුළ ප්‍රාදේශීය සභාවක් පිහිටුවා නොමැති අතර මන්ත්‍රීවරුන් සිටියේ නැත.දැන් අලුත් නිලධාරින් රාජකාරි කරන්නේ එක නිසා මෙහි අත්දැකිම නිලධාරින්ට ද අලුත්ය. තවද

රේකෝඩින් එක පැහැදිලි නැත.වාහන හා දුම්රිය යන විට ඝෝෂාකාරී බව වැඩිය.අඩුපාඩු එනවා ආවට පසුව තමා ඒවට උත්තර සොයන්න වෙන්නේ මයික් සවිකර මම අද එය නිවැරදි කළ බවත්,වාර්තාවට අපි බලපෑම් නොකරන බවත්,දෙපැත්තේ සිටින මන්ත්‍රීවරුන් උදව් කරනවා නම් හොඳ බවත්,ප්‍රකාශ කරන ලදි.සංශෝධන ඇතිනම් ඉදිරිපත් කරන ලෙසත්, නැත්නම් සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

සමීර මන්ත්‍රීතුමා මතු කළ කාරණය ගැන මම දැන් නැවත කියවා බැලිමක් සිදු කළා මම ප්‍රකාශ කළ කරුණු වල මූලික හර පැහැදිලිව තිබෙන බවත් මට එය ගැටලුවක් නොවන බවත් ප්‍රකාශ කරන ලදි.පසුගිය වාර්තාවේ ඔබතුමා කණගාටුව ප්‍රකාශ කළ ප්‍රකාශය සටහන් වී ඇති බව ද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නැවතත් විවාදාත්මක කරුණු වලට නොයන ලෙස පවසන ලදි. සභාවේ ලියවිල්ලේ අදහස වැරදි නම් පමණක් එය ප්‍රකාශයට පත් කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

2025.07.08 දිනැති මහසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරිම සුදුසු බව ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව 2025.07.08 දිනැති මහසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.07.08 දිනැති මහසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත වූ බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදනය - නැත

(ඇ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමාගේ නිවාඩු ලබා ගැනිම පිළිබඳ නිවේදන ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ගරු සභාවට යෝජනා කරන ලදි. සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. අසනිප බැවින් 2025.07.08 දින පැවැත්වෙන මහ සභාවට සහභාගි විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලදි.ඒ අනුව 2025.07.08 දින පැවැත්වෙන මහ සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබාදිම සුදුසු බවට ගරු මහ සභාව විසින් අනුමත කරන ලදි.

ii. හදිසි අනතුරකට ලක් වීම නිසා රඹුක්කන දිසා රෝහලේ ප්‍රතිකාර ලබන බැවින් 2025.07.08 දින පැවැත්වෙන මහ සභාවට සහභාගි විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2025.07.08 දින පැවැත්වෙන මහ සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබාදිම සුදුසු බවට ගරු මහ සභාව විසින් අනුමත කරන ලදි.

**(ඇ).සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම - නැත**

**(ඉ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත**

**(ඊ). යථාපරිදි කල්දී ඇති යෝජනා**

**(ඊ).1. ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

i. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තිය සමඟ කියවිය යුතු 132 වගන්තිය යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අතරින් මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන බලතල එම පනතේ 12 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මෙම ප්‍රාදේශීය සභවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත පවරා දිය යුතුය බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**පුනරාවර්තන වියදම්**

- ❖ සභික දීමනා සහ කාර්ය මණ්ඩල වැටුප්,අනෙකුත් දීමනා රු.ලක්ෂ 70 ක උපරිමය දක්වා ගෙවීම.
- ❖ අනෙකුත් පුනරාවර්තන වියදම්උපරිමය රු.ලක්ෂ 10 දක්වා

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

අංක i යෝජනාවේ 1987 අංක 18 දරණ ප්‍රාදේශීය සභා පනතේ නොව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ යනුවෙන් නිවැරදි විය යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ප්‍රාදේශීය සභවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත පවරා දිම අනුමත කිරිම තීරණය විය.

ii. ප්‍රාදේශීය සභාවක රැස්වීම්වලට සහභාගි වීම වෙනුවෙන් සභාපති,උපසභාපති හා සභිකවරුන්ට මාසිකව ගෙවිය යුතු යැපීම් දීමනා,ගමන් වියදම් දීමනාවල එකතුව උපරිමය අදාළ ප්‍රාදේශීය සභාවේ වාර්ෂික අයවැය ලේඛනයේ ආදායම් සැලකිල්ලට ගනිමින් රුපියල් අටදහසක උපරිමයකට යටත්ව සභාව විසින් තීරණය කරනු ලබන මුදලක් වීම බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිරි කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධයෙන් පැහැදිලි කිරිමක් අවශ්‍ය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපට මාසිකව දුරකථන හා ඉන්ධන දීමනාව රු8000.00 හා රු5000.00 ක් ලෙස ගෙවීම් සිදු කර ඇත.එහෙත් අලුත් නීතිය යටතේ එය රු3000.00 හා රු5000.00 ලෙස රු8000.00 ක උපරිමයකට යටත්ව සීමා කර ඇත.සභාවේ වැඩ කටයුතු වලට සහභාගි වීම වෙනුවෙන් රාජ්‍ය නිලධාරින්ට අකෘතියකට අනුව ගෙවීම් කරනු ලබයි.මේ පිළිබඳ වැඩිදුර උපදෙස් අවශ්‍ය නම් ලේකම්තුමා හමුවන ලෙස ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ලේකම්තුමාගේ උපදෙස් ලබා ගැනිමට කාරක සභාවකට පත් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විනාඩි 2 කට කාරක සභාවක් බවට පත් කළ බවත්,ලේකම්තුමාට කථා කිරිමට අවසර දෙන බවත්, ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ලේකම් ආර්.එස්.ජී.නිරෝෂන් මැතිතුමා**

මෙම කාරණය 2025 වර්ෂයේදී ගරු ආණ්ඩුකාරතුමිය විසින් අතුරු නීතියක් රාජකාරි කටයුතු සඳහා සම්මත කර ගැසට් කර ඇත. එම ගැසට් නිවේදනයේ ඉන්ධන සඳහා රු.5000.00 ක් හා දුරකථන දීමනාව සඳහා රු 3000.0 ක් තීරණය වුණත් එය ගෙවීමට විගණනයේදී ප්‍රක්ෂේප විය.පනතේ තිබෙනවා මන්ත්‍රීතුමන්ලාට ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීමට හැකි බවත්, ගරු ආණ්ඩුකාරතුමිය එය රු8000.00 ට යටත්ව අතුරු නීතිය අනුව ගෙවීම් කළ හැකි බව දන්වා ඇත.සභාපතිතමා සඳහා රු1000.00 ක්ද උපසභාපතිතුමාට රු800.00 ක ගමන් වියදම් දිමනාවක් හා මන්ත්‍රීතුමන්ලාට රු700.00 ක දීමනාවක් ගෙවීම සිදු කරන්නේ පැය 12 ක් සම්පුර්ණ විම මතය. පැය 12 ට අඩුයි නම් භාගයක් ගෙවනු ලබයි.මෙම ගෙවීම් සිදු කරනනේ සභාවේ රාජකාරි කටයුතු සඳහාය. මෝටර් රථයකින්,පොදු බස්රථයෙන් යන විට යැපීම් දිමනාවක් එකට අදාළ වේ.පැය 12 ක් නම් යැපීම් දීමනාව රු1000.00 ක් වේ. මේ සඳහා ආකෘති පත්‍රයක් ඇත.එය විස්තර සහිතව පුරවා ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපට වරප්‍රසාදයක් දිලා තියෙන්නේ එය අවංකව පාවිච්චි කිරිම කළොත් හොඳයි.කලින් නම් ගියත් නොගියත් දීමනාව ලබාදිම සිදු කළා දැන් එය නීතියකට යටත් කර ඇත. ආණ්ඩුකාරතුමිය දන්වා ඇත්තේ ආයතන සංග්‍රහයේ පවතින ආකාරයට ලබාදිම සුදුසු බවය.විගණනයට ද හසු නොවී තමන්ට අදාළ පැය 12 ක දීමනාව ලබා ගැනිම කරගත යුතු ය.මෙයට කිසිම දෙයක් ඉල්ලන්නේ නැත එහෙත් තමන්ගේ බේරීම සඳහා බස් එකෙන් ගියාද එහෙමත් නැත්තම් දුම්රියෙන් ගියාද කියලා පොඩි ලියවිල්ලක් තියා ගැනිම අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදි.කාරක සභා අවස්ථාව අවසන් බව ගරු සභාපතිතුමා සභාව වෙත දන්වන ලදි.ආයතන සංග්‍රහයේ රාජ්‍ය නිලධාරින්ට මෙය ලබා ගැනිමේදී බස් ටිකට් එක,දුම්රිය බලපත්‍රය,නැවති සිටියානම් හොටෙල් එකේ බිල්පත වැනි දේවල් ඉදිරිපත් කිරිමට අවශ්‍ය වේ.මන්ත්‍රීතුමන්ලා වන අපට එවැනි දේවල් අවශ්‍ය නොවේ. ලියවිල්ලක් තබාගැනිමට කියා සිටියේ කවදාහරි දවසක අවශ්‍ය වුනොත් ඉදිරිපත් කිරිමටය.එහෙම නොවුනහොත් ගෙවන අපිත් අමාරුවේ ගන්න ඔයාලත් අමාරුවේ.ඒඅනුව කාලය පැය 12 ත් 6 ත් අතර ගෙවීම් සිදු කරන අතර රු8000.00 ක උපරිමයකට යටත්ව ගෙවන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පැය දෙකක වැඩකට යන්නේ නම් මෙය ගැනිමට නොහැකිය. මෙම දීමනාව සකස් කර ඇත්තේ ලබා ගැනිමට නොවන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපට නම් මෙය ගාණක් නැත මොකද අපි රට හදන්න පැමිණි අය නිසා බව ප්‍රකාශ කරන ලදි.මෙම දීමනාව ගන්ට නොදෙන එකක් නොව ගන්ට දීලා තියෙන්නේ එය අවංකව ලබා ගැනිම සුදුසු බව ප්‍රකාශ කළ අතර ප්‍රාදේශීය සභාවේ වැඩකට යන්නේ නම් සභාපතිතුමාගේ ,ලේකම්තුමාගේ හරි සටහනක් දමා යාම සුදුසු බව දන්වන ලදි. මෙය අපගේ පෞද්ගලික වැඩක් නොව වියදම් අඩු කිරිම රජය විසින් කරන වැඩපිළිවෙලක් බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

යැපීම් දීමනාව,ගමන් වියදම් දීමනාවල එකතුව රු 8000.00 ක උපරිමයකට යටත්ව ලබාදීමට අනුමත කිරිම තීරණය විය.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා**

2025.07.08 න්‍යාය පත්‍රයේ මුද්‍රණ දෝෂ පැවති බැවින් එම දෝෂ නිවැරදි කර සභාවට ප්‍රකාශ කරන ලදි.

iii. රඹුක්කන නගර ප්‍රදේශය සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දැනට භාවිතා නොකරන ප්‍රධාන දුම්රිය ස්ථානාධිපති නිලනිවස හා ඊට යාබද පිහිටි නිල නිවස ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මේ යෝජනාව අනුව දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධ වීම නිසා ප්‍රශ්නයක් තියෙනවා ඔබතුමා කලින් මේ ගැන සාකච්ඡා කර තිබෙනවාද? ලබා ගැනීමට හැකියාවක් ඇති බව සිතීමට පුළුවන්ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ ගැන තාම සාකච්ඡා කර නොමැති බව ප්‍රකාශ කරන ලදි.අපි කරපු ශ්‍රමදානයේදී තමා මෙම ස්ථානය සොයා ගත්තේ මට දැණුනු විදිහට තමා මේ ගැන යෝජනා කලේ අපගේ ආයුර්වේදය ද බොහොම දුප්පත් මට මතකයි මම කුඩා කාලයේදී පෞද්ගලික බස් නතර කරන ස්ථානයේ එහා පැත්තේ සභාව තියෙන කාලයේ ටිකක් දුර ගොඩනැගිල්ලක ආයුර්වේද මධ්‍යස්ථානය පවත්වා ගෙන ගියා නමුත් දැන් අපගේ ආයුර්වේදය පහළ තට්ටුවේ පොඩි කැල්ලක තමා පවත්වාගෙන යන්නේ වෛද්‍යතුමිය මට ප්‍රකාශ කළා මේකට මොකක් හරි කරලා දෙන්න කියලා. එවැනි අවස්ථාවක තමා මෙම ගොඩනැගිල්ල හමු වුනේ මෙයට දුම්රිය ස්ථානාධිපතිතුමාගේ පොඩි අකමැත්තක් පැවතියත් දැන් අකමැත්තක් නැති බව මට වැටහුනා.දෙයිද නොදෙයිද කියලා දැන්ම පැවසිය නොහැකිය.මේ ගැන කථා කිරීමට සභාවේ අවසරයක් නැතුව බැරි හින්දා මෙය සභාවට දමා සභා අවසරය ඇතිව සාකච්ඡා කිරීම සුදුසු බවත්, ලිපියක් මාර්ගයෙන් බලය තරකර ගැනීමට අවශ්‍ය නිසා මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදි.මේ අවට ප්‍රදේශවාසී බොහොදෙනෙක් මෙයට කැමැත්ත දක්වා ඇත.මම මෙම ගොඩනැගිල්ල ඉල්ලුම් කරන්නේ අවුරුදු 05 කට නොමිලේ දැනටමත් මෙය නිකන් තියෙන ගොඩනැගිල්ලක් දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩකුතු නෑ අපිට වැඩකුත් නෑ මුදල් යන්නේ එකම රජයක මහභාණ්ඩාගාරයකටය. එම නිසා මහජන සේවාවක් කිරීමට බලාපොරොත්තු වන නිසා මෙම ඉල්ලීම කරනනේ යැයි ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙම යෝජනාව අතිවිශිෂ්ටයි.ගරු සභාපතිතුමනි, මම දැක්කා පෝරස්ට් එකක් දමලා තියෙනවා අපිට මෙහි ආයුර්වේදයක් පවත්වාගෙන යාමට ඉඩපහසුව නොමැති වීම ලොකු අඩුවක් වී ඇත.මෙම ස්ථානය ලබා ගන්නේ ජනතාවට සේවාව සැපයීමට ඒවගේම අපි අවදානය යොමු කරනවා අපේ ප්‍රජා ශාලාව ඉදි කිරීමෙන් පසුව එම ස්ථානයෙන් වෙන් කර ගැනීමට පුළුවන්නම් ආයුර්වේදය අපේම තැනක පවත්වා ගෙන යාමට පුළුවන් බවත්, මේ යෝජනාව මම හොඳ නෑ කියනවා නොවේ.ඇත්තටම මෙය වෙන්ට ඕනැ යෝජනාවක් මොකද මෙය කැළෑවට යන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් ඕනැම රජයේ ස්ථානයක් වේවා මේවා මහජන දේපලය.අපට මෙය ආයුර්වේද මධ්‍යස්ථානයකට යොදා ගන්නවා නම් ප්‍රධාන වශයෙන් මාර්ග ගැටලුව ඇති වෙනවා මොකද මේ ආයුර්වේද මධ්‍යස්ථානයට සහභාගි වන්නේ වැඩිහිටි ජනතාව නිසා ,මෙයට සම්බන්ධ වීමට කැගල්ල පාරෙන් මාර්ගයක් ඇති බව අපි දන්නා නමුත් ඒ වගේම කෙටි මාර්ගය විදිහට රේල් පාර හරහා පඩිපෙළ යොදා ගැනීමත් සිදු වේ.දුප්පත් පුද්ගනයෙක් බස් එකේ නගරයට ඇවිත් බැහැලා පයින් දුරක් ගමන් කරක විට ප්‍රායෝගික ගැටලුවක් ඒ වගේම පඩිපෙළ භාවිතා කරන්නේ නම් ආරක්ෂාවට ගැටලුවක් මතු වේ.අපි එකටත් අවදානය යොමු කර සුදුසු පියවරක් ගැනීමට සුදුසු බව පවසන අතර ඔබතුමාට අපි සහයෝගය ලබා දෙන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීත්මන්ලාගෙන් හා කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මම හිතනවා ඔබතුමාගේ යෝජනාව කාලෝචිත යෝජනාවක් කියලා ගරු සභාපතිතුමනි,එකේදී මං හිතන්නේ ඔබතුමාගේ අදහස රඹුක්කන ජනතාව වෙනුවෙන් ගන්න හොඳ යෝජනාවක් හැටියට සුභ පතනවා. ගරු සභාපතිතුමනි,මෙතන ප්‍රායෝගික ගැටලුවක් වෙන්නේ දුම්රිය දෙපාර්තමේන්තුව කියන්නේ වෙනත් ආයතනයක් නමුත් මේකෙදී මං හිතනවා ඔබතුමා වැඩි උත්සහයක් ගන්නේ නොමිලේ ලබා ගැනිමට මං හිතන්නේ දුම්රිය දෙපාර්තමේන්තුව අපිට බොහොදුරට නොමිලේ ලබා නොදෙන බවත්,අපිට බද්දකට තමා යන්න වෙන්නේ ඊට වඩා අදහසක් විදිහට ඔබතුමාට යෝජනා කරනවා සභාපතිතුමනි,අපිට මේ සභාවට අයිති ගලඋඩ නිල නිවාසක් ඇත.ඒ ගොඩනැගිල්ල පාවිච්චියට ගැනිමට ඔබතුමාගේ අවධානය යොමු කරනවා නම් හොඳ බවත්,අනෙක අපේ සතිපොළ එහා පැත්තේ කැල්ලක් පවතිනවා පසුගිය සභාවාරයේදී එය පුද්ගලයෙකුට බදු දීලා තිබ්බා.නමුත් එම පුද්ගලයා එය අයිති කර ගැනිමට ගිහින් නැවත එය නතර කර වෙනත් පුද්ගලයෙකුට ලබා දිම සිදු කළා. මෙම සභා දේපලකි.එහි ආයුර්වේදයක් ස්ථාපනය කිරිමට ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරයි.කියලා මං හිතනවා.මේ යෝජනාවට සියලුම දෙනා සහයෝගය ලබා දෙනවා. මෙහි ප්‍රායෝගික ගැටලුවක් වන්නේ නොමිලේ ලබා ගැනිමය.ඔබතුමා දරණ උත්සහය අගය කොට සලකනවා මොකද රඹුක්කන සියලුම ජනතාව වෙනුවෙන් ගන්නා තීරණයක් බැවින් මෙම ආයුර්වේද මධ්‍යස්ථානයට එන රෝගීන් ඉද ගැනිමට තැනක් නැතිව දැඩි අපහසුතාවයට පත් වෙනවා වැඩිපුර එන්නේ වයසක උදවිය නිසා ඉතා හොඳ එළිමහන් තැනක් අවශ්‍යයයි. ඔබතුමා ගත්ත යෝජනාව අපි එකමතිකව සම්මත කරනවා.නමුත් මම හිතනවා ඔබතුමා මෙම යෝජනාව සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා කර ඒ හරහා මහා මාර්ග ඇමතිතුමාගෙන් ඔබතුමා ඉල්ලීමක් කරලා කථා කිරිමෙන් මෙය ලබා ගැනිමට හැකිවෙයි කියලා විශ්වාස කරනවා.ඔබතුමා කීවා වගේ කැලේ වැදිලා තියෙන බැවින් අපි අවුරුදු 05 කට නොමිලේ අරගෙන අපේ සභා ස්ථානයේ ආයුර්වේදයක් සකස් කර ගැනිමට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියමින් මේ යෝජනාවට අප සියලු දෙනා සහයෝගය ලබා දෙන බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීත්මන්ලාගෙන් හා කාර්ය මණ්ඩලයෙන් ද මාධ්‍යවේදීන්ගෙන් ද අවසරයි.විශේෂයෙන් මම මතක් කරනවා ඔබතුමාගේ මෙම යෝජනාවක් කාලෝචිත යෝජනාවක් බවත්, අපි සියලුම දෙනාගේ සහයෝගය ලබාදෙන බව මතක් කරමින් පැවසුවේ දුම්රිය දෙපාර්තමේන්තුව කියන්නේ නීතියට වැඩ කරන ආයතනයක් බවය.මමත් මීට පෙර සභාවේ පාරක් ලබා ගැනිමට සඳහා අවුරුදු 2 ක පමණ කාලයක් මහන්සි වෙලා ලොකු උත්සහයක් දරලා කොහොම හරි සභාවට පාර ලියා ගැනිම සිදු කළ අතර,මෙම පාර දුම්රිය මාර්ගය අතර මැද තමා පිහිටා ඇත්තේ, මෙම පාර සකස් කර ගැනිමට ද අවශ්‍යාව ඇත.අන්තිමේට වරිපනම් බද්දක් ලෙස අපෙන් චෙක්පතක්ද ලියා ගත් බව ප්‍රකාශ කරන ලදි.මෙය .මම හිතන ස්ථානය වෙන්ට ඕනේ. ස්ථාන දෙකක් තියෙනවා. එකක් නම් පරිහරණය කරන අතර උඩ තියෙන නිල නිවාසය හොඳ අදහසක් වුණත් ගරු සභාපතිතුමනි එම ස්ථානය මම දන්නා තරමින් ආරක්ෂිතව බීමට ජලය ගන්නා වතුර ටැංකියක් ඇත.එම ටැංකියෙන් තමා දුම්රිය ස්ථානයේ සියලුම ස්ථාන වලට වතුර සපයන්නේ එම ස්ථානයෙන් ගමන් බිමන් හදාගත්තොත් එහි ආරක්ෂිත තත්වයට හොඳ නැති බව නිසා මෙය ආයුර්වේද මධ්‍යස්ථනයට සුදුසු නොවේ.මම එම ස්ථානය ගොස් බලන විට එම ස්ථානයේ ආරක්ෂාව මැද හොඳ කෞතුකාගාරයක් සම්බන්ධ ස්ථානයකි.ඒ කාලේ විදේශිකයන් සකස් කළ මට හිතාගන්න බැරි විදිහෙ ජෝයින්ට් දමලා සකස් කළ ළිඳක් පවතින බවත්,මෙම ස්ථානය වෙනස් කරලා රඹුක්කනට උචිත සභාවට අයත් ස්ථානයක මෙවැනි දෙයක් කිරිම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.කාලය ගත වෙන්නේ නැතිව ඔබතුමාගේ ඉල්ලීම පරිදි සමහර විට සාර්ථක වීමට ද හැකිවේ.දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ වැඩ කිරිම අමාරු බවත්,මෙම යෝජනාව දුම්රිය දෙපාර්තමේන්තුවේ සභාවකට යොමු කර එයින් සම්මත කර අප වෙත

දන්වන විට කාලයක් යනු ඇත.සභාවට අයත් විශාල ඉඩ ප්‍රමාණයන් පවතින බැවින් නගරයට ආසන්නව විශේෂ තැනක් සොයා කටයුතු කරන එක සාර්ථකය.දෙවැනි එක කැගල්ල පාරේන් ගමන් කරනවාට වඩා කෙටි පාරවල් සෙයා ගෙන යාමට කැමති බැවින් දුම්රිය පාරෙන් එහා පැත්තට ගමන් කිරිමට වැඩි උනන්දුවක් වයසක අය දක්වන බැවින් දුම්රිය ආරක්ෂාව මදි බවද ප්‍රකාශ කරන ලදි.සභාපතිතුමාගේ යෝජනාව විශිෂ්ටයි.අපි පූර්ණ සහයෝගය ලබා දෙනවා නමුත් මෙම ස්ථානය වෙනස් කර සභාවට යාබද ස්ථානයක් තෝරා ගන්නා ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දුම්රිය දෙපාර්තමේන්තුව පමණක් නොව හැම ආයතනයනික්ම වැඩ කර ගැනීම අමාරුය.අනෙක් ආයතන උදව් කරන්නේ නෑ.හැබැයි නව ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තමයි.අපි ආයතන හා විෂයන් බෙදා ගෙන තියෙන්නේ මේ රටට උදව් කරන්න පමණයි.තම තමන්ගේ ගොඩ වෙනුවෙන් පෙනීසිටිමට නොවන බවත්, ජනාධිපතිතුමාගේ සංකල්පය හා ක්‍රියා පිළිවෙල මෙය බව ප්‍රකාශ කරන ලදි.මම හිතනවා මෙය අමාරු වෙන එකක් නැති වෙයි කියලා.මේක ඇදි ඇදි යන ප්‍රශ්නයක් නොවේ එක ලියුමයි දෙකයි.බැරිනම් ඉවත් කර දමනවා ඒක තමා මගේ ක්‍රමය බවත්, දුම්රිය පාර උඩින් යන එක තමා ප්‍රශ්නයකට තියෙන්නේ මෙ තමා ඉතිහාසයේ තිබෙන පරණම පාර මම ගුවන් මාර්ගයක් සකස් කිරිම යෝජනා කරන විට දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු එයට කැමැත්ත ප්‍රකාශ කළ බව සඳහන් කරන ලදි.අපට කථා කරලා කර ගන්ට බැරි වෙන එකක් නැති බවත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු2025.07.18 දින රඹුක්කනට එන බැවින් මේ පිළිබඳ සාකච්ඡා කරන බවද,ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ප්‍රධාන දුම්රිය ස්ථානාධිපති නිල නිවාස ආයුර්වේද මධ්‍යස්ථානය සකස් කිරිමට දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරිමට තීරණය විය.

iv. රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු මධ්‍යම වෙළඳපළ කඩ හිමියන් විසින් ව්‍යාපාර කටයුතු නිසි ලෙස සිදු නොවීම පිළිබඳ කරුණු දක්වමින් ඒ සඳහා මධ්‍යම වෙළඳපළ මැදින් සති පොළ භූමියට ප්‍රවේශ විය හැකි පාරක් සකස් කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.ඒ අනුව කරන ලද නිරීක්ෂණ පරිදි එය කළ යුතු බැවින් ප්‍රධාන මාර්ගයේ සිට සති පොළ දක්වා මධ්‍යම වෙළඳපළ මැදින් සතිපොළට භූමියට ප්‍රවේශයක් කිරීමත්, ඊට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

මෙම යෝජනාව හෙඳයි.සතිපොළට කොතැනින් වැටෙන එකද යනුවෙන් මාර්ගය පිළිබඳ පැහැදිලි කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මධ්‍යම වෙළඳපළ මැදින් දිවෙන මාර්ගය සඳහා යෝජනා කළ බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

මෙම යෝජනාව හොඳයි.පසුගිය සභාව විසින් එම මාර්ගයේ මැද පුරවලා හොඳ වැඩ කොටසක් කළා. ඉතිරි වැඩ කටයුතු කර ගෙන යාමට තියෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරිය සැලැසුම් කර ඇත රඹුක්කන සංවර්ධනය කරන කිරිමට.එහිදී මෙය ද සංවර්ධන කිරිමට ඉල්ලුම් කර ඇත.ඒ නිසා ඔබතුමා ඒ පිළිබඳ අවධානය යොමු කර ලෙසත්,එම සංවර්ධනය වැඩ පිළිවෙල හරහා එය සංවර්ධන වුනොත් අපට සභාවේ මුදල් වෙනත් දෙයකට යෙදවිමට පුළුවන් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔබතුමා කියන කාරණය හරි වෙන්න ඇති.ඒක ඉතිහාසයේ නමුත් මම කීවේ පොලීසිය,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,ගොවිජන සේවා මධ්‍යස්ථානය සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව,ව්‍යාපාර ප්‍රජාව මේ සියල්ල එකට එකතු වී නගරය සංවර්ධනයට උදව් කරන වේලාවක් එකේ පොලිසියට ප්‍රශ්නයක් තියෙන්වා ට්‍රැෆික් ප්‍රශ්නය එය ඉටු කිරිමට නොහැකි වන්නේ අපි හින්දා ඒ කියන්නේ දේශපාලන අධිකාරිය නිසා ත්‍රීවිල් පොලිසිය එක පැත්තකට අයින් කරන විට ත්‍රීවිල් රියදුරා ඒ පිළිබඳ දේශපාලනය අධිකාරියට දැනුම් දෙනවා. ඉන්පසු දේශපාලන අධිකාරියට පොලිසියට දොස් කියන විට එම ආයතනයට එය කර ගෙන යැමට නොහැකි බැවින් රථ වාහන පාලනය කර ගැනිමට නෙහැකි වෙනවා.පාක්ෂිකයෝ නොවුනත් ආණ්ඩුබලය අපේ නම් අපි තීන්දු ගන්නවා සතිපොළෙ වෙළඳ සංකීර්ණය මැදින් පාර පිටුපසට අරිනවා.එතකොට වෙළඳ සංකීර්ණයට ප්‍රශ්නයක් එනවා.ඒකට තමා මගේ ඊළඟ යෝජනාව මාළු කඩ ප්‍රශ්නය.දැනට වෙළඳ සංකීර්ණයේ මැද කඩ වහලා නමුත් කඩකුලී ගෙවනවා.මේ ගැන පැවසු විට වෙළඳ මහතුන් පැවසුවේ පාර්භෝගිකයන් නොයන බවයි.සතිපොළට ගමන් කරන්නේ අනෙක් පැත්තේන් පුළුවන් නම් වෙළඳ සංකීර්ණයේ මැද විවෘත කර දුන්නොත් වෙළදාම සිදු කර ගත හැකි බව ප්‍රකාශ කරන ලදි.මෙය සැලැස්මේ එක් අවස්ථාවක් වටරවුම එක දිගේ වාහන නතර කළාම වටරවුමේ පාර පළල් කිරිමේ ප්‍රතිඵලයක් නැ.අපේ ඊළඟ අදහස තමයි වෙළඳ සංකීර්ණයේ පර්මට් එක. එහි බයිසිකල් රථ ගාල පාරේ තිබෙන බවත්,එය පාරේ නතර කිරිමට නොහැකි බව ප්‍රකාශ කරන ලදි.දුම්රිය මාර්ගය දෙපැත්තේ හා වටරවුමමේ මෙහා පැත්තේ නතර කිරිමට නොහැකිය.ඒ නිසා බයිසිකල් රථ ගාල පේමර්ට් එක දමා. ත්‍රීවිල් රථගාල වෙළඳ සංකීර්ණයේ පිටිපසට ගෙන යනවා. එතකොට එතන තියෙන රෙදි කඩ වලට වෙන දෙය අහන්ට සිදු වෙනවා. එම නිසා මගේ ඊළඟ යෝජනාව තැන්තැන් වල අක්‍රමවත්ව තියෙන රෙදි කඩ ටික ක්‍රමවත්ව එක් තැනක ස්ථාපනය කිරිම.මෙම රෙදි කඩ තැන්තැන්වල වෙළෙන්දන්ට ඕනැ විදිහට සකස් කර ඇත්තේ. ඒ වුණත් මිනිසුන් ගැවසෙන්නේ නැති බැවින් වෙළදාම සාර්ථක නැති බව පවසන ලදි.මෙම ප්‍රශ්නයට කාර්මික කමිටුව ද යෝජනාවක් යොමු කර ඇත.සෙල්ලම් මිදුල සකස් කර ඇති තැන හා U.D.A.එකට අදාළ නැති අපට අයත් කොටසේ රෙදි කඩ දැම්මට.එම යෝජනාවට සැලැස්ම සකස් කරමින් සිටින අතර එයට රෙදි වෙළෙන්දන්ද කැමති බව පවසන ලදි. ඒ වගේම භූමිය ඉතුරු වෙනවා. එය රථගාලකට හා U.D.A.එකේ අදහසක් තියෙනවා. වෙළඳ සංකීර්ණය කඩලා පිටුපසට ගැනිමට එය අනාගතේ සිදුවන දෙයක්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ද මේ ගැන සාකච්ඡා කළ බවත් පවසන ලදි.අපි සභාව සතු දේපල වන සතිපොළ,රෙදි කඩ ටික පස්සයට ගැනිමට යෝජනා කරන අතර,දැනට ඉදිකර ඇති සෙල්ලම් මිදුලේ පොඩි කොටස ගැළපෙන විදහට සකස් කිරිම සිදු කරනවා මිස එම සෙල්ලම් මිදුල කඩලා විනාශ කරනවා නොවෙයි.එකෙත් අවශ්‍ය ටික පමණක් සකස් කිරිමට තමා අපේ අදහස වන්නේ මේ ටික කර ගැනිමට සභාවේ අනුමැතිය ලබා ගැනිමට මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

මාළු කඩ දෙකේ ප්‍රශ්නය කඩකුලි ගෙවන්නේ ඇතුලේ කඩ දෙකට පමණයි.මෙම මාළු කඩ සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂ මහතාගෙන් හා මහජනතාවගෙන් ප්‍රශ්න එනවා දුර්ගන්ධය නිසා මාර්ගයේ ගමන් කිරිම නොහැකි බවට මේ සියල්ලට උත්තර සෙවීමට තමා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

වෙළඳ සංකීර්ණයේ බිල්ඩින් එක ඇතුලෙන් මාර්ගයක් යන කථාවක් ද එතකොට සභාපතිතුමනි,දැනට තියෙන මාළු කඩ දෙක පාරට ගෙනැල්ලා තියෙනවා ගොඩනැගිල්ල දෙපැත්තේ තියෙන පාරවල් දෙකට වෙන්නේ කුමක්ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එහි එක පැත්තක මාර්ගයක් තිබෙන බවත්, අනෙක් පැත්තේ මාර්ගයක් නොමැති බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගොඩනැගිල්ල මැදින් යන විට මාර්ගයේ වාහන වලට ගමන් කිරිමට පුළුවන් ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගොඩනැගිල්ල මැදින් යන මාර්ගය ඇතුල් වීමට පමණයි.පිටවීම අනෙක් පැත්තෙන් බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

කඩ මැදින් ගොඩනැගිල්ල හරහා යනකොට තට්ටු ගොඩනැගිල්ලක් නිසා යන්න පුළුවන්ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙහි ලොකු වාහන නොව එදිනෙදා වෙළඳපළට භාණ්ඩ රැගෙන යාමට එන පොඩි වාහන බයිසිකල් නතර කරන්නේ වටරවුම එකේ. මෙහි පිට පැත්තෙන් හා ප්‍රාදේශීය සභාව පැත්තෙන් ද වාහන වලට ගමන් කිරිමට හැකියාව ඇත.සංවර්ධනයට බධාවක් වන මැද තිබෙන රෙදි කඩ හා මාළු කඩය.යෝජනා ගෙනාවට මේවට උත්තර දෙන්නේ නැතිව මාර්ගය සකස් කිරිම නොහැකිය.වෙළෙන්දන්ද සුදානම් එක තැනකට එන්න දැන් තිබෙන තත්වය ප්‍රධාන මාර්ග අල්ලාගන්න පුළුවන් කෙනා අල්ලගන්නවා බැරි කෙනා පැත්තකට යනවා. අදත් උදේ අම්මා කෙනෙක් ඇවිත් පලා ටිකක් විකිණීමට හඩ් එකකට අවසර ඉල්ලා සිටියා. ඒ වගේ ප්‍රශ්න වලට උත්තර දිමට සිදුවන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඔබතුමා මෙම යෝජනාව සත්භාවයෙන් යුතුව ඉදිරිපත් කර ඇති බව අපි දන්නා නමුත් මෙය සත්භාවයෙන් ඉදිරිපත් කර ඇතත්, ප්‍රායෝගික ගැටලු මතු වෙයි.මොකද නාගරික අධිකාරිය මගින් අපේ වෙළඳ සංකීර්ණය පිටිපසට ගැනිමට අදහසක් තියෙන බව ගිය ආණ්ඩුව මගින් ද සාකච්ඡා වුණ කාරණයක් එතකොට අපි මාර්ගය විවෘත කරනවා.කියලා දෙපැත්තේ තියෙන මාර්ග දෙකම වහන්න හරි එකක් වහන්න හරි නොවේ.බොහෝ දුරට වෙළඳ සංකීර්ණය මැදින් ත්‍රීවිල් එකේ යන මනුෂ්‍යයා වෙළඳ සංකීර්ණය ඇතුලෙන් සතිපොළ හරහා යයි කියලා අපට සිතිය නොහැකිය.මෙය ප්‍රායෝගික විශාල ගැටලු ඇති වෙයි. වෙළඳ සංකීර්ණය මැදින් මාර්ගයක් දැමීම හොඳ බවත්,මොකද මස්,මාළු කඩ සියල්ල පිහිටා ඇත්තේ ඇතුලේ ඇත්තටම මෙම කඩ දැනට වැසි පවති.කඩවල වෙළඳාම අතින් මිනිසුන්ට විශාල හානියක් සිදුව ඇත.අපි විකල්පයක් හැටියට ගරු සභාපතිතුමනි, අපට පුළුවන් නම් වෙළඳ සංකීර්ණය ඉතා ඉක්මනින් නාගරික සංවර්ධන අධිකාරියත් සමඟ සම්බන්ධවෙලා සාකච්ඡා කර පසුපසට අරගෙන ස්ථිර ස්ථානයක් සකස් කරනවා නම් හොඳ බවත්, මොකද ඉදිරියේදී අධිවේගී මාර්ගය විවෘත වීමත් සමඟ මෙම නගරය විශාල වාහන තද බදයකයක් අති වෙයි නගර මධ්‍යයේ පවතින තැනක් බැවින් බයිසිකල් වලට ගමන් කිරිමට වෙළඳ සංකීර්ණය මැදින් පාරක් විවෘත කරන්නේ නම් විශාල අපහසුතාවයකට පත් විය හැකිය.ඔබතුමා අදහස් කළා බයිසිකල් සඳහා රථ ගාලක් සකස් කරනවා කියලා.අපි මේ අවස්ථාවේදී මෙය හැදුවොත් තව අවුරුදු දෙකකින් තුනකින් නැවත වෙනස් කිරිමට සිදු වෙයි.නගර අලංකරණය උඩ නාගරික සංවර්ධන අධිකාරයත් එක්ක බලවන විට මෙය නැවත ආපස්සට ගැනිමට සිදු වුනොත් මෙය අපි සිදු කරන කෙටි කාලීන බොරු වැඩක් වෙන බවත්,මේ පිළිබඳ ඔබත්මාගේ අවදානය යොමු කරයි කියලා සිතන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේකට ලොකු වියදමක් යන වැඩක් නොවේ.එකක් තමයි ඉස්සරහා තියෙන එක පොඩ්ඩක් සකස් කර ගැනිමට සිදු වෙයි. බයිසිකල් ,ත්‍රීවිල් එකක් දැමීමට අඩි 10 ක පළල කොටස මට්ටම් කිරිම වියදම් කරන්නට සිදු වේ.ඉතිරි ටික මට්ටමට ඇත.එහා පැත්තටද යන්නත් පුළුවන් සතිපොළෙහි වෙළෙන්දන් සුදානම් ඔවුන්ගේ තියෙන අමුද්‍රව්‍ය පාවිච්චි කරලා ස්වේච්ඡාවෙන් අපි ලබා දෙන ස්ථානයක වෙළඳ කුටි සකස් ගන්න.එබැවින් සභාවට ලොකු වියදමක් දැරිමට සිදු නොවෙයි. නමුත් අපි මෙම වැඩේට ප්‍රවේශයක් ලබා ගැනිමට අවශ්‍ය වේ.වෙළඳ සංකීර්ණයට පිටුපසින් මාර්ගය ගියොත් අර වෙළෙන්දන්ට මොකද වෙන්නේ මේක මගේ අදහසකටත් වඩා වෙළඳ සංකීර්ණයේ වෙළෙඳ මහතුන්ගේ අදහසක් මෙහි පාරට පේන්නේ කොටසේ වෙළඳාම් වෙනවා.ඇතුළු කොටසේ වෙළඳාම් සාර්ථක නැති බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

මෙය පටන් ගත්ත ව්‍යාපෘතියක් වෙළඳ සංකීර්ණය හරහා තිබුණු බිත්තිය කඩලා එතැනට දොරක් සවි කර පසුගිය සභාවෙන් මැද පුරවා ඉතුරු කර ඇත.මාර්ගයේ ගැට්ට පුරවා ඇත.ඒ ටික විතරක් කර ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව වෙළඳ ප්‍රජාවගේ ඉල්ලීමකි.මැද පිහිටි කඩ කාමර 08 ක් වහලා ඇති බවත්,එය හේතුව විමසූ විට ඔවුන් පැවසුවේ පාරිභෝගිකයන් නොයෙන නිසා ඇතුලේ එළවළු විකුණට වෙළඳුන් පිටතට පැමිණ එළවළු වෙළඳාම් කර ඇති බවත්, එයට සභාව නොතිබුණ කාලයේ පොලිසිය එය ඉඩ නොදුන් නිසා එළවළු විකිණීමට නොහැකි බැවින් එළවළු ගෙනත් නැත්තේ ඔය හේතුව නිසා එම වෙළඳ මහතුන්ගේ අදහසක් තමා අපි මේ ක්‍රියාත්මක කරන්නේ යැයි ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

පොදු වෙළඳ සංකීර්ණය මැදින් මාර්ගයක් ගිහින් සති පොළට වැටෙන විට මං හිතින්නේ කඩ හිමියන් ඊට වඩා ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙයි.මොකද වාහනය කෙලින්ම සතිපොළට යන්නේ මහ නතර කිරිමක් සිදු නොවේ. ඒ වගේම වෙළඳ ව්‍යාපාරිකයන් අසලින් වාහන ගමන් කිරිමෙන් අපහසුතාවයට පත් වේ.අඩි 12 ක් වගේ පොඩි ඉඩ ප්‍රමාණයක් තියෙන්නේ.වාහන ගමන් කළ පසුව පිටුපස කඩ තියෙන්නේ මැද මොනවා හරි ලබා ගැනිමට රථගාලට ගොස් වාහනය නතර කර මිනිස්සු එහෙම බඩු ලබා ගැනිමට එන්නේ නෑ යන ගමන් අරගෙන යන පිරිසක් ඉන්නේ ඒ නිසා ඊට වඩා ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙයි.මාර්ගය යන විට ප්‍රායෝගිකව මුහුණ දෙන්නට වෙන ප්‍රශ්න තමා ඊට පසුව සභාවට පැමිණිලි එයි.මොකද වාහන යනවා විතරයි. ව්‍යාපාරික මහතුන්ගේ යෝජනාවක් නම් අපි ඒකට අවනත වෙන්ට ඕනෑ.ඒ වුනත් ප්‍රායෝගික ගැටළු එනකොට සභාවක් විදිහට සභාපතිතුමාට වගකිමට සිදුවන බැවින් ඒ ගැන අවදානය යොමු කරන ලෙසත්,මං නැවත වතාවක් හිතන්නේ සාකච්ඡා කරලා අපේ සැලැස්මේ මාර්ගය අපි විවෘත කරලා නැවත U.D.A.එකේ සැලැස්ම අනුව සකස් කිරිම සිදු කලොත් වියදම් දෙකකි.මෙයට ලොකු වියදමක් නොදැනුනත් නමුත් ප්‍රයෝජනයක් තිබෙයිද කියන එක ගැටළුවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ඔබතුමාගේ යෝජනාවේ පොළෙහි මේ පැත්තේ මාළු කඩේ ළඟින් අතුළු වීම තව එකක් තිබෙනවා කුඩාගම ස්ටෝර්ස් එක අතරින් පොළට පිටුපසින් වෙළඳ සංකීර්ණය මාර්ගය තිබෙනවා 2023 නාගරක සංවර්ධන අධිකාරියේ රැස්වීමේදී මේ සැලැස්ම පිළිබඳ සාකච්ජා කළා.කඩ පේළි අයින් වුණාට පස්සේ ගරු සභාපතිතුමා යෝජනා කළ මාර්ගය විවෘත වෙනවා මං හිතන්නේ කලින් වෙළඳ සංකීර්ණය මැදින් මාර්ගය තිබුණු බැවින් මෙම මාර්ගය විවෘත කිරිම හොඳ බවත්,නමුත් එහා පැත්තෙන් කුඩාගම ස්ටෝර්ස් එකත් වෙළඳ සංකීර්ණයත් අතරින් මාර්ගයක් යනවා.පොළට පිටුපසින් ඒ ගැනත් U.D.A.එකේ රැස්වීමේදී සාකච්ජා වුණා සංවර්ධනය කිරිමට ඒ සමඟම මේක වුණාට පසුව අර කඩවලට යම්කිසි අවධානයට ලක් වීමක් සිදු වෙනවා.එම නිසා මෙම යෝජනාව සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වැඩක් කරන කොට ප්‍රායෝගික ප්‍රශ්න එනවා තමයි.දැන් මෙතනත් තියෙන්නේ ප්‍රායෝගික ප්‍රශ්න, ප්‍රශ්න අපුහාම තමා උත්තර හොයා ගන්නේ. මං හිතනිනේ උත්තර හොයා ගැනිමට නොහැකි ප්‍රශ්නයක් මෙතන නැති බවයි.වෙළඳ මහතුන් කියනවාම් අපට තියෙන්නේ වැඩේ කරන්න.මං හිතන්නේ අපි ඉස්සරහයින් විවෘත නොකළාට පිටුපසින් එන්න මාර්ගයක් තිබෙනවා.ඉස්සරහයින් පන්න ගන්න විතරයි බැරි. දැන් ප්‍රශ්නය තිබෙන්නේ රථවාහන එක පාලනය කිරිමට අපි උදව් කිරිම.නැත්නම් මාර්ගය ලොකුවට හැදුවට වැඩක් නැත.පොළ දවසට ඔක්කොම වාහන ටික නවතා තියෙන්නේ අඩි 12 පොඩි ප්‍රමාණයේ තමයි තියෙන්නේ එකට උදව් කරන්න ඕනෑ.අනෙක් එක අපි මිනිසුන්ව දැනුවත් කරන්න ඕනෑ. වාහනය නතර කරපු තැනින් බැහැලා කඩයට ගොස් භාණ්ඩ ලබා ගැනිමට යාමට නොහැකි බවත්,රථගාලේ වාහනය නතර කර පිළිවෙලට එන්න කියලා.මිනිසුන්ගේ චර්යාවන් හදන්ටත් ඕනෑ.මේ සියල්ල සලකා බලා තමා අපට නගරය හදන්ට වෙන්නේ කථා කර කර ඉඳලා වැඩක් නෑ.ප්‍රායෝගික ප්‍රශ්න එනවා ඒවාට උත්තර හොයමු.අපි දැන් රටක් විදිහට ඉන්නේ අවුරුදු සිය ගණනක් පිටුපසින්.ලොකේ ඉස්සරහට යනවා.අපි තාමත් එක තැන.මම කියන්නෙ මොකක් හරි වැඩක් කරමු. උත්සහ කරද්දී ප්‍රශ්න එනවා නම් උත්තර සොයමු.කොහොම හරි මෙක හදා ගන්න ඕනෑ හැමවේලේම ප්‍රශ්න කියා හිටියොත් මේක කථා කරනවා විතරක් වෙයි.මන්ත්‍රීවරු අපි මේ යෝජනා සියල්ල අරගෙන තියෙන්නේ ප්‍රාදේශීය බල ප්‍රදේශය සංවර්ධනය කිරිමට ඇති උවමනාව නිසා. අපි ඒ වෙනුවෙන් වැඩ

කටයුතු කරමු.මොකක් හරි එකකට විරුද්ධ වෙනවා නම් ඒ අදහස දෙන්න.ප්‍රායෝගික ප්‍රශ්න කථා කරන්න එපා.ඇත්තටම ප්‍රායෝගික ප්‍රශ්න එනවා .අපි ඒක වෙනම කථා කරමු.මේ සභාවෙන් නෙවේ.වෙනම කමිටුවක් දාලා කථා කිරීමට අවශ්‍ය නම් ඔබතුමාලා ඉදිරිපත් කරන්න.අපි වෙනම හරි මේක කථා කරමු.මේකට වෙළඳ ව්‍යාපාරිකයනුත් සහභාගී කර ගෙන අපිත් ගිහිල්ලා තව මේක ගැන දන්න මිනිස්සුන් හා නාගරික සංවර්ධන අධිකාරියත් සහභාගී කර ගෙන මේකට මේ වගේ ප්‍රශ්න එනවා මේ ප්‍රශ්න ආවොත් මොකද කරන්නේ දෙන උත්තර මොනවා ද කියා එකතු වී සාකච්ඡා කිරීමට පුළුවන්. නාගරික සංවර්ධන අධිකාරියත් කියන්නේ වෙළඳ සංකීර්ණය පස්සට ගැනීමටය.මේක ලංකාවේ තිබෙන හොඳ යෝජනාව නොවෙන්නත් පුළුවන් තව දවසක වෙන කෙනෙක් මේකට යෝජනාවක් ගෙන්නත් පුළුවන්.පොළ ගලවලා එතැනට වෙළඳ සංකිරණය ගෙනියන්න. මෙතන ඉන්න අපි තමයි මේකේ ඇත්ත නැත්ත දන්නෙ, මේක ප්‍රායෝගික ද ,මොනතරම් වැදගත් ද කියන එක ගැන සිතලා තමා තීන්දුව ගන්නේ.දැනට මං කියන්නේ මොකක් හරි කරන්ට උදව් කරන්න කියන එකට මන්ත්‍රීවරු විරුද්ධද නැද්ද ලෙස අසන ලදි. මේක අවසාන තීන්දුව නොවේ.මෙය ආරම්භය පමණයි.දැන් රෙදි වෙළඳුන් කතා කරලා කිව්වා.ඒයාලාගේ ප්‍රශ්න ටික විසඳලා දෙන්න කිව්වා.විසඳලා දුන්නා තව සති දෙකක් ගියා නම් සතිපොළ ගිනි ගන්නවා.එකත් බේරලා දුන්නා.ඔබතුමාලාට මොකක් හරි දේශපාලන අවශ්‍යතාවයක් තියෙන්න පුළුවන්. ඒක අමතක කරලා කණ්ඩායමක් වශයෙන් සහයෝගයෙන් වැඩ කරමු.අපි එළියේ සාකච්ඡා කරමු මොකද මෙතන ඉන්නේ 37 දෙනයි.අපි ඉන්නේ දේශපාලන මතයක් ඔළුවේ තියාගෙන.අපි හැමවේලේම මොකක් හරි විරුද්ධ මත ප්‍රකාශ කිරීම තමා කරන්නේ.මෙතනින් පහළට බැහැලා වෙළඳ ප්‍රජාව හා මිනිස්සු එකතු කර ගෙන සාකච්ඡා කරමු.එක හරිද වරදි ද කියන එක එතනින් කරලා ඉවරයක් කරමු.මේක ආරම්භයක් විතරයි.මේක කරන්න කියලා මං කිසි දවසක ගිහිල්ලා කඩ ටික කඩලා පිටුපස්සට කරන්න නියෝග දේන්නේ නෑ. එහෙම කරලා මම අමාරුවේ වැටෙන්න කැමති නෑ. මේ යෝජනාව මට තනියම වුණත් කරන්න පුළුවන් කමක් තියෙනවා.මම හදන්නේ සභාවට යොමු කර සභා අනුමැතිය ලබා ගෙන සද්භාවයෙන් සියලුම දෙනා දැන ගෙන,එකතු කර ගෙන කරන්න ආරාධනා කරන්නේ.ඒක දොතින් වැළඳගන්නට කියන එක තමා මම කියන්නේ එහෙනම් කාගෙවත් විරුද්ධත්වයක් නැති බව සභාවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මහජන ගැලරිය අද දින විවෘත කළාද විවෘත කළ බව සභාවට ඉදිරිපත් කලේ නැති බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මහජන ගැලරිය විවෘත කළ බව ප්‍රකාශයට පත් කිරීම අතපසු වීමක් ලෙස භාරගන්නා බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

අපි සියලුම දෙනා දේශපාලන පක්ෂ වලින් තමා ඇවිත් ඉන්නේ නමුත් රඹුක්කන ප්‍රදේශයේ සභාපති විදිහට ඔබතුමා නියෝජනය කරන්නේ අපි නියෝජනය කරන්නේත් රඹුක්කන ජනතාව ඒ නිසා අපි මේ යෝජනාවට ඔබතුමාට විරුද්ධ වෙනවා නොවෙයි.ඉදිරියේදී එන ගැටළු වලට මැදිහත් වීම සිදු වන නිසා බව ප්‍රකාශ කරන ලදි.නමුත් අපි ගන්න යෝජනා ඉදිරියේදී අපට බලපෑමක් නොවන අකාරයටත්,ජනතාවට බලපෑමක් නොවන අකාරයට ගන්න කියලා තමා අපි මේ ඉදිරිපත් කලේ එහෙම නැතුව ඔබතුමාගේ යෝජනාවට අපි විරුද්ධව කථා කළා නොවෙයි.නමුත් ඔබතුමා සඳහන් කලේ ඔබතුමාට මේක තනියම වුණත් කරන්න පුළුවන් කියලා. මම ගෞරවයෙන් ආරාධනා කරනවා මේක සභාවෙන් කරන නිසා ඒක තනියම කරන්න කියලා.මොකද විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ මැදිහත් වීමක් නොවන බව මට පෙනීයන්නේ ඔබතුමාට මේකට බලතල තියෙනවා නම් ඉදිරියට මෙම යෝජනාව කර ගෙන යන ලෙස අපි යෝජනා කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මම හිතනවා අපගේ යෝජනා කිහිපයක්ම තිබෙනවා සාකච්ඡා කරන්න ඒ කිසිම යෝජනාවක් අපි අපේ යෝජනාවන් තනි තීරණ ලබා ගැනිමක් සිදු නොකරයි. ඒකමතිකව තීරණය කරන්නේ.අපේ කාරක සභා සමිති සඳහා සියලුම දෙනා ඇතුළත් වී ඇති බැවින් ඒ කමිටු වලදී සාකච්ඡා කිරීමත්,වෙළඳ ප්‍රජාවගේ හා අදාළ ආයතන සමඟ ද සාකච්ඡා කර අපි මේ තීරණ වලට එළඹෙන්නේ.ඒ නිසා

සියලුදෙනාගේ අදහස් කෙටියෙන් ඉදිරිපත් කර ලෙසත්,මේ පිළිබඳ පුළුල්ව කමිටු වලදී සාකච්ඡා කරමු යැයි යෝජනා කරමින් ඊළඟ යෝජනාවට යන ලෙස ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු උපසභාපතිතුමනි,මේ කමිටු වලින් ගන්න තීරණ මහසභාවෙන් ක්‍රියාත්මක කරනවද? මහසභාවේ ගන්න තීරණ කමිටු වලින් තීරණය කරනවද? යන්න ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

අපට මේ සියලුම කාරණා සම්බන්ධයෙන් කමිටුවේ සාකච්ඡා කිරීමට හැකි බව ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මහසභාවේ සාකච්ඡා කරලා නැවත කමිටුවේ නොදමන බවත්, කමිටුවේ සාකච්ඡා කරලා තමා මහසභාවට යොමු කර ක්‍රියාත්මක කරනනේ.එකේ අනෙක් පැත්ත ද? වෙන්නේ සභාපතිතුමනි,සභාවක් තීරණය කරලා කමිටුව නැවත දැමීම සිදු කරනවා නම් එය පනත අනුව මං හිතන්නේ එක විහිළුවකට පත් වෙනවා. උත්තරීතර මහසභාව සභාව හැල්ලුවට පත් වෙනවා.කමිටුවේ සාකච්ඡා කර අවසාන ප්‍රතිඵලය සඳහා මහසභාවට ඉදිරිපත් කරන්නේ මහසභාවෙන් අප සියලුම දෙනා එකතු වී සාකච්ඡා කර සියලුම වැඩ පිළිවෙල කර කමිටුවට දැමීම සිදු කරනවා නම් මං හිතන්නේ මහසභාවෙන් තේරුමක් නැති බවයි.ගරු සභාපතිතුමනි,ඒ නිසා ඔබතුමාගේ අවධානය මේ සඳහා යොමු කරන ලෙසත්,පනතේ වුනත් තියෙන්නේ එහෙමයි.මොකද සභාවට ගොස් කමිටු වලට දීලා එක එක නිලධාරීන්ට වෙනස් කරන්න බෑ.උත්තරීතර තීරණ මහසභාවෙන් තීරණය කරන්නේ යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මා අදහස් කලේ කමිටු තුළ පමණක් නොව අපි ඉන්න සමාජය තුළ හා අදාළ ආයතනය එක්ක සාකච්ඡා කිරීමේ හැකියාව තිබෙන බව ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ඔබතුමාලා කමිටුව එක්ක සාකච්ඡා කර ඒ ගන්න ක්‍රියාමාර්ග සභාවට ඉදිරිපත් කරන්න.අපි ගන්න ක්‍රියාමාර්ග මහජනතාවට ඉදිරිපත් කර හැල්ලුවට පත් කරන්න එපා යැයි පවසන ලදි.ඒ ගන්න ක්‍රියාමාර්ග සභාවට ඉදිරිපත් කර තීරණය කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අනවශ්‍ය ගැටළුවකට එන බව පෙනි යන්නේ.ඒක නිසා අනවශ්‍ය ගැටළු ඇති කර ගන්න එපා.අපි මෙතන වාඩි වී සිට කතා කරන්නේ දේශපාලන මතවාදයක් එක්ක. එතකොට අපිට හොඳම තීරණ ගැනීමට නොහැකි වේ. මේ යෝජනාව මගේ වෙන්නේ දේශපාලන මතවාදයක් නිසායි.ඒ නිසා මම අවධාරණයෙන් කිවේ.මේ සම්බන්ධයෙන් පුළුල් සාකච්ඡාවක් අපට ගන්නට අවශ්‍යයි.අපි එතෙන්ට යන එක ගැටළුවක් නොවේ.එතකොට අපි විතරක් නොවෙයි.මේකට ගැළපෙන අය සිටිනවා,වෙළඳ ව්‍යාපාරිකයන් සිටිනවා,මේ ගැන දන්න අය සිටිනවා,පොලීසිය ගෙන්න ඕනෑ,මාර්ග සංවර්ධන අධිකාරය ගෙන්න ඕනෑ,මේ දේවල් තමා මම අදහස් කලේ සහ එහි සාකච්ඡා කරපු දේවල් කමිටුවට දැමීම සිදු කරන්න ඕනෑ. ඉන්පසු සභාවට යොමු කර සභා අනුමැතියක් ගන්න වෙනවා.ඒක නිසා මෙය ගැටලුවක් නොවේ.කමිටුවේ කරන කටයුතු සභාවේ කරන්නට නොහැකි බවත්,සභාපතිවරයා විදිහට යම් බලයක් තියෙනවා ක්‍රියාත්මක කරන්නට එම බලය තියාගෙන මම මේක සභාවට යොමු කලේ.වඩාත් හොඳ ආකල්ප ගන්න,සියලුමදෙනා එකතු වී වැඩ කිරීමටය.නැවත බෙදීමට කථා කරන එක අනවශ්‍ය බව ප්‍රකාශ කරන ලදි.මේක මං හිතන්නේ අනවශ්‍ය විදියට කාලය කා දැමීමක් සිදු කරන්නේ. උප සභාපතිතුමා පැවසූ දේ හරි බවත්,අපිට අපේ දැනුමෙන් මේක ගොඩ දැමීමට නොහැකි බවත්,අපි පුළුවන් අය එක්ක එකතු වී නිහතමානිව හැමදෙනාගේම අදහස් අරගෙන ක්‍රියාත්මක කිරීමයි.අපගේ වගකීම එයයි.ඒකට අපි එකතු වෙමු.වෙන වෙනම දේවල් කථා කිරීමට ගියොත් මේක

විහිළුවක් වගේ විය හැකි බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

අපි මේක කරනවාට විරුද්ධව නොවේ ප්‍රකාශ කලේ .නමුත් ගරු සභාපතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන්නට කියනවා.අපි පොදු වෙළඳපළ මැදින් යන පාරට සභායක් විදිහට ඒකමතිකව සම්මත කරනවා.ඒක නැවත කමිටුවට යොමු කරනවා නොවේ.එය ක්‍රියාත්මක වෙන්න වීම අවශ්‍යයි.ගරු සභාපතිතුමනි,මෙතනදී කමිටුවට දානවට විරෝධතා ප්‍රකාශ වුණොත් එතකොට ඔතුමා මොනද කරන්නේ යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කවුද කිවේ කමිටුවට යොමු කරන බව යැයි පවසන ලදි.එතුමා පැවසුවේ මේ කාරණාව කමිටුවේ සාකච්ජා කරන්න යනුවෙන් ප්‍රකාශ කළා.ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට එක පිළිබඳ ඔබතුමාලාගේ අදහස් සමඟ මෙතන ප්‍රශ්න ටිකක් ඉදිරිපත් වුණා. ඒ ප්‍රශ්න වලට උත්තර ලබා ගැනිමට කමිටුව යොමු කරන්න පැවසුවා.ඒක තමා එතුමා අදහස් කලේ.දැන් මම මේක ක්‍රියාත්මක කරන්ට ගියා කියමුකෝ මට ප්‍රශ්න ටිකක් එනවා ඒ ප්‍රශ්න ටිකට මම කාගෙන් හරි අසන්ට ඕනෑ. මේකට මොකද කරන්නේ කියලා. ඒඅපිට කමිටුවක් වෙන්න පුළුවන්.දෙදනෙක් එක්ක හරි,පිරිසක් එක්ක හරි සාකච්ජාවක් වෙන්න පුළුවන් කමිටුවක් කියන්නේ අපි ඉදිරිපත් කර ගන්න එකක් නොවෙයි.ඒක තමා එතුමා අදහස් කලේ. සාකච්ජා කරමු කියලා ඒක පැසුවේ නැතුව වෙන දෙයක් නොවේ යැයි ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

v. මධ්‍යම වෙළඳපළට අයත් මාළු කඩ දෙක ටෙන්ඩර් කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන්නේ මධ්‍යම වෙළඳපළ ඉදිරිපිට මහා මාර්ගයට ආසන්නවයි.එය දර්ශනයට මෙන්ම ජනතාවට හා පාරිභෝගිකයන්ගේ සෞඛ්‍ය තත්වයට බලපෑම් ඇතිව තිබේ.එසේම නීත්‍යානුකූල කඩකාමරයෙන් පිටත වෙළඳාම් කිරීම ගැටළුවකි.ස්ථිර මාළු කඩ පිහිටි ආකාරය ජනතාවට මෙන්ම ව්‍යාපාර කටයුතු වලට යෝග්‍ය නොවේ.ඒ අනුව එම මාළු කඩ කාමර සති පොළ දෙසට විවෘත වන ආකාරයට වෙනස් කිරීම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම මාළු කඩදෙක තියෙන්නට ඕනෑ ඇතුලේ බව සියලුම දෙනා දන්නා කරුණකි.මම පොඩි උපදෙසක් පතනවා මගේ කථාවෙන් පසු උපාලි රෝහණ මන්ත්‍රීතුමාගෙන් ඒ සම්බන්ධව නීතිමය පැත්ත ගැන පැහැදිලි කරන්න කියලා.මෙම පුද්ගලයන් දෙදෙනා අනවසයෙන් තමා මාර්ගයට ආසන්නව කඩකාමර පවත්වාගෙන යන්නේ. මම සභාවට පත් වී සතියක් යන විට මාළුකඩ ව්‍යාපාරකයන් ගෙන්නුවා. ගෙන්නලා සාකච්ජා කළා. ගිවිසුම පැහැදිලි කර දුන්නා එම ව්‍යාපාරකයින් පැවසුවේ ඇතුලට පාරිභෝගිකයින් නොයන බවය.ඇතුළට පාරිභෝගිකයින් නොයන එකයි.එහි දී කඩකාමර දෙක ගත්ත ගිවිසුමත් එක්ක සම්බන්ධයක් නොමැති බව පවසන ලදි. කඩකාමර දෙක ගත්තේ මාළු විකිණිම.අපට ලක්ෂ 18 ක්අවුරුද්දකට දෙනවා.එහෙත් පාරිභෝගිකයින් නොයන එක අපට විසඳිය නොහැකිය.කඩකාමර දෙක ගන්න කොට මේ පිළිබඳ දැන ගැනිම අවශ්‍ය බවත්,ඒ පිළිබඳ එම ව්‍යාපාරකයින් සමඟ එකඟතාවයකට පැමිණියා. මාස තුනක් කල්දෙනවා.මෙම කඩකාමර දෙක හදලා දෙන්නම් කඩකාමර දෙකට යන්න කියලා.මේක තමා යෝජනාව රෝහණ මන්ත්‍රීතුමා අවස්ථාව දෙනවා නීතිමය තත්වය ගැන පැහැදිලි නරන්න. යැයි ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

මෙම ගැටළුව බොහෝමයක් මධ්‍යම වෙළඳපොවල් වල සහ සතිපොළවල් වල දක්නට ලැබෙන දෙයක්.මොකද මට රාජකාරි ජීවිතයේ අත්දැකීම් තියෙනවා.ඒ වගේම රාජකාරි ජීවිතයේ මම මේ ප්‍රශ්නයට සෘජුව මැදිහත් වීමක් වෙලා තියෙනවා.ඇත්තෙන්ම ප්‍රාදේශීය සභාවක් තුළ නීතිය ක්‍රියාත්මක කරනවාට වඩා කාලයෙන් කාලයට එන දේශපාලන අධිකාරියේ වාචික තීරණ මත තමයි වෙළඳසැල් පවත්වා ගෙන යනු ලබන්නේ. විශේෂයෙන් මස් හා මාළු වෙළඳසැල් වත්වාගෙන යනු ලබන්නේ.එක ඇත්තටම ප්‍රාදේශීය සභාවේ පනතට අනුව සිදු කළ නොහැකි දෙයකි. ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා හා ලේකම්තුමාට නීතිමය බලතල තියෙනවා එම වාචික තීරණ අභිබවා එම පනත අනුව ක්‍රියාත්මක කිරිමට. බොහෝ දුරට එම තීරණ දීලා තිබෙන්නේ ප්‍රාදේශීය සභාවට යම් බලපෑමක් තිබෙන පාක්ෂිකයකුට හා එහෙමත් නැත්නම් ප්‍රාදේශීය සභාවේ හිටපු සභපති වරයෙකුට එහෙමත් නැත්නම් ප්‍රාදේශයේ සිටින ප්‍රාදේශීය මන්ත්‍රීවරයකුට සෘජු සම්බන්ධතාවක් තිබෙන පුද්ගලයෙකුට තමා දෙන්නේ.ඒ පිළිබඳ මට හොඳට අත්දැකීම් තියෙනවා. ඒ කෙසේ වුනත් මහජන පීඩාවක් යටතේ අපිට අයින් කරන්න පුළුවන්.මොකද මාළු වෙළඳසැලක් කියන්නේ අධික වශයෙන් දුර්ගන්ධය සහ මැස්සන් බෝවෙන තැනක් ඒ වගේම අප ජලය පොදු කාණුවලට සහ වෙනත් තැන් වලට මිශ්‍ර වීම තුළ සිදුවන රෝගකාරක තත්වයන් ඉතා බහුලව සිදුවන තැනක් එතකොට ඒ සඳහා සභාවේ වගකීමක් තිබෙනවා.සභාවෙන් මුදල් ගන්න නිසා ටෙන්ඩර් කිරිමක් මත සිදුවන නිසා එම මාළු වෙළඳාමට අවශ්‍ය පසුබිම සකස් කර දීමට.එයට අවශ්‍ය පරිදි පරිශ්‍රය සකස් කර දීලා.පරිශ්‍රය හරියට නඩත්තු කිරිම.නමුත් මම දකිනවා එම කාර්යය හරියට රඹුක්කන ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක වන බව නමුත් ඒ නීතිය අභිබවා යම්යම් හේතුන් මත පුද්ගලයින් ඒ තැන්වලින් පරිබාහිරව කර ගෙන යනවා නම් දැන්වීක් බලා දී,යම්කාල සීමාවක් ලබා දී ,මෙම ස්ථානය තහනම් කිරිමට පුළුවන්.එහෙමත් නැත්නම් නීතීමට ක්‍රියාමාර්ග ගැනිමට පුළුවන්.නඩු මාර්ගයනට වුණත් ගිය හැකිය.මේ පනත අනුව ක්‍රියාත්මක කර නැති බව තිරණය වෙනවා. නම් ඒ අදාළ පුද්ගලයා කවුරු වුණත් ප්‍රාදේශීය සභාවකට බලතල තිබෙනවා එම පුද්ගලයා ඒ ටෙන්ඩර් ඇති ස්ථානයටම යවන්න.අදාළ පුද්ගලයාට නිවේදනයක් නිකුත් කරන්න.මොකද ඒ තත්වය සොයා බලා මේ පිළිබඳ ක්‍රියාමාර්ග ලබා ගැනිම සුදුසු බවය. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ගරු සභාපතිතමනි,මට අවශ්‍ය වෙනවා ඊළඟ අවුරුද්දේ එනම් 2026 වර්ෂයට අංක 35,36 මාළු කඩවල අවම තක්සේරු මුදල පිළිබඳ දැන ගැනිමට.මේ අවස්ථවේ දී ප්‍රකාශ කරනවා නම් හොඳ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එය අපි ලබන වාරයේදී සාකච්ජා කර බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමනි,මං හිතන්නේ මාළු වෙළඳ කඩ කාමර තිබෙන්නේ පිටුපසය.මස්,මාළු කඩ දෙක පිටුපස ස්ථාපනය කරනවා නම් අපිට හොඳයි. සභාවක් විදිහට එහෙමත් නැත්නම් ජනතාවක් විදහට සභාපතුමනි , මොකද අපේ මාළු කඩ ඇත්තටම දේශපාලන බල පුළුවන්කාරකම් වලට තමා යන්නේ.නගරයේ ඉදිරියට මෙමම කඩ දෙක පැමිණ තිබෙනවා.මං හිතනවා ඔබතුමා ඒ පැත්තට දෙස බලනවා නම් හොඳයි කියලා. මෙය අගය කරනවා. ඇත්තටම මෙතන එක පක්ෂයකට,එක පාටකට,එක ජාතියකට නොවෙයි.හැමදෙනාටම පොදුයි.ඔබතුමා ගන්න මේ තීරණයට මම පෞද්ගලිකව ස්තූතිවන්න වෙනවා.ගරු සභාපතිතුමනි,මාළු,මස් කඩ සඳහා තරඟකාරිත්වය රු.ලක්ෂ 18 කට ඇති වු නමුත් ඉස්සරවෙලා ගියේ දේශපාලන අධිකාරියේ බලපෑම මතයි.දැන් ප්‍රායෝගික ගැටළුවක් තිබෙන්නේ අපිට අවම ලංසුවට තමා තන්සේරු ලබා දෙන්නේ හා වෙන්දේසි කරන්න සිදු වෙන්නේ මං හිතන්නේ මාළු කඩ ටික පිටු පස්සට ගියාට පසු තරඟකාරිත්වය හැම ආයතනයතම තිබෙනවා. මෙතැනත් තිබෙනවා.ඒ නිසා මුදල තන්සේරු කරන්නට නොහැකි වුණොත් සභාවට මාළු කඩ දෙක වැසිමට සිදු වෙයි.මාළු කඩ දෙක පිටුපසට ගියා කියන්නේ අවම ලංසුවට ගැනුම් කරුවන් ලබා ගැනිමට ඉල්ලුම් කිරිම සිදු කරයිද ,මොක ද තක්සේරු මුදලට වඩා මුදලකට වෙන්දේසි කරන්නට සිදුවන නිසා.කෙසේ නමුත් මාළු කඩටික පස්සට ගැනිම පිළිබඳ මාගේ පෞද්ගලික සුභාසිංසනය පිරිනමන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මාළු කඩ දෙක සතිපොළ දෙසට විවෘත වන අකාරයට සකස් කිරිමට අනුමත කිරීම තීරණය විය.

vi. රඹුක්කන සති පොළ භූමියෙහි ඇති රෙදි හා වෙනත් භාණ්ඩ අලෙවි කුටි ඉතා අපිළිවෙලට පැවතීම සුදුසු නොවන අතරම රථ වාහන නවතා තැබීමට ප්‍රමාණවත් ඉඩකඩක් ඇහිරී තිබීමද ගැටළුවකි.මේ සඳහා එම අලෙවි කුටි පිළිවෙලකට එක් ප්‍රදේශයකට සීමා වන පරිදි සැකසීමත් රථ ගාල විධිමත්ව සැකසීමත් සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

ගරු සභාපතිතුමාගෙන් ද,මන්ත්‍රීතුමන්ලාගෙන් ද කාර්ය මණ්ඩලයෙන්ද අවසරයි. සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන අතරම එයට කරුණු කිහිපයක් පැවසීම අවසර පතනවා.ඊයේ පැවැත් වුණා කාර්මික කමිටුව එම කමිටුවේදී මේ පිළිබඳ අපි දැඩිලෙස සාකච්ඡා කළා.මේ වන විට සතිපොළෙහි වෙළඳ කුටි සැලසුම් කිරිම අවසන් අදියරයේ පවතින්නේ ඉදිරියේදී මේ පිළිබඳ විස්තර ඉදිරිපත් කිරිමක් කරන අතර මෙය කාලෝචිත යෝජනාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ ගැන කථා කිරිමට නිසා ගොඩක් කරුණු තිබෙන නිසා.අපි ඊළඟ සභාවරයේ දී සියලුම සැලසුම් සහිත ඉදිරිපත් කරලා ඔබලාගේ අනුමැතිය අනුව ක්‍රියාත්මක කිරීමට සුදානම් වෙන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ඊළඟ සභාවරයේදී සැලසුම් සහිත ඉදිරිපත් කිරිමෙන් පසු ක්‍රියාත්මක කිරිමට අනුමත කිරීම තීරණය විය.

vii. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ රැස්වීම් සභා ගර්භය විධිමත් ආකාරයට සකස් කිරිමට සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මේ යෝජනාව ඇත්තටම හොඳ යෝජනාවක් ගිය මහසභා වර්තාවේ ඉදිරිපත් කිරිමේදී ගැටළු ඉදිරිපත් කලේ නිලධාරියත් එක්ක තිබෙන පෞද්ගලික ප්‍රශ්නයකටවත්,ඔබතුමා එක්කන තිබෙන පෞද්ගලික ප්‍රශ්නයකටවත්,නොවේ.සභා වාර්තාවේ තමා අපි කථා කරපු දේවල් තිබෙන්නේ.ඒවා සටහන් තබා ලියවිල්ලක්ව තිබෙන්නට අවශ්‍ය කියන පදනම මත තම අපි කථා කරන්නේ නැතුව නිලධාරියත් එක්කවත්, ඔබතුමා එක්කවත් තිබෙන තරහකට නොවේ.මේකෙදී ඔබතුමාගේ යෝජනාව සභා ගර්භය විධිමත් කිරිම.ඒ යෝජනාව තුළ ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර අපි කථා කරන දෙවල් Recording කිරිම සඳහා ඉතාමත් උසස් තත්වයේ උපකරණයක් මිලදී ගැනිම සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.මේක කවුරුත් අකමැති වෙන එකක් නෑ. සභා වාර්තාව කියන එක නිවැරදිව තිබෙන්නට අවශ්‍යයයි.මම මේ සභාවට ඇවිත් පසුගිය වාර්තා කිහිපයක් අධ්‍යනය කළා ඒ අධ්‍යනය අනුව සභා වාර්තාවේ කරුණු අඩුවෙන්ම ඉදිරිපත් කර ඇති සභා වාර්තාව මේ සභා වාර්තාවයි.ඒකට මොනයම් හෝ හේතු කාරණා එකතු වෙන්න පුළුවන් මෙයට වගකියන්ට වෙන්නේ

අපිට.අපේ පාක්ෂිකයෙක් ඉඳලා හරි මේ වාර්තාව බැලුවොත් අන්තුමේදී සිතයි.මේ මන්ත්‍රීවරු මොනවද මේ කථා කරලා තිබෙන්නේ මොනවද මේ කරලා තිබෙන්නේ වාර්තාව සම්පූර්ණයෙන් වැරදිය.ඒ වගේ කාරණා වලට යන්න පුළුවන්.ඒ එක්කම මම මේක අවස්ථාවක් කර ගන්නවා අපේ උපසභාපතිතුමා මුල දී ඉදිරිපත් කළා ගිය සභාවාරවලදී මේ වගේ ඉදිරිපත් කිරීම් කළා ද යනුවෙන් ඔබතුමා ඒ වාර්තා පරීක්ෂා කර තීරණය කරන්න. මෙහෙම ප්‍රශ්න ඉදිරිපත් වුණා ද නැද්ද යන්න නියන කාරණය. ඒ වගේම මේ සභාගර්භය විධිමත් ආකාරයට සකස් කිරිමට අපට ගිය සභාවාරයෙදීත් ඔබතුමාලාගෙන් යෝජනාවක් ඉදිරිපත් වුණා.සභාවේ ඉදිරිපසට ආවරණයක් ,පුවරුවක් වැනි දෙයක් සකස් කරන බවට අදහසක් ඉදිරිපත් වුණා.ඒකටත් ප්‍රථමයෙන් පුළුවන් නම් Recording උපකරණයක් මිලදී ගැනිමට ඔබතුමාන්ලා උත්සුක වේනවා නම් බොහොම අගය කොට සලකනවා.මේක විධිමත්ව සකසනවා කියලා ඔබතුමන්ලා අදහස් කරන්නේ මොකක් ද කියන එක පැහැදිලි කරයි කියලා ඔබතුමන්ලාගේ පැත්තෙන් ගෞරවයෙන් බලාපොරොත්තු වෙනවා.මම තව පොඩි කාරණයක් කථා කරන්න ඕනෑ.මේ සභාවේ මන්ත්‍රීවරු 37 ක් සිටිනවා.ඒ තිස්හත්දෙනාට මේ ස්ථානය ඉඩ පහසුව තිබෙන බවත්, මේ රැස්වෙලා තිබෙන ආකාරය අපිට කර ගෙන යනන් පුළුවන් බව පවසන ලදි.උපරිම සීමාවට ඇවිත් තියෙන්නේ ඒ නිසා වෙනත් වියදම් කරන්නට යන්නේ නැතිව අපිට මේ දේවල් එක්ක යන විදිහට යන්න පුළුවන් බව තමා මගේ අදහස ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශකරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අනිස් මැතිතුමා ගිය සතියේ යෝජනා කළා විදුලි ආලෝකය ලොකු ප්‍රශ්නයක් කියලා විදුලි පංකා තිබුණට දාඩිය දමනවා.එතකොට මේක තමා අපේ ප්‍රාදේශීය සභාවේ උත්තරීතර ආයතනය තීන්දු තීරණ ගන්න.මෙතන පුටු ගොඩක් ගොඩ ගහලා මුලින්ම එනකොට මාධ්‍ය ආයතනයකට පිටු පසට වී පොටෝ එකක් වත් ගන්න බෑ මොකද විදුලිය නැත.රඹුක්කන ප්‍රාදේශීය සභාව යනුවෙන් නැත.මේ කාටත් අපි තමා තීරක පිරිස ඒ නිසා අභිමානයක් තිබෙන්න ඕනෑ.තව ශ්‍රවණය පිළිබඳ ප්‍රශ්නය එක තාවකාලිකව මයික් එකක් හයි කරලා තිබෙන්නේ මේ අඩුපාඩු පවතින්නේ අවිධිමත් බව නිසා හා මේකට කවුරුත් අවධානය යොමු නොකරපු නිසා. කාර්මික කමිටුවේ සභාපතිතුමාට මේ ගැන අදහසක් දෙන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

මේ සභා ගර්භය විවෘත කිරිමට අපි කාර්මික කමිටුවේ දී විශේෂයෙන් සාකච්ජා කලේ දුම්රිය ගමන් කරන විට ,අසලින් මහ මාර්ගය නිසා රථ වාහන ගමන් කරන විට ඒ ශබ්දය සභා ගර්භයට ඇසෙන බැවින් පළමුවෙන්ම අපි යෝජනා කලේ එම ශබ්දය නොඇසෙන ලෙස මේක සකස් කිරීම.අනෙක් කාරණාව අනීස් මැතිතුමා මතක් කළා විදුලිය මදි බව ඒ ආලෝකය මදි නිසා සිවිලිම පහත් කර සකස් කිරිමට.ඒ වගේම තමා සභා ගරභයේ අපේ මන්ත්‍රීතුමන්ලා සිටින විට පේළි දෙනේම මන්ත්‍රීතුමන්ලා නොපෙනෙන නිසා පිටුපස මන්ත්‍රීතුමන්ලා පෙනෙ ආකාරයට කොටස් දෙකට ඔසවලා සකස් කිරීම.ඊ ළඟට මහජන ගැලරිය විවෘත වෙනවා. මහජන ගැලරිය අපි යෝජනා කළා උපරිම 50 දෙනෙක් බව ඒ අයත් ඉඳගත්තාම අපසහුතාවයට පත් වෙනවා පිටුපස අයට ද සභාව දර්ශනය නොවන බැවින් ඒ හින්දා මහජන ගැලරිය ද කොටස් දෙකට සකස් කිරිම යෝජනා කළා.ඒ වගේම පිටුපසට හොඳින් ආලෝකය ලැබෙන ලෙස හා සභා ගර්භයට ආලෝකය නොයන ලෙස සුදුසු දර්ශනයක් යොදලා එය ආවරණය කිරිමට යෝජනා කළා.කමිටුවේ සාකච්ජා කළ දේවල් ඔබතුමන්ලාට ලබා දෙන්නට සුදානම් ගොඩක් විස්තර කිරිමට ගියොත් වැඩි කාලයක් යන බැවින් බොහොම කෙටියෙන් විස්තර කළ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

එතකොට මේක රැස්වීම් ශාලාවකට සකස් කිරිමෙන් වෙනත් රැස්වීම් පැවැත් වීම නොහැකි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වෙත් රැස්වීම් පැවැත්විමට නොහැකි බවත්, මහසභා රැස්වීමට පමණක් සීමා වන බවත්, ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

අපේ මන්ත්‍රීතමන්ලා කරුණු පැහැදිලි කරන විට සඳහන් කළා. දුම්රිය යනවා,බස් ශබ්දය ඇසෙන බවට මේ සභාව ආරම්භ කරලාත් අවුරුදු 8 ක්9 ක් වෙනවා ඒ ශබ්ද අසුනා.එහෙත් සභාව පවත්වගෙන ගිය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගෙන ආයෝජනාව විශිෂ්ටයි.මම පළමු මහසභා රැස්වීමේදී පැහැදිලි කළා මෙහි වර්ෂා කාලයේදී හා කළුවර වීමක දී සාමූහික වශයෙන් වැඩ කර ගැනිමට නොහැකි බව.මෙය ඒ කාලයේදීත් කල්පනා කළා.නමුත් දැන් සමහර ඒවායේ විදුලි බල්බ නැත.අලුතින් බල්බ් සවි කිරිමට අවශ්‍ය වී ඇත.ඒ වගේම අපේ මන්ත්‍රිතුමන්ලා සාකච්ජා කර දේවල් විකෘති ලෙස සඳහන් වන නිසා මම විශේෂයෙන් සඳහන් කරනවා Recording පද්ධතියක් සවි කරන එක හොඳ දෙයක් කියලා.සභාවක් හැටියට මම මීට පෙරත් සඳහන් කළා විදුලිය ගැන කථා කරන ලදි.අපි වැඩියෙන් ආදායම් ලබන නිසා සාමාන්‍යයෙන් අපේ සභාවේ විදුලි සීමිත ප්‍රමාණයක් පමණයි සකස් කර තිබෙන්නේ.සභාවයට තිබෙන අඩුපාඩු අපට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.පහළ,පළමු,දෙවැනි හා තුන්වැනි එකේ වුණත් කමක් නෑ අඩුපාඩු සකස් කිරිම හොඳයි.අපේ මහසභා රැස්වීම තිබෙන ස්ථානය වුණත් පිරිසිදුව,ඊළඟට අලෝකය,විදුලි පංකා මේ දෙවල් සකස් කළ යුතුයි.දැනුත් හරියට විදුලිපංකා වැඩ කරන්නේ නැත.අලුත් විදිහට System එකකට සවි කර අලුත් සභාවක් ලෙස හොඳ පිළිවෙලකට යමු.යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ඔබතුමාලාගේ ප්‍රතිපත්ති මාලාවේ සඳහන් කරපු ආකාරයට පසු පෙළ මන්ත්‍රීවරු පෙනෙන ආකාරයට එසවිමක් කර සකස් කිරිම සිදු වුවහොත් මෙහි සභාවාරය අවසන් වූ පසු මෙම ශාලාව වෙනත් කටයුතු වලට හා කාර්මික රැස්වීම වලට නොදි සිටිමට ද අදහස් කරන්නේ කියන එක දැන ගැනිමට කැමති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මං හිතනනේ මෙය උත්තරීතරව තිබෙනවා නම් වෙන දේයකට දෙන්ට බෑ.රඹුක්කන ප්‍රාදේශීය සභාවේ තීන්දු තීරණ ගන්නේ මේතැන නම් පූජනීය තැනක තියා ගමු.මේ දෙසැම්බර් 31 වන විට ප්‍රජා ශාලාවේ කොන්ත්‍රාත්කරු පොරොන්දු වී ඇත.ගොඩනැගිල්ල සකස් කර දෙන බව.දැනටමත් මේක වෙනත් කටයුත්තකට දෙන්න ගියොත් ලොකු අපහසුතාවයකට පත් වෙනවා.මේක එහෙම දීමට ගැළපෙන්නේ නැත.අපිළිවෙල තිබෙන නිසා.අනිස් මන්ත්‍රීතුමා ඔබතුමා පරණ මන්ත්‍රී කෙනෙක් හැටියට දන්වා අපට මෙතනින් බැහැලා යන විට අභිමානයක් තිබෙන්න ඕනෑ.පරවියන් සිටිනවා විදුලිය නෑ මෙහි තිබෙන සම්පත් වලින් මේක සකස් කිරිමට නොහැකියි. හරියට අවශ්‍ය භාණ්ඩ නොමැති නිසා.ඒ හින්දා සියල්ලනට ගැළපෙන අකාරයට සකස් කිරිමත්,කමිටු රැස්වීම් පවත්වන්න පුළුවන් ද අපහසුවෙන් වැදගත් තීන්දු තීරණ ගන්න කොට මේ කියන දේවල් හරියට Recording වුණේ නැත්නම් , හරියට ලිය වුණේ නැත්නම් නීතිමට ලියවිල්ලක් වෙනනේ නැත.අපි බොරු කියලා තියෙන්නේ කියලා කාටවත් චෝදනා කරන්න බැරි හින්ද හා වර්ෂාවටත් මෙහි සිටිමට නොහැකි නිසා මෙ සභාගර්භය සකස් කිරිම හොඳ දෙයකි.මේ මන්ත්‍රීතුමන්ලා පවසනවා එතුමන්ලාගේ අත්දැකිම් සමඟ අපේ කාර්මික කමිටුවේ සභාපති,ඉංජිනේරු මහතුන් එක්ක එකතු වෙලා සාකච්ජා කරමින් සිටින්නේ මේක සභාවට යොමු කර අනුමැතිය ලබා ගැනිමට ඇත්තේ යනුවෙන් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

*තීරණය -*

සභාගර්භය විධිමත්ව සකස් කිරිමට අනුමත කිරිම තීරණය විය.

viii. සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරිම සඳහා ආණ්ඩුපක්ෂයට හා විපක්ෂයට නිශ්චිත ප්‍රමාණයක් හා වේලාවක් ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.එය විනාඩි 05 උපරිමයකට යටත්ව දෙපැත්තෙන් මන්ත්‍රීතුමන්ලා තිදෙනෙකු බැගින් එක් සභාවාරයක් සඳහා යැයි ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙ න්‍යාය පතුයට අලුතින් එකතු වු දෙයකි.ඉතිහාසයේ මෙය නොතිබුණ බව ප්‍රකාශ කරන ලදි.මේකෙදී පෞද්ගලික පැහැදිලි කිරිම් කරන්නට ගියාම අපට සීමාවක් නැත.ඒ නිසා මෙට අපට අවනත වෙන්න වෙනවා විනයක් තියා ගන්න වෙනවා.අපි කථා කරන කරුණු ප්‍රාදේශීය සභා විෂයට අදාළ අදහස් දැක්විම කළ යුතුයි.අපි අදහස් හා යෝජනා අතරේ පොඩි පොඩි විවාද කරනවා.එම විවාද ද හරවත් විය යුතුයි.එහෙම නැති වුනොත් අපි අතරේ හිතවක් කමක් තිබුනොත් එය ද පළුදු විමට ඉඩ තිබෙනවා.එම නිසා උපරිම විනාඩි 5 කට යටත්ව අදහස් දැක්විමට පුළුවන් එතනින් එහාට යනවානම් කාලය දන්වනවා.දෙපැත්තෙන් තුනදෙනා ගානේ ගියොත් හයදෙනෙක් වෙනවා.හයවරක් පහ තිහයි.විනාඩි 30 ක් නැවත සභාව දිග් ගැස්සෙනවා.මෙය මන්ත්‍රීතුමෙකුට හෝ මන්ත්‍රීතුමියකුට තමන්ගේ පෞද්ගලික මතය ,කාරණාව සදහා ඉදිරිපත් කිරිමට අවස්ථාව තමා මෙයින් ලබාදී තිබෙන්නේ.මෙම රීතිය පිළිවෙලට පාවිච්චි කළේ නැතිනම් අපි අපහසුතාවයට පත්වෙනවා. එම නිසා මෙ යෝජනාව ඉරිදිපත් කිරිම සිදු කළ බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මෙය ආණ්ඩු පක්ෂයට ප්‍රශ්නයක් නැති බවත්,පක්ෂ ගණනාවක් එකතු වී විපක්ෂය සකස් වී තිබෙන්නේ මෙම යෝජනාවේදී සදහන් වෙනවා දෙදෙනෙකුට පමණක් කරුණු දැක්විමට ඉදිරිපත් විම හැකි බව.උදාහරණයක් වශයෙන් ගරු සභාපතිතුමනි,විෂක්ය ගත්තොත් එක්සත් ජාතික පක්ෂය,ඒ වගේම පොදුජන පෙරමුණ ,සර්ව ජන පෙරමුණ සමගි ජනබල වේගය,සමාවන්න,ස.ජ.බ. ,ස්වාධීන පක්ෂ පවතිනවා.මේ යෝජනාව අනුව සභාපතිතුමනි, අවස්ථා දෙකක් තිබෙන නිසා ජනතාවගේ ප්‍රශ්න කථා කිරිමට ගියවිට මෙය ප්‍රායෝගික නොවේ.ඔබතුමාලාගේ සභාවර දෙකෙදීම මන්ත්‍රීවරු නිහඬ වෙලා ද නිහඬ කරලද කියන එක අපි දන්නේ නැත. නමුත් විෂක්ෂය මේ සියලුම පක්ෂ නියෝජනය කරන නිසා ගරු සභාපතිතුමනි,අපි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා මේ යෝජනාවට ඔබතුමා මේ යෝජනාවට ඡන්දයක් විමසන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙය රීතිවල 32 (1) යටතේ සිට සදහන් කරනවා. මම මෙය ප්‍රකාශයට පත් කිරිමක් කරන්නම්,සභාවේ සාමාන්‍ය රැස්වීම සභිකවරුන්ගේ පුද්ගලික පැහැදිලි කිරිම සඳහා වෙන් කළයුතු කාල සීමාව පිළිබඳ සභාව පූර්ණයෙන් තීරණය කර තිබිය යුතු අතර එසේ වෙන් කළයුතු කාල සීමාව තුළ සභිකවරයෙකු සඳහා ලබාදෙන උපරිම කාල සීමාව සභාව විසින් තීරණය කළයුතුය.

**සාමාන්‍ය 2**

සාමාන්‍ය රැස්විමක සභිකවරයෙකු පොදු අරමුණක් වෙනුවෙන් කළයුතු පුද්ගලික පැහැදිලි කිරිමක් ඇත්නම් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සභා රැස්වීම ආරම්භයට පූර්ණවයෙන් සභාවට ඉදිරිපත් කළයුතුය.

**සාමාන්‍ය 3**

ඉහත උපවගන්තියේ සඳහන් විධිවිධාන සැලකිල්ලට ගනිමින් 2 උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ඉල්ලීමට ප්‍රමුඛතාවය පදනම් කර ගනිමින් එදින සභාවරයේදී පුද්ගලික පැහැදිලි කිරිම් ඉදිරිපත් කිරිම සඳහා අවස්ථාවක් සැලසී ඇති සභිකවරුන් වෙත ඉල්ලීම් ඉදිරිපත් වු ප්‍රමුඛතාවය අනුව ඉදිරිපත් කිරිමට අවස්ථාව සැලසිය යුතුය.මං හිතනවා පැහැදිලි බව.

**සාමාන්‍ය 4**

පුද්ගලික පැහැදිලි කිරිම් කරන විට සෑම සභිකවරයෙක්ම ප්‍රකාශිත කරන ප්‍රකාශිත වාර්තාවක් ඇතුළත් කළයුතු අතර එක් සභිකවයෙකුට ඒ සඳහා පිළිතුරු අදහස් දැක්විම සඳහා අවස්ථාවක් සලසා නොදිය යුතුය.

**සාමාන්‍ය 5**

පුද්ගලික පැහැදිලි කිරිම් සිදු කරන සෑම සභිකවරයෙකුම පුද්ගලික පැහැදිලි කිරිම් සඳහා ඉල්ලීම පදනම් වු කරුණු පමණක් කථාකළ යුතු අතර ඒ සඳහා ඔහු වෙත වෙන් කළ දී ඇති කාල සීමාව තුළ පමණක් අදහස් දැක්වීම මූලාශ්‍රනයෙන් අවසර ලබාදීම සිදුකළ යුතුය.මේ රීතීවල තිබෙන්නේ මගේ යෝජනාවක් නොවන බවත්,එම නිසා බෙදීමක් අවශ්‍ය නොවේ.අනෙක් එක ආණ්ඩු පක්ෂය නිහඬ කරන්නට මට නිසිම උවමනාවක් නැති බවත්,මොකද එහෙම කරන එක අපේ සිරිතක් නෙවන බවත්, ප්‍රකාශ කරන ලදි.ආණ්ඩු පක්ෂය අපි කණ්ඩායමක් වශයෙන් නිත්‍යානුකුලව සිටින බව ප්‍රකාශ කරන අතර ම ආණුඩ පක්ෂය නිහඬ කර මම විතරක් කථා කිරිම නොව එහෙම අපේ එකක් නැති බවත්,එහෙම නම් මම මෙතැන ඉන්න එකක් නැති බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජ්.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ඒ යෝජනාවට අනුව කථා කරන්නේ මම ඇත්තටම සතුටුවෙනවා.ඔබතුමාගේ මංගල සභාවාරය ඇතුළුව මංගල සභාවාරයට ප්‍රථමයෙන් කථාවාරයේදී පවා ඔබතුමා සටහන් කළා පක්ෂ විපක්ෂ මේ සියලුදෙනාම සභාවේ සභිකයෝ යනුවෙන් ප්‍රකාශ කළ බවත්,අපේ සභාවේ උපසභාපති, සභාපති,සභිකයෝ සිටින්නේ යනුවෙන් ඔබතුමා පැහැදිලි කළ නමුත් ඔබතුමාගේ ඒ කථාව ක්‍රියාවෙන් නොකිරීම පිළිබඳ මම බෙහෙවින් කණගාටු වෙනවා.මෙවැනි කෙටි කාලයක් තුළදී මෙය වෙයි කියලා මම බලාපොරොත්තු වුණේ නැති බවත්,ආණ්ඩු පක්ෂය විපක්ෂය කියන එක නිශ්චිතව සඳහන් කළා.ඔබතුමා මෙතනදීම සඳහන් කළා බෙදීමක් ඇති කරලා ඉවරයි.පනතේ බේදීමක් නැති බවත්,අපි කණගාටුවෙනවා ඔබතුමා යෝජනාව පැහැදිලි කිරීමට මේ වචනය දැමීම සම්බන්ධයෙන් ඒ වගේම විශේෂයෙන් සඳහන් කරන්නට වෙනවා.කරුණු පැහැදිලි කිරීමට විනාඩි 5 ක කාලයක් ඇති ද කියන එක ගැටළුවක් සමහර අවස්ථාවලදී සමහර විට අපි සභාවේදී විනාඩි 5 ක් කථා කරන්නේ නැති වෙන බවත්, ප්‍රකාශ කරන ලදි.ඒ වගේම ආණ්ඩු පක්ෂය,විපක්ෂය කියලා ඔබතුමා දැන් සඳහන් කළ නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේක ලොකු අසාධාරණයක් සිදුවේ.මොනද ඔබතුන්ලාගේ 21 ක් දෙනෙක් සිටින අතර එම 21 දෙනාගේ බලයට අපි යටත් වෙන්නේ නැති බවත්,මොකද සභිකයන් විදිහට අවශ්‍ය ඕනෑම ගැටළුවක් සාකච්ජා කිරීමට පුළුවන.මොකද දැන් කලින් යෝජනාවේදී උප සභාපතිතුමා පැසුවේ කමිටුවලින් සාකච්ජා කරන්න කිව්වා.සාකච්ජාවේ වැදගත් කම තමා ඔබතුමා සඳහන් කලේ.මොකද උත්තරීතර සම්ප්‍රදායකට යන බවක් මට නොදැනේන බව ප්‍රකාශ කරන ලදි.එත් එක්කම ඔබතුමා අපේ විපක්ෂයේ හරි .සභිකයන්ගේ හරි කාලය විනාඩි 5ට සීමා කරන්නට උත්සහ කරනවා.මට තේරෙනවා ඒකාධිපති පාලනයකට යන බවත්, ඒ එක්කම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ මේ සභිකවරු සඳහන් කරන්නේ ජනතාවගේ ප්‍රශ්න මහ සභාව රැස්වෙන්නේ මාසයකට සැරයක් එක විනාඩි 5 කට සීමා කර අපි උදේ10.00 ට ඇවිත් 11.00 ට යන්න ද තීරණය කරන්නේ එක මහජනතාවට කරන විශාල අසාධාරණයක්.අපි මහජන නියෝජිතයන් විදිහට මහජනතාවට සේවය කරන්න මෙතනට පැමිණ සිටින්නේ. අපේ පුද්ගලික පැහැදිලි කිරීම් වලදී අපි නිලතල වල ප්‍රශ්නයන් නොව අපි හැම විටම පැහැදිලි කිරීම්වලදී උත්සහ කරන්නේ ජනතාවගේ ප්‍රශ්න.මේ වගේ යෝජනාවකින් සභිකයන්ට තිබෙන අවස්ථාවක් මඟ හැරීමෙන් ජනතාවගේ පැත්තෙන් අසාධාරණයක් සිදුවන බවත්,විශේෂයෙන් සඳහන් කිරීමට ඕනෑ මේක තමන්ගෙ කාරණයක් බව කියන්නට කැමතියි.විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්ට මේ වගේ යෝජනා වලින් එන අසාධාරණකම් ගැන අපි නිශ්ශබ්දව සිටීමට කැමති නැති බව.විශේෂයෙන් අපි මේකට බෙදීමක් ඉල්ලා සිටිනවා.රුක්මන් මන්ත්‍රිතුමා පැවසූ ආකාරයට යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජ්.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රශ්නේ මේක රීතියක් ඔබතුමන්ලා පළපුරුදු මන්ත්‍රීවරුන් විදහට මේවා දන්නවා නැවත මම ප්‍රකාශ කිරීමට අවශ්‍ය නොවන බවයි.පුද්ගලික පැහැදිලි කිරීම් කියන්නේ මන්ත්‍රීතුමන්ලා.මන්ත්‍රීතුමියන්ලා මහ ජනතාවගේ ප්‍රශ්න වෙන්න පුළුවන්.හැබැයි එක නිශ්චිත කාරණාවකට ලඝු වෙන්න පුළුවන් කමක් නැති බවත්,එහෙනම් ඔබතුමන්ලාට පුළුවන් මේක යෝජනා කරලා ඒ යෝජනාව ස්ථිර කර ගැනීමට.පාරක ප්‍රශ්නයක් හා දෙතැනක ප්‍රශ්නය පෞද්ගලික අදහස දැක්වීම.මේක අලුත් අදහසක්වත්,අලුතෙන් ආපු යෝජනාවක්වත්,මගේ අදහසක්වත්,මම හදපු යෝජනාවක්වත්.නොවේ.මේක ගෙනවිත් ඇත්තේ මොකක් හරි අනුමැතියකට යටත්වය.එම රීතිවල තියෙන කාරණා තමා යෝජනාවට ඉදිරිපත් කර ඇති බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මේකට අපි විරුද්ධ නැති බවත්,ඔබතුමාගේ යෝජනාව අනුව තමා අපි බෙදීමක් ඉල්ලා සිටින්නේ. යෝජනාව අනුව කියන්නේ අවස්ථා දෙකකයි.ඒ කියන්නේ ඔබතුමාගේ පැත්තෙන් කථා කර ,පක්ෂයෙන් දෙන්නෙක් පක්ෂ හතරක් නීතිවලට අගෞරව කරනවා නොවෙයි. ඔබතුමාගේ යෝජනාව අනුව තමයි විරුද්ධ වන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නමුත් ප්‍රායෝගිකව කණ්ඩායම් දෙකක් තමා පවතින්නේ. මේ පැත්තේ කණ්ඩායම ගැන බලන විට හතරකට පහකට වැඩි වැඩියි.නමුත් අපට සලකන්නට වෙන්නේ කාණ්ඩායම් දෙකක් විදිහට එකක් ආණ්ඩු පක්ෂය හා විපක්ෂය යනුවෙන් එහෙම කියන්නේ නැතුව මේක යෝජනාවකට දමන්නට නොහැකිය.මොකක්ද කියලා නිකම් කථා කිරිමට නොහැකි නිසා තමා පනතේ නොතිබුනත් සටහන් කලේ. පැහැදිලිවම ප්‍රායෝගිකව භාවිතා කරන්නේ මොකක්ද තියෙන්නේ අපේ ආණ්ඩුව ඒ කැල්ල අල්ලගෙන මෙතන විවාද නොකරන ලෙසත්,ඔබත්මන්ලාට බෙදීමක් උවමනා නම් අපි බෙදීමකට යමුයි. ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මෙක විනාඩි 5 කට සීමා කරනවා කියන එක මේ පනතේ තිබෙනවාද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පනතේ නිශ්චිත කාලයක් සටහන් කිරිම ඇති බව ප්‍රකාශ කරන ලදි.විනාඩි 5 ක් එතකොට විනාඩි පහේ ඒවා හයක් වනාඩි තිහයි.විනාඩි 5 ක් කියන්නේ මන්ත්‍රීතුමන්ලාට යම් ප්‍රමාණවත් කාලයක් කියලා මම හිතනවා.මේක පැහැදිලවම කථා කළා යම් කාරණයක් ප්‍රාදේශීය සභා විෂයට අදාළව දෙයක් පැහැදිලි කරන්න කියලා.අනවශ්‍ය දේවල් ඉදිරිපත් නොකර කථා කරන්නේ නම් විනාඩි 5 ප්‍රමාණවත්වේ.උදාහරණයක් වශයෙන් පාරක් හදන එක ගැන මගේ පුද්ගලික අදහස ගෙදරකට වතුර දෙන එක සම්බන්ධයෙන්,කුණු කන්ද පිළිබඳ මගේ පුද්ගලික අදහස ඒ වගේ එකක් එහෙම නැතිව වෙන යම් දෙයක් පිළිබද නෙවේ.අපි විනයකට හැදුනේ නැත්නම් මේ සභාව පාලනය කර ගැනිමට නොහැකි බවත්,මෙය පනතේ තිබෙන්නේ නිශ්චිත කාලයකට පමණක් බවත් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමාට නිශ්චිත කාලයද නැතිනම් කාගේ සභා යෝජනා වලටද සාකච්ඡා කිරිමට නිශ්චිත කාලයක් තිබෙන්නේ යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මගේ යෝජනාව විනාඩි පහයි.එක පැත්තකට තුන්දෙනා ගානේ අවසර දෙන්නේ.ඔබතුමන්ලා අකමැති නම් සංශෝධන ගෙවිත් ඉදිරිපත් කරන්න යැයි ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මේක නිශ්චිත කාලයකට සීමා කරන්න එපා.පුද්ගලික ප්‍රශ්න තියෙනවා ,ප්‍රශ්නයක් ප්‍රකාශ කළාට කමක් නෑ විනාඩි 5ක සීමා ඇතුළත අපි කථා කරන්නට වුණාම මේ සභාවේ කථා කරනනේ කවු ද ? විනාඩි 5 කට මේක සීමා කලේ අපෙන් බාධාවක් ද ඔබතුමා සිදු වුණාද යනුවෙන් පවසන ලදි. ඉතිහාසයේ කවුරුවත්ම මේ වගේ යෝජනාවක් කරලා නැති බව.එහෙනම් ඇයි අපි මේ දේ කරන්නේ මොකද මහජනතාවගේ දෙයක් තමා කථා කරන්නේ.පෞද්ගලික කාරණයක් නොවේ.අපි ජනතාව වෙනුවෙන් ඇවිත් ජනතාවගේ ප්‍රශ්න කථා කරන්නේ එතකොට මේක සීමා කිරිමට උත්සහ කරනවා නම් ඒක මොන අරමුණකට කරන දෙයක්ද කියලා අපිට පැහැදිලි නැති බව ප්‍රකාශ කරන ලදි.මාසෙකට සැරයක් මහසභාව පැවැත්වෙන්නේ එම නිසා අපි සභාවට පැමිණ ප්‍රශ්න කථා කිරිමට තිබෙන්නේ මාසෙකට සැරයක් බව ප්‍රකාශ කරන ලදි.එය මහසභාවේදී විනාඩි 5 ක සීමා කරනවා නම් එක සභාකයාට නොව ජනතාවට කරන ලොකු අසාධාරණයක් බවත්,එම නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙසත් මෙසේ කිරිම විනාඩි 5 කට සීමා කිරිම මහ අසාධාරණයක් වැඩක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

ගර සභාපතිතුමන්,මේක අපි සාකච්ඡා කර ගත්ත යෝජනාවක් එකට හේතුව තමයි.අපි සියලුදෙනාටම කථා කරන්නට පුළුවන් අපි යෝජනා කරනවා ඒ සියල්ල කථා කිරීමෙන් පසු අවසානයේදී අපට යම්කිසි අවස්ථාවක් අවශ්‍ය නම් අන්න එකට අපි තුන්දෙනෙක් තෝරා ගනිමු.ගිය සැරේ කථා කරන තුන්දෙනා නෙවෙයි ඊළඟ සැරේ වෙන තුන්දෙනෙක් අවස්ථාව හැමදාම එක්කෙනාට විනාඩි 15 ක් අරගෙන

තිබෙනවා.මෙක සියලුදෙනාටම බෙදීලා යන වැඩක් එහෙම නැතුව සම්පූර්ණ තමන්ගේ කාලයෙන් සභාවේ කාලයට විනාඩි 5 යි කියන එක නොවෙයි.ඒක තේරුම් ගන්න.විනාඩි 5ක් කියලා කියන්නේ අපි අවසානයේ සභාවේ කථාකර අවසන් වූ පසු කථා කිරීමට තිබෙනවානම් අන්න එකට අවස්ථාව හදාගන්න කියන එක තමයි මේ යෝජනා කරලා තිබෙන්නේ සියලුමදෙනා කථා කිරීම නොහැකිය.ඒකාධිපති පාලනයක් යන්න එපා යනුවෙන් සඳහන් කර මේකේ බිල්ලෝ මවන්නව එහෙම එකක් නැති බවත්.මේක තුළ සාධාරණ ඕනෑම දෙයකට යම් ප්‍රමාණයකට තිබෙන්න ඕනෑ අපට හිතුන හිතුන දේ ගෙනැල්ලා මෙතන වරු ගණන් කථා කරලා කාලේ නාස්ති කරන්නට නොහැකි බවත්,ඒක නිසා දෙයකට සීමාවන් තබා ගැනීමට අවශ්‍ය බව හා ඒ දෙන සීමාව තමා විනාඩි 5 ක් හරි විනඩි 10 ක් හරි පැයක් කථා කළත්ප්‍රශ්නයක් නෑ හැබැයි එකේ කාලය අපි තීරණය කර ගන්නට වෙනවා.අපේ තියෙන දේවල් කියන්ට අපිට පාවිච්චි කිරීමට පුළුවන් කාලයත් එක්ක මේක පාවිච්චි කරන්න පුළුවන් එකයි අපි අදහස් කලේ යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

අපි මේක ගැටලුවක් නොකර ගනිමු. චක්‍රලේඛන ක්‍රියාත්මක කරන්නට ඕනෑ මේක ප්‍රයෝගික වැඩ කටයුතු කර ගෙන යමු. මාසයකට සැරයක් තිබෙන නිසා මේක ගැටලුවක් වශයෙන් කථා කිරීමට අවශ්‍ය නොවන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ යෝජනාව කෙටියෙන් ඉදිරිපත් කරන්නේ මේ ලොකු විස්තරය දමන්නට නොහැකි නිසා මට කථා කිරීමට අවස්ථාවක් නොදී ඉන්නත් පුළුවන් සාමාන්‍යයෙන් සභාරැස්වීමකදී නිසියම් කටයුත්තක් පොදු අරමුණක් වෙනුවෙන් කළයුතු පුද්ගලික පැහැදිලි කිරීමක් ඇත්නම් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සභා රැස්වීමට පූර්වයෙන් සභාවට ඉදිරිපත් කර තිබිය යුතුය.මේක පාවිච්චි කරලා අරක න්‍යාය පත්‍රයේ තෑ කියලා මට යන්නට පුළුවන්.මම මේක වඩාත් ප්‍රජාතාන්ත්‍රවාදිව කරගෙන යන්නට අදහස් කලේ.ප්‍රියංජිත් මන්ත්‍රීතුමාට මම ස්තූතිවන්ත වෙනවා මේ අදහසට එකඟවීම පිළිබඳව මේක කාලගොට්ටියක් කර නොගෙන රඹුක්කන ප්‍රාදේශීය සභාව උත්තරීතර ආයතනයක් මහජන ගැලරිය තිබෙනවා.ලස්සනට හැසිරුනේ නැති වුණොත් හොඳ මදිය.අන්න එක නිසා විනාඩි 5 කට ලඝු වෙන එපා.සුසාන්ත මන්ත්‍රීතුමා පැවසුවා වගේ අපි උත්සහ කරමු විනාඩි 5 ක් තුළ සභා රැස්වීමට ගැළපෙන දෙයක් කථා කිරීමට එකට විනාඩි 5 ක් වෙන්නත් පුළුවන්,විනාඩි10 ක් වෙන්නත් පුළුවන් හැබැයි සභාවට ගැලපෙන දෙවල් වෙන්න ඕනෑ නොගැළපෙන අනවශ්‍ය දෙවල් මෙතන කථා කිරීමට නොහැකි බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා මේ පුද්ගලික පැහැදිලි කිරීම කරන්නේ මොන අවස්ථාවේද යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අන්තිමේදී න්‍යාය පත්‍රය කියවන්න.එක පූර්වයෙන් ගේන්න කියලා තමා රීතිවල තිබෙන්නේ ගිය පාර තමා අපේ පළමුවැනි සභාව වාරය පැවතියේ අපිට එක අලුත් අත් දැකීමක් නමුත් අපි කිපසැරයක් මේ ගැන කථා කළා. ඊට පස්සේ තමා මේ රීතිමාලාව අධ්‍යනය කරන්නට සිදු වුනේ.එතකොට රීතිමාලාවට තිබෙනවා එකට සකස් වූ ක්‍රියාමාර්ග එකේ සාරාංශයක් තමා මේ ඉදිරිපත් කරන්නේ එකට එකඟවෙන්නේ නැත්නම් බෙදීමට යමුයි. ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පෞද්ගලික පැහැදිලි කිරීම් වලට යනකොට අපේ මන්ත්‍රීවරුන් තුන්දෙනෙකුට තමා අවස්ථාව හිමි වන්නේ.ඔබතුමන්ලා මේ යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ සාකච්ඡා කරලා ගෙනාවා කියලා තමා ඉදිරිපත් කලේ.අපි විපක්ෂයක් විදිහට යෝජනා සාකච්ඡා කිරීම ,විපක්ෂයක් විදිහට සංවිධානවීමක් නැත. ඒක අපේ දුර්වලතාවයක් කියලා සඳහන් කරන්නට එපා.ඔබතුමා පවසන විදහට සභිකයෝ ඉන්නේ එක නිසා අපි විපක්ෂයක් විදිහට සංවිධානය වෙලා නැත. එහෙනම් දැන් ඉදිරියේදී සංවිධානය වෙන්න වෙයි.කියන එක වෙනම කාරණයක්.එතකොට ඔබතුමන්ලාට මන්ත්‍රීවරුන් තෝරා ගන්න වෙන එක වෙනම කාරණයක් අපේ මන්ත්‍රීවරු17 ක් සිටිනවා.පෞද්ගලික පහැදිලි කිරීම් 17 ක් ආවොත්

ඒක සීමා කරන්නේ ඇයි.ඊළඟ මාසයට ද දෙන්නේ යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේක පනතේ තිබෙන්නේ ඔබතුමාලා සංවිධානය තිබෙනවාද නැද්ද යන එක මම දන්නේ නැති බවත්,මේ යෝජනා අපි කලින් එවන්නේ මේක අපි කාටත් අත්දැකිමක්ය.ඒක මම පිළිගන්නවා.නමුත් අද ඉඳන් මේ සභික මන්ත්‍රීවරුන්ට මෙහෙම අවස්ථාවක් තිබෙනවා. ඒකට සුදානම් වීම ඔබතුමන්ලාගේ ඔබතුමියන්ලාගේ වැඩක්ය. මම මන්ත්‍රීවරුන්ට කථා කරලා ඔයාල මෙයාලා කිවේ නෑ.ඒක මන්ත්‍රීවරුන්ගේ ස්වාධින අයිතියක් ඒක අනවශ්‍ය විදිහට භාවිතා කරන්නට එපා. 32 වගන්තියේ 2 කියන්නේ සාමාන්‍ය රැස්වීමකදී කිසියම් සභිකවරයකු පොදු අරමුණක් වෙනුවෙන් කළයුතු පුද්ගලික පැහිදිලි කිරිමක් ඇත්නම් සභාරැස්වීම ආරම්භය කිරිමට පූර්වයෙන් සභාවට ඉදිරිපත් කලයුතුය.තමන්ට කථා කිරිම අවශ්‍ය නම් එක පූර්වයෙන් ඉදිරිපත් කරන ලෙසත්,එය බලලා අවස්ථාව දෙන්නම්.එතකොට හරිනේ. පුද්ගලික පැහිදිලි කිරිමක් තිබෙන අය දෙයි.නැති අය නොදෙයි යැයි ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාවක් විදිහට ගෙනියන විට කාල ගොට්ටියක් ඇති වුනොත් ඒ අවස්ථාවේ දී ඔබතුමා ඒ යෝජනාව අනුව එදා දවසට අයිතය තිබෙනවා අන්දොලාත්මක තත්වයක් එනවා නම් කාලය සීමාව නිශ්චිත කිරිමට පුළුවන.මේතුමා කිවා වගේ බිල්ලෝ මවන්නට එපා කියා කියනවා. මම හිතින්නේ දේශපාලනය ආරම්භයේ ම යෝජනාවේ සඳහන් වුණා. පැහැදිලවම යෝජනා රීතිවල තිබෙනවා සභාව මෙහෙයවන විට යම්කිසි යෝජනාවක් උග්‍රවන්නේ නම් ඒ අවස්ථාවේදී ඔබතුමාට බලතල අනුව ඒක සීමා කිරිමට කටයුතු කිරිම ඔබතුමාට බලය තිබෙනවා.නමුත් මේ යෝජනාවට විපක්ෂයේ මන්ත්‍රීවරුන් නිශ්ශබ්දව ඉන්නේ නැති බව ද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාවට සංශෝධන අවශ්‍ය නම් සංශෝධන ගෙනවිත් සංශෝධනය කරගන්න.එකට ලඝු විමක් වෙන්නේ නැති බවත්,සාමාන්‍ය සභා රැස්වීමකදී සභිකයෙක් යම් දෙයක් යෝජනා කරනවා නම් අදහස් දක්වනවා නම් එම සභාවට කලින් මට ලබා දෙන්න.එතැකදී ගැටුමක් ඇති වු විට එම අවස්ථාවේදී විසඳා ගැනිම සිදු කර ගැනිමට හැකි බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා මේ වගේ යෝජනාවක් දැන් ගෙන එම සිදු කලේ.අපි සභාවාර කිහිපක් පැවතිය අවස්ථාවල ඔබතුමාට ගැටළුවකු ඇති වුණා ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මම යෝජනාවක් ගෙන ඒමක් සිදුකර නොමැති බවත්, මේය රීති හා න්‍යාය පත්‍ර වල තිබෙනවා.ඔබතුමාලා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු අනෙක් අය කණිෂ්ඨ මන්ත්‍රීවරු එම නිසා මේ පිළිබඳ අවබෝධයක් ඇත.මේ රීති වල සාරාංශයක් තමා ගෙනාවේ.එකට ඔබතුමන්ලාට බෙදිමක් අවශ්‍ය නම් බෙදීමක් ඉල්ලන්න ලෙස ප්‍රකාශ කරන ලදි.මේ සංශෝධනයට යටත්ව කාරණයක් ඉදිරිපත් කිරිමක් කරනවා. නම් පූර්වයෙන් 32 (2) අනුව කටයුතු කරන්න.එහෙම කටයුතු කරන්නේ නැතිනම් මේක සම්මත කර ගන්න.බෙදීමක් ඕන නම් බෙදීමකට යන්න.සංශෝධන අවශ්‍ය නම් සංශෝධන වලට යන්න. ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

සමිර මන්ත්‍රීතුමා මම අන්නේ මේ යෝජනාව තේරුම් ගන්නේ කොහොමද කියලා යනුවෙන් ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මේ යෝජනාව සම්බන්ධයෙන් තමා මෙච්චර වෙලා කථා කලේ.මේ යෝජනාවෙන් අපේ මන්ත්‍රීවරුන්ගේ කාල සීමාව කෙටි කරන්නේ විනාඩි 5 ට සීමා කරන්නේ කුමකට ද හදිසියේ මෙහෙම උවමනාවක් ඇති වුනේ ඇයි.මගෙන් සභාපතිතුමාට හරි,කාට හරි කියන කාරණාවකට එහෙම අපෙන් මොනවා හරි බලපෑමක් මේ සභාව කරගෙන යන විට ඔබතුමාට හානියක් සිදු වුණාද යනුවෙන් ප්‍රකාශ

කරන ලදි.මෙහෙම සීමා කිරිමට හේතුව කුමක් ද? අපි කථා කරන්නේ ජනතාව වෙනුවෙන් නැවතු මගේ , උප සභාපතිතුමාගේ නැත්තම් ඔබතුමන්ලාගේ පෞද්ගලික කාරණාවන් නොවන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔතුමන්ලා දන්නවා මගේ පෞද්ගලික අදහසක් මේ න්‍යාය පත්‍රයේ දමන්න බැරි බව ප්‍රකාශ කරන ලදි.එතකොට ඉතිහාසයේ මෙහෙම දෙයක් තිබුණේ නැත.මමත් සභවේ සිටියා මෙහෙම එකක් කථා කිරිමට අපට සභාපතිතුමා ඉඩ දුන්නනේ නැති බවත්,එම අවස්ථාව තමා අපට දීලා තිබෙන්නේ.මන්ත්‍රීවරු කාටවත් බාධා කිරිමටවත්,ඒ අවස්ථාව අනවශ්‍ය විදිහට පාවිච්චි කිරිමටත් නොවේ.පනතේ තිබෙනවා.න්‍යාය පත්‍රයට ඇතුළු කිරිම කරන්නේ කොහොමද කියන එක මේ පොතේ තිබෙනවා.එහි සරාංශය තමා යෝජනාවක් විදිහට ගෙන ආවේ.විනාඩි 5 ක් වුණාට හය දෙනෙක් නිසා එයට විනාඩි 30 ක කාලයක් ගත වේ.සභාවේ සාමාන්‍ය රැස්වීමකදී සභිකයකුට පුද්ගලික පැහැදිලි කිරිම සඳහා වෙන් කළ කාල සීමාව සඳහා සභාව විසින් තීරණය කරනු ලබන අතර එසේ වැඩි කාලයක් සඳහා එක් එක් සභිකවරයක් සඳහා උපරිම කාලසීමාව ලබාදිම සිදුකළ යුතුයි.එනෙම් විනාඩි 5 ක් මදිනම් විනාඩි 10 ක් වුණත් පුළුවන්. සභාවේ වැඩක් නම් ලබා දෙන්න.මෙතන මන්ත්‍රීවරු 37 දෙනාට කථා කරන්න ජනතාවගේ ප්‍රශ්න නම් තිබෙනවා නම් යෝජනා දෙන්න. ඒ යෝජනා පෞද්ගලිකව පැහැදිලි කිරිමක් කරන්න.එක පක්ෂකනට අදාළ වෙන්නේ නැත.මේක අලුත් තමා, නැවතත් මම පැහැදිලි කිරිමක් කරන්නම් කුණු ප්‍රශ්නය ගැන හා සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ පෞද්ගලික පැහැදිලි කිරිම දැන් රෝහණ මන්ත්‍රීතුමා පැවසුව එතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරිම මාළු වෙළදාම පිළිබඳ මේකෙන් එහෙම එකක් බලාපොරොත්තු වෙනවා මිසක් කථාව නතර කිරිමට හදනවා නොවෙයි.ජනතාවගේ ප්‍රශ්න කථා කරනවා නම් හොඳයි.අභියෝග නැති බවත්, මීට වඩා අභියෝග වලින් අපි මෙතනට පැමිණියේ යනුවෙන් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

අපි රජය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමට ඇවිත් තියෙන්න.අපේ හෘද සාක්ෂියට අනුව අපි වැඩ කරන්න ඕනෑ.අපි කථා කරන්න ඕනෑ,අදහස් දක්වන්න ඕනෑ මම කියන්නේ කථා කිරිම, අදහස් දැක්වීම.සියල්ලම රඹුක්කන ජනතාවට සේවය කිරිම සඳහා අවස්ථාව එකතු කර ගනිමු.මම හිතන්නේ පැය දෙකක දේවල් විනාඩි 5 කින් කථා කර අවසන් කිරිම කළ හැකිය.ඔබතුමන්ලාට වැඩ කිරිමට උවමනාවක් තිබෙනවා ඊටත් වඩා වැඩි උවමනාවක් අපට තිබෙනවා.ඒ නිසා කාලය නාස්ති නොකර අපි දෙගොල්ලන්ම එකතු වී ඉතාමත් හොඳ විධිදිහට සාධාරණ විදිහට කරගෙන යමු.අඩුපාඩු ඇති බව ඔබතුමන්ලා කලින් දවසේත් ප්‍රකාශ කළා.අපි එනතු වෙලා වැඩ කරමු.ඒකට අපි සුදානම්.හැබැයි කාලය නාස්ති නොකර හෘද සාක්ෂියට අනුව වැඩ කරමු.කාලය ඉතිරි කර හොඳට කර ගෙන යමු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා මම නැවත කියනනේ පෞද්ගලික පැහැදිලි කිරිම් වලට අපට විනාඩි 5 ක නිශ්චිත කාලයක් ලබා දෙන්න එපා.මෙතුමා කථා කරපු ආකාරයට අනෙකුත් මන්ත්‍රීතුමන්ලා කථා කරන්න ඕනෑ ද? කියලා එතුමා අහනවා.යැයි ප්‍රශ්න කර ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔබතුමාට නිශ්චිත කාලය විනාඩි 5 ක් මදිනම් සංශෝධන ගෙන එන්න ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පෞද්ගලික පැහැදිලි කිරිම් විනාඩි 5 කට ලඝු නොකරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එනෙම් අන්තිම උත්තරය මේක 32 (2) තියෙනවා සාමාන්‍ය රැස්විමකදී කිසියම් සභිකවරයෙකු විසින් පොදු අරමුණක් වෙනුවෙන් කළයුතු පෞද්ගලික පැහැදිලි කිරිමක් ඇත්නම් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සභා රැස්වීම ආරම්භවය පූර්වයන් ඉල්ලීම් කළයුතු ය.එහෙනම් ඒකට යන බව ප්‍රකාශ කරන ලදි. 32 (2)

යටත්ව අපේ න්‍යාය පත්‍රයේ තිබෙන (එ) අකුරෙන් සභිකයන්ගේ පුද්ගලික අදහස් පැහැදිලි කිරිමට සිදු කිරිමට ප්‍රකාශ කරන ලදි. අලුතෙන් ගෙන ආ යෝජනාවක් එක රීති 32 වගන්තියේ පැහැදිලි කිරිමක් කර තිබෙනවා.එහි සාරාංශය මම ප්‍රකාශ කලේ.කවුද කථා කරන්නේ කියන එන තීරණය කරන් ඕනෑ.නිශ්චිත වේලාවක් තිරණය කර ගන්න.මේ රීතිවල තියෙනවා.තව තැනක තිබෙනවා මොකක්ද කථා කරන්නේ කියන එක සභාපතිවරයාට භාර දිය යුතු බවටමේ යෝජනාව සංශෝධන නෑ කාලය නෑ,ප්‍රමාණයක් නෑ,පූර්වයෙන් ලැබෙන යෝජනා පමණක් කථා කරන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මම දකින විදිහට අපි කාරක සභාසභික තත්වයක් ගෙනනවා හැටියට මම දකින්නේ.අපට න්‍යාය පත්‍රයක් තිබෙනවා. න්‍යාය පත්‍රයේ කරුණු සලකා බැලුවට මත්තෙන් පෞද්ගිලිකව අපට විනාඩි 5 ගානේ.එක මන්ත්‍රීවරයකුට ලැබෙන එක තමා මට හැගෙන්නේ.එතකොට අපි යෝජනාවක් ගෙන ආවනම් තමන්ට අදාළ යෝජනාව කථා කිරිමට පුළුවන්.එක අපිට විස්තර කරන්න පුළුවන්.ඊට පසුව අපේ යෝජනා න්‍යාය පත්‍රය අවසන් වූ පසු එක මන්ත්‍රීවරයකුට විනාඩි 5 ක් ලැබෙන විදයටද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තමන්ට යෝජනාවක් ඉදිරිපත් කිරිමට ඇති නම් එක ඉසිරිපත් කර ඉවර කර ගන්න පුළුවන් මොකක්ද මේ පෞද්ගලික පැහැදිලි කිරිම කියන්නේ උදාහරණක් වශයෙන් බස් එකක් රඹුකක්න සිට කෑගල්ල දක්වා ගමන් කරනවා ඒ පිළිබද ඔබලාගේ පුද්ගලික අදහස් මේක රටේ තිබෙන ලොකු ප්‍රශ්න ගැන කථා කරන්න එපා.ඒ කියන්නේ මන්ත්‍රීවරයකුගේ පුද්ගලික අදහස් එකතු කරන්න ඕනෑ.කුණු ප්‍රශ්නය,සභාවේ ක්‍රියාකාරත්වය පිළිබද මගේ පුද්ගලික අදහස් මේක ඒ වගේ පැහැදිලි කිරිමක් සිදු කරන්න.මේක අලුත් තමා ඔබතුමන්ලාට ඉතිහාසයේ මෙහෙම තැනක් තිබුණේ නැත.මේක තියෙන්නෙ ඇයි කියන එක මම දන්නේ නැත.මම හදපු එකක් නොවේ.මේක න්‍යාය පත්‍රයට දාලා තිබෙන්නේ.(එ) අකුරෙන් තිබෙන සභිකවරුන්ගේ පුද්ගලික අදහස් පාවිච්චි කිරිම කියලා. මේ රීති පටලවා ගන්න එපා.මේ යෝජනාව සංශෝධනය කරනවා.අද දවසට මේක වලංගුයි.ඊළග සභාවාරයේ 32 (2) වගන්තිය අනුව කටයුතු කරමු.අද තුන්දෙනා ගානේ විනාඩි 5 ක් අවශ්‍ය නැත. ඊළග සභාවාරයේ දී පුද්ගලික අදහස් දක්වන්න තිබෙනවා.ලිඛිතව සභාවට කලින් ඉදිරිපත් කරන්න.ලිපි ලැබෙන පිළිවෙළ අනුව අවස්ථාව ලබා දෙනවා.එකට එකඟනේ ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

මේ ප්‍රශ්නය ලයනල් මන්ත්‍රීතුමා අහලා නිරාකරණය කර ගත් බවත්, මෙ සභාව නොමඟට යවන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

32 (2) වගන්තිය අනුව කටයුතු කිරිම අනුමත කිරිමට තීරණය විය.

ix. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්.එම්.එස්.එස්.රත්නායක වන මා වෙත අංක PF 7429 කැබ් රථය පෞද්ගලික පරිහරණය සඳහා අවසර දීමත්,ඒ සඳහා මාගෙන් රු350.00 ක් සභාවට මාගේ පෞද්ගලික මුදලින් ගෙවීමට අවසර දීමත්,රියදුරු නොමැති අවස්ථාවලදී රථය පැදවීමට අවසර දීමත්,මසකට ඩීසල් ලීටර් 500 ක් සැපයිමත් සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙ යෝජනාව සභාවට ඉදිරිපත් කිරිමට අවශ්‍ය නැත.මෙය රාජ්‍ය පාරිපාලන චක්‍රලේඛනයේ තිබෙන බව සඳහන් කරන ලදි. නමුත් ඔබතුමාලාගේ දැන ගැනීමට ඉදිරිපත් කලේ.මම මේක අනවශ්‍ය ලෙස පාවිච්චි කරනවා නම් එයට විරුද්ධ වන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
මම දන්නේ නැති හින්දා මෙය අසන්නේ ඔබතුමාගේ පෞද්ගලිකව රු350.00 ක් දෙන එක පැහැදිලි කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
වාහනයේ මගේ පෞද්ගලික ගමන් බිමන් යනවා නම් ඒ කියන්නේ ළමයා පාසල් රැගෙන යාම,ගෙදරට අවශ්‍ය දේවල් ලබා ගැනිමට යාම. වැනි දේවල් සඳහා මට යොදා ගැනිම පුළුවන.එහෙම ගමන් යනවා නම් රු350.00 ක් දීලා රිසිට් එකක් ලබා ගන්න වෙනවා.මේ පිළිබඳ විනිවිද භාවයක් පැවතිය යුතු බැවින් මේ ආකාරයට කිරිමට අදහස් කලේ.පසුගිය දවසක රියදුරන්ගේ ප්‍රශ්නයක් ආවා එවැනි වේලාවක මගේ වැඩ සඳහා යාමට පුළුවන් විම නිසා මේ යෝජනාව ඉදිරිපත් කළ බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
කැබ් රථය භාවිතා කිරිම අනුමත කිරිම තීරණය විය.

x. සබරගමුව පළාත් සභාව ,ප්‍රධාන අමාත්‍යාංශය සංරචකයන් 06 ක් යටතේ අප වෙත යොමු කළ සංවර්ධන ව්‍යාපෘති
(ප්‍රජා ජල ව්‍යාපෘති ජල සම්පාදන හා ජලපවාහන මණ්ලයට යෙමු කරන ලදි)
- අමාත්‍යාංශ මහජන ඉල්ලීම් ඉටුකිරිම යටතේ සහා අරමුදල් යොදවා සංවර්ධන ව්‍යාපෘති 47 ක් ක්‍රියාත්මක කිරිමට යෝජනා කරමි. (මින් ව්‍යාපෘති 02 න් විධායක ඉංජිනේරු වෙත යොමු කරන ලදි)
- සබරගමුව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කිරිමට ව්‍යාපෘති 02 ක් ද
- ග්‍රාමීය යටතල පහසුකම් වැඩි දියුණු කිරිම යටතේ ව්‍යාපෘති 01 ක් ද
- සංචාරකයන් සඳහා සනීපාරක්ෂන වැඩි දියුණු කිරිම යටතේ ව්‍යාපෘති 02 ක් ද

ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිමට සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
සංවර්ධන ව්‍යාපෘති ටිකක් අපි පළාත් සභාවට ඉදිරිපත් කළා ඒ ඉදිරිපත් කළ ව්‍යාපෘති තමා තිබෙන්නේ.සංවර්ධන නිලධාරිනියගෙන් විස්තර දැන ගැනිම පුළුවන් බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ සංවර්ධන යෝජනා කිරිම  අනුමත කිරිම තීරණය විය.

xi. රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් PC 073428 ඡයා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරිම සඳහා නියෝජිත ආයතනය විසින් ඉදිරිපත්(John keels office automation(pvt)ltd  කර ඇත රු52,042.16 ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපේ ඡයා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරිම සඳහා නියෝජිත ආයතනය විසින් ඉදිරිපත් ඇති ඇස්තමේන්තුව අනුමත කිරිම මේ ගැන විස්තර අවශ්‍ය නම් විෂය නිලධාරිගෙන් දැන ගැනිමට පුළුවන් බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

PC 073428 ඡයා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරිම රු52,042.16 ක ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

xii. කොම්පෝස්ට් අංගනයේ ගොඩනැගිල්ලට ඇතුළු වන ස්ථානය සකස් කිරිමට අදාළ රු7400.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු  බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කොම්පෝස්ට් අංගනයේ ගොඩනැගිල්ලට ඇතුළු වන මාර්ගය සේදී ගොස් ඇති බැවින් එයට ගල්පස් දැම්ම සකස් කිරිමට අවශ්‍ය බව ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා මෙම මේකට තව දෙයක් එකතු කරන්නට අදහස් කරනවා. මේ දිස්ත්‍රික්කයේ සිටින පරිසර ඇමතිතුමා සමඟ සාකච්ජා කර පුළුවන් නම් යෝජනාවක් ගෙන්න. කොම්පෝස්ට් අංගනයට තව අක්කර 2 ක ප්‍රමාණයක් එකතු කර ගැනිමට.මේ සඳහා පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොමැති නිසා අවශ්‍ය ප්‍රමාණයෙන් සකස් කර ගැනිමට ඔබතුමාගේ මැදිහත් වෙයි කියලා සිතන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීන්ති එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරිමට බලන බවට ගරු සභාපතිතුමා  පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

අදාළ  රු7400.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිම  තීරණය විය.

xiii. GIS තාක්ෂණය මගින් මැනුම් කරන ලද මාර්ග පළමු අදියර යටතේ A1 මාර්ගයට අයත් මාර්ග 64 2025/01/21 දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලදි.එම මාර්ගයන් සඳහා මෙතෙක් කිසිදු විරෝධතාවක් නොමැති බැවින් දෙවන වරට ගැසට් නිවේදනයේ පළ කිරිම සඳහා අනුමැති ලබා ගැනිම සුදුසු බව  ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පළමු අදියර යටතේ ගැසට් කළා විරෝධතා නොමැති බැවින් දෙවැනි වරට ගැසට් කිරීමට ඉල්ලන බව ගරු සභාපතිතුමා පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා,මේ මාර්ග ගැසට් කිරීමෙන් පසු ලියාපදිංචි වෙනවද? ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතමා පවසන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ලියාපදිංචි වෙලා තිබෙන්නේ තුන්වැනි පාර ගියාම හරි බව ගරු සභාපතිතුමා පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

දෙවන වරට ගැසට් නිවේදනයේ පළ කිරිම සඳහා අනුමැතිය ලබාදීම තීරණය විය.

xiv. රාජ්‍ය සේවකයින් සඳහා ආපදා ණය ලබා දීමේදී උපරිම සීමාව දැනට පවතින රු250,000.00 සිට රු400,000.00 දක්වා ඉහළ නංවා ඇත.ඒ අනුව රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ණය ගිණුමේ මුදල් ශේෂය සලකා ආපදා ණය පළමු වරට අයදුම්කර ඇති රාජ්‍ය සේවකයින් සඳහා මූලික වැටුප මෙන් මාස 10 ක වැටුප හෝ රු400,000 ක් හෝ යන දෙකෙන් අඩු මුදල ගෙවීම සහ දැනට ලබාගෙන ඇති ණය මුදලේ ගෙවා අවසන් කොටස යළි ලබා ගැනීමට අයදුම්කර ඇති රාජ්‍ය සේවකයින් සඳහා රු250,000.00 ක උපරිමයකට යටත්ව ආපදා ණය ලබාදීමට සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

උපරිම සීමවට අනුව රාජ්‍ය සේවකයින් සඳහා ආපදා ණය ලබා දීමේදී අනුමත කිරිම තීරණය විය.

xv. විදුලි සෝපානය සඳහා බැටරි දැමීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් අනුමත කිරිම සුදුසු බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විදුලි සෝපානය ක්‍රියාවිරහිත වී ඇත.ඒ සඳහා බැටරිය දැමීමට බදු මුදලත් සමඟ රු49589.50 ක් යන බව ගරු සභාපතිතුමා පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය-

බදු මුදලත් සමඟ රු49589.50 ක මුදල බැටරිය ලබා ගැනීමට අනුමත කිරිම තීරණය විය.

xvi. 2025.06.13 දින සිට 2025.06.30 දක්වා උපලේඛන අංක 01 හි සඳහන් වියදම් දැරීම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**2025.06.13 සිට 2025.06.30 දක්වා වියදම් පිළිබද විස්තර**

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2025.06.13 | 619 | sri lanka insurance corporation | ප්‍රාදේශීය සභාවට අයත් පැරණි වෙළද සංකීර්ණය සදහා රක්ෂණාවරණ මුදල් ගෙවීම | 19759.37 |
| | 620 | මුදල් භාරකරු | ආර්.ජී.එස්.නිරෝෂන් මහතාගේ සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ LG/LG/1/2/4 අනුව ධූර කාලය අවසන් කරන ලද පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්ට දීමනා ගෙවීම | 20000.00 |
| | 621 | මුදල් භාරකරු | නැවත සේවයේ යෙදවූ විශ්‍රාමික කාර්මික නිලධාරි කේ්.එස්.ඩී.කලුආරච්චි මහතාගේ මැයි මස දීමනා ගෙවීම | 63300.00 |
| | 622 | මුදල් භාරකරු | ඩබ්.ජී.චන්ද්‍රා කුමාරි මහත්මියගේ මැතිවරණ දීමනා ගෙවීම | 6000.00 |
| | 623 | මුදල් භාරකරු | ඩබ්.ජී.චන්ද්‍රා කුමාරි මහත්මියගේ මැතිවරණ දීමනා ගෙවීම | 3000.00 |
| | 624 | මුදල් භාරකරු | ඩබ්.ජී.චන්ද්‍රා කුමාරි මහත්මියගේ මැතිවරණ ගමන් වියදම් දීමනා ගෙවීම | 2672.00 |
| | 625 | මුදල් භාරකරු | ඩබ්.ජී.චන්ද්‍රා කුමාරි මහත්මියගේ මැතිවරණ දීමනා ගෙවීම | 7000.00 |
| | 626 | මුදල් භාරකරු | බී.ඒ.අසංක හංස කුමාර මහතාගේ මැතිවරණ ගමන් වියදම් දීමනා ගෙවීම | 2254.00 |
| | 627 | මුදල් භාරකරු | බී.ඒ.අසංක හංස කුමාර මහතාගේ මැතිවරණ දීමනා ගෙවීම | 6000.00 |
| | 628 | ජී.ජී.එස්.බණ්ඩාර | මැතිවරණ දීමනා ගෙවීම | 4000.00 |
| | 629 | ජී.ජී.එස්.බණ්ඩාර | මැතිවරණ ගමන් වියදම් ගෙවීම | 1400.00 |
| 2025.06.19 | 630 | A.K.W.පුෂ්ප කුමාර | ආදාහනාගාරය සදහා කි.ග්‍රෑ 37.5 ක ලාෆ් ගෑස් සිලින්ඩර 06ක් සැපයීම වෙනුවෙන් ගෙවීම | 105395.00 |
| 2025.06.20 | 631 | A.M.H.G.රාජකරුණාතිලක | ගලි බවුසර් සේවාව ඉටු නොවීම මත මුදල් ආපසු ගෙවීම | 9025.00 |
| | 632 | ආදායම් ගණකාධිකාරි,ලංකා විදුලිබල මණ්ඩලය | අප්‍රේල් ,මැයි මස විදුලි බිල්පත් ගෙවීම | 26720.52 |
| | 633 | සාමාන්‍යාධිකාරි.සි/ස වි.සේ.ස. සමිතිය | 2025.04.01 - 2025.04.30 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 416274.50 |
| | 634 | T.M.A.T.බණ්ඩාර | 52-6699 කැබ් රථයේ විදුලි පද්ධතිය අලුත් වැඩියාව | 7000.00 |
| | 635 | B.N.K.ගමගේ | සේවක ඇප ආරක්ෂණ මුදල් ආපසු ගෙවීම | 31448.71 |
| | 636 | K.G.ප්‍රියදර්ශනී | සේවක ඇප ආරක්ෂණ මුදල් ආපසු ගෙවීම | 17540.21 |
| | 637 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2025 පෙබරවාරි මස දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම | 18800.00 |
| | 638 | st Anthony's Distributors (pvt) ltd. | ගබඩා ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම | 98067.50 |
| | 639 | paperline Tradinng (pvt) ltd. | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම | 11090.12 |
| | 640 | S.M.KB.සමරකෝන් | සති පොළ ජල නල පද්ධතිය අලුත් වැඩියාව | 460.00 |
| | 641 | මුදල් භාරකරු | Rw-9992 ට්‍රැක්ටර් ටේලරයේ රෝදයට පැච් එකක් දැමීම | 400.00 |
| | 642 | තරිඳු මෝටර්ස් | SG RX -2006 ට්‍රැක්ටර් ටේලරය අලුත් වැඩියාව | 3150.00 |
| | 643 | P.G.L.C.කුමාර | JU-0022 ට්‍රැක්ටරය අලුත් වැඩියාව | 4100.00 |
| | 644 | එම්.පී.සුසන්ත කුමාර | 52-6699 කැබ් රථයේ අලුත් වැඩියාව | 6500.00 |
| | 645 | විජයසිරි ඉංජිනියරින්ග් වර්ක්ස් | RD -4337 ට්‍රැක්ටරය අලුත් වැඩියාව | 1500.00 |
| | 646 | P.G.L.C.කුමාර | SG PF-7429 ඩබල් කැබ් රථය අලුත් වැඩියාව | 400.00 |
| | 647 | ලේඛා ස්ටේෂනර්ස් | අප්‍රේල් මස පුස්තකාල සදහා පුවත්පත් බිල් ගෙවීම | 17890.00 |
| | 648 | මුදල් භාරකරු | සැලසුම් කමිටු දීමනා | 13000.00 |
| | | H.K.M.H.N.විජේරත්න | සැලසුම් කමිටු දීමනා | 2500.00 |
| | 649 | ලේකම් රඹුක්කන ප්‍රාදේශීය සභාව | වසර 05 වැඩි තැන්පත් ආදායමට ගැනීම | |

| | | | | |
|---|---|---|---|---|
| 2025.06.23 | 650 | මුදල් භාරකරු | 2025.06 මස ස්ථිර සේවක වැටුප් ගෙවීම | 7289858.83 |
| | 650 ii | රංජනි බෙක් හවුස්(W.A.I.S.විජේසූරිය) | සාහිත්‍ය මාස තරඟ සඳහා සංග්‍රහ වියදම් | 13140.00 |
| 2025.06.24 | 651 | උඩුගම එක්සත්වීර ග්‍රාම සංවර්ධන සමිතිය | අරඹහේන සිට කහගොල්ලලන්ද මාර්ගය සංවර්ධනය කිරිම | 69325.00 |
| | 651 ii | ශ්‍රී ලංකා ටෙලිකොම් PLC | කාර්යාල දුරකථන බිල්පත් ගෙවීම | 17105.11 |
| | 652 | පුබුදු වැඩිහිටි සමිතිය | සතිපොළ භූමියේ සෙල්ලම් මිදුල ආරක්ෂිත වැට ඉදි කිරිම | 858290.75 |
| | 653 | මුදල් භාරකරු | එම්.එන්.පද්මසිරි මහතාගේ අතිකාල ගෙවීම | 6986.11 |
| | 654 | මුදල් භාරකරු | එම්.ජී.ඒ.කේ.මැදවත්ත මහතාගේ අතිකාල ගෙවීම | 10142.66 |
| | 655 | මුදල් භාරකරු | එන්.ජී.අජිත් ප්‍රියන්ත කුමාර මහතාගේ අතිකාල ගෙවීම | 7043.51 |
| | 656 | මුදල් භාරකරු | එච්.සී.කේ.හෙට්ටිගොඩ මහතාගේ අතිකාල ගෙවීම | 11589.93 |
| | 657 | මුදල් භාරකරු | එස්.ඩබ්.එස්.ශ්‍රියානන්ද මහතාගේ අතිකාල ගෙවීම | 2515.00 |
| | 658 | මුදල් භාරකරු | ඩී.ඩබ්.ජී.ඒ.සඳරුවන් මහතාගේ අතිකාල ගෙවීම | 6077.92 |
| | 659 | මුදල් භාරකරු | එස්.එන්.නන්ද ශ්‍රී මහතාගේ අතිකාල ගෙවීම | 7100.93 |
| | 660 | මුදල් භාරකරු | එච්.ඩබ්.ඒ.අයි.එල්.විරකෝන් මහතාගේ අතිකාල ගෙවීම | 7100.93 |
| | 661 | මුදල් භාරකරු | ජේ.එන්.එල්.ජයසිංහ මහතාගේ අතිකාල ගෙවීම | 4260.56 |
| | 662 | මුදල් භාරකරු | එස්.ඩබ්.පී.ධර්මසේන මහතාගේ අතිකාල ගෙවීම | 6501.41 |
| | 663 | මුදල් භාරකරු | පී.ගීත් ප්‍රේම ශ්‍රී මහතාගේ අතිකාල ගෙවීම | 6199.35 |
| | 664 | මුදල් භාරකරු | ජී.ඒ.බන්දුසේන මහතාගේ අතිකාල ගෙවීම | 7622.41 |
| | 665 | මුදල් භාරකරු | ජී.ජී.බී.ඒ.කුමාර්මහතාගේ අතිකාල ගෙවීම | 7995.74 |
| | 666 | මුදල් භාරකරු | එස්.ඩබ්.සී.එස්.නන්දන මහතාගේ අතිකාල ගෙවීම | 8493.52 |
| | 667 | මුදල් භාරකරු | එම්.ඒ.එල්.මාලනි මහත්මියගේ අතිකාල ගෙවීම | 2430.00 |
| | 668 | මුදල් භාරකරු | එස්.ජේ.එස්.සමරසිංහ මහතාගේ අතිකාල ගෙවීම | 18227.67 |
| | 669 | මුදල් භාරකරු | කේ.ජී.ධනුක ශ්‍රී මාල්මහතාගේ අතිකාල ගෙවීම | 7290.04 |
| | 670 | මුදල් භාරකරු | එච්.ඒ.සී.එල්.පියසේන මහතාගේ අතිකාල දීමනා ගෙවීම | 12353.00 |
| | 671 | මුදල් භාරකරු | ඩබ්.නලින් පුෂ්ප කුමාර මහතාගේ අතිකාල දීමනා ගෙවීම | 3292.41 |
| | 672 | තරිදු මෝටර්ස් | 52-6699 ඩබල් කැබ් රථය අලුත් වැඩියාව | 57975.00 |
| | 673 | සී/ස රඹුක්කන වි.සේ.ස.සමිතිය | ගරාජය සැදිම කර්මාන්තයේ 10% අතර මැදි මුදල් ගෙවීම | 36790.17 |
| | 674 | ඩී.එම්.ඩබ්.ඩී.බී.දිසානායක | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 5312.98 |
| | 675 | ලේකම්,පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 7462.65 |
| | 676 | කේ.ආර්.චන්දිමා ප්‍රියදර්ශනී | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 910.45 |
| | 677 | ඩබ්.ඩී. එස්.රණසිහ | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 678 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජි ආයතනය | ටෝනර් සැපයීම වෙනුවෙන් ගෙවීම | 127440.00 |
| | 679 | ඒ.කේ.ඩබ්.පුෂ්ප කුමාර | පින්නවල ඇවිදින මංතීරුව සඳහා කසල බඳුන් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම | 3900.00 |
| | 680 | කේ.ඒ.දිනපාල සමාගම | සභාව වෙත අවශ්‍ය විදුලි කේතල සැපයීම වෙනුවෙන් ගෙවීම | 2235.00 |
| | 681 | කේ.ඒ.දිනපාල සමාගම | සභාව වෙත අවශ්‍ය සිවිලිම් විදුලි පංකා සැපයීම වෙනුවෙන් ගෙවීම | 85175.00 |
| | 682 | සුරමායා සෙරමික් | ගබඩාව වෙත අවශ්‍ය ඉබි යතුරු සැපයීම වෙනුවෙන් ගෙවීම | 7600.00 |
| | 683 | චන්ද්‍රසේකර සහ සහෝදරයෝ ප්‍රයිවට් ලිමිටඩ් | ටෝනර් සැපයීම වෙනුවෙන් ගෙවීම | 62855.00 |
| | 684 | චන්ද්‍රසේකර සහ සහෝදරයෝ ප්‍රයිවට් ලිමිටඩ් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 1019.30 |
| | 685 | චන්ද්‍රසේකර සහ සහෝදරයෝ ප්‍රයිවට් ලිමිටඩ් | කී බෝඩ් සඳහා ගෙවීම | 3000.00 |
| | 686 | චන්ද්‍රසේකර සහ සහෝදරයෝ ප්‍රයිවට් ලිමිටඩ් | සභාව වෙත නිල් පැන් සැපයීම වෙනුවෙන් ගෙවීම | 2154.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 687 | පේපර්ලයින් ට්‍රේඩිං ප්‍රයිවට් ලිමටඩ් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 8798.52 |
| | 688 | ලංකා විදුලි බල මණ්ඩලය | අප්‍රේල් - මැයි මස විදුලි බිල ගෙවීම | 125200.54 |
| | 689 | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය | දුරකථන බිල්පත් ගෙවීම | 2271.37 |
| | 690 | ආර්.ජී.එස්.නිරෝෂන් - ලේකම් | අතිකාල ගෙවීම | 14273.00 |
| | 691 | මුදල් භාරකරු | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම | 1000.00 |
| | 692 | මුදල් භාරකරු | පරිසර බලපත්‍ර අධීක්ෂණ කටයුතු සඳහා අප්‍රේල් මස ගෙවීම | 750.00 |
| | 693 | මුදල් භාරකරු | මැතිවරණ දීමනා ගෙවීම | 1140.00 |
| | 694 | මුදල් භාරකරු | පරිසර තාක්ෂණික කමිටු ගෙවීම | 9000.00 |
| | 695 | මුදල් භාරකරු | තැපැල් ඡන්ද රාජකාරි කටයුතු වෙනුවෙන් ගෙවීම | 2500.00 |
| | 696 | එස්. එච්.පෙරේරා | පුස්තකාල සඳහා පොත් මිළදී ගැනීම | 2268.00 |
| | 697 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්ස් | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ රක්ෂණ වාරික ගෙවීම | 11658.71 |
| | 698 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්ස් | ආදාහනාගාරයේ රක්ෂණ වාරික ගෙවීම | 18869.75 |
| | 699 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්ස් | මාර්ගස්ථ මුදල් රක්ෂණ වාරික ගෙවීම | 19844.38 |
| | 700 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | සතිපොළ භූමියේ වාරික මුදල් ගෙවීම | 91207.95 |
| | | | | |

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජ්.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

673 - ගරාජය සැදීම

679 - පින්නවල ඇවිදින මංතීරුව

පින්නවල ඇවිදින මංතීරුව ද, හිරිවඩුන්න ඇවිදින මංතීරුව දෙකම එක නමකින් හඳුන්වනවාද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදහස් කරන්නේ පින්නවල ඇවිදින මංතීරුව යනුවෙන් මොකද පින්නවල සංචාරක ප්‍රදේශය නිසා බව ගරු සභාපතිතුමා පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2025.06.13 දින සිට 2025.06.30 දක්වා උපලේඛන අංක 01 හි සඳහන් වියදම් දැරීම සුදුසු බව තීරණය විය.

**(ඊ)2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

i. අංක 21 බී, උඩුගම, ගොන්දෑවල ග්‍රාම නිලධාරි වසමේ උඩුගම මහවැලි කන්ද, පුංචි වැලිකන්ද ජනපද මාර්ගය අඩි 16 ක් පළලින් යුතු ප්‍රාදේශීය සභා මාර්ගයකි.මෙම මාර්ගයේ එච්.ආර්.සුමිත්‍රා ඒකනායක මහත්මියගේ නිවස ඉදිරිපිට කොටස බැකෝ යන්ත්‍ර යොදා පළල් කර දෙන ලෙස (අයිතිකරුගේ එකඟතාවය ලබා ගෙන ඇත) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත්කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, උඩුගම, ගොන්දෑවල ග්‍රාම නිලධාරි වසමේ උඩුගම මහවැලි කන්ද, පුංචි වැලිකන්ද ප්‍රාදේශීය සභා මාර්ගයේ අඩි 16 ක පළලින් යුතු .එම මාර්ගය එච්.ආර්.සුමිත්‍රා ඒකනායක මහත්මියගේ නිවස අසල බෑවුම් සහිත නිසා එම ස්ථානය කැඩී ගොස් ඇත.නැවත අඩි 08 ක කොන්ක්‍රීට් කර තිබෙන අතර එම මාර්ගය වංගු සහිත නිසා එම මාර්ගය පළල් කර දෙ ලෙස ඉල්ලා සිටින අතර අයිතිකරුගේ අපි මේ වන විට ප්‍රජා මාර්ගයකට කැමති බවට අත්සන් කර ගෙන ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා පවසන ලදි.

ii. උඩුගම, කන්සලගමුව, නියදගල මාර්ගයේ උඩුගම,ශ්‍රී බෝධිරුක්ඛාරාමය අසළ අඩි 60 ක් දිග ආරක්ෂිත බැම්මක් ඉදි කිරීමට අවශ්‍ය වැලි, සිමෙන්ති , ගල් ලබා දෙන ලෙසත් ශ්‍රමදාන පදනමට අප ප්‍රජා මණ්ඩලයෙන් කර්මාන්තය නිම කරන බවත් ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, උඩුගම, කන්සලගමුව, නියදගල මාර්ගයේ ශ්‍රී බෝධිරුක්ඛාරාමය අසල බැම්ම සඳහා මේ වන විට ගමේ දැනපතියන් සමඟ එකරාශි වී පන්සල පැත්තෙන් මාර්ගයට කඩා වැටී ගෙන නිසා බැම්මක් බැඳ ඇත. ඒ බැම්ම අනාරක්ෂිත නමුත් දැන් දෙපැත්තෙන් මාරු වෙන කොට පන්සල කඩා වැටීමක් සිදු වන නිසා මාර්ගවේ අඩි 60 ක් දිග තිබුණත්අඩි 2 ක උස බැම්මකි.එම බැම්ම සඳහා අමුද්‍රව්‍ය ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර ශ්‍රමදාන මට්ටමින් අප ප්‍රජා සංවිධානය මගින් කර ගැනිමට හැකි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා පවසන ලදි.

iii. ගලවා ඉවත් කර ඇති ඉන්ටලොක් ගල් ප්‍රමාණයක් උඩුගම, ශ්‍රී බෝධිරුක්ඛාරාමය ඉදිරිපිට මාර්ගයේ ඇතිරීමට ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර ප්‍රවාහනය, ගල් ඇතිරීම අප ප්‍රජා මණ්ඩලයෙන් කරන බවට ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,රඹුක්කන උඩුගම බස්එක හරවන ශ්‍රී බෝධිරුක්ඛාරාමය ඉදිරිපිට තමයි තිබෙන්නෙ.එම විහාරයට ඇතුළු වන තැන තොරණක් පවති.එහි ඉදිරිපස කොන්ක්‍රීට් කර නැත.දායක සභාව සමඟ සාකච්ඡා කර මෙ යෝජනාව ඉදිරිපත් කරන ලදි.ගලවා තිබෙන ඉන්ටලොක් ගල් ප්‍රමාණයක් තිබෙනවා අපට ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.කොස්සින්න පන්සලේ හා කිරිවල්ලාපිටියෙත් තිබෙනවා.කාර්මික නිලධාරි උපදෙස් මත අවශ්‍ය ඉන්ටලොක් ගල් ප්‍රමාණයක් ලබා ගැනිමට කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

ලයනල් සරත් කුමාර මැතිතුමා කළ යෝජනාව අප ප්‍රජා මණ්ඩලයේ කියන්නේ ප්‍රජා මණ්ඩලයේ නම ද එහෙම නැත්නම් කුමක්ද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

අප ප්‍රජා මණ්ඩලයේ කියන්නේ අපේ නොවෙයි.එක්සත් වීර ප්‍රජා මණ්ඩලය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

නම සඳහන් වුණා නම් හොඳයි. අප ප්‍රජා මණ්ඩලයේ කියනවාට වඩා තුන්වන යෝජනාව ඔබතුමා ශ්‍රමදායකත්වය අනුව කරන්නේ නැත්නම් දෙවැනි යෝජනාව හා තුන්වන යෝජනාව ශ්‍රමදායකත්වය කරන්න හදන්නේ යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ලයනල් මන්ත්‍රීතුමාගේ යෝජනාවේ පොඩි ගැටළුවක් තිබෙන බවත්,ඒක කොහොම වුණත්,ඔබතුමා එහෙම ඉල්ලීමක් කිරීමට අයිතිය කුමක් ද මේකෙ විනිවිද භාවයෙන් කටයුතු වන නිසා ඔතුමාගේ යෝජනාව මම හිතන්නේ සලකා බැලිය යුතු බවයි.එකට අදාළ අයිතිකරුගේ එකඟතාවය ලබා ගෙන ඇති බව.එම එකඟතාවය ලබා දෙන ලෙසත්,ඉතුරු ටික කාර්මික වාර්තාවක් සමඟ කිරීමට බලන්නම් ප්‍රජා මණ්ඩලයට දෙ එක ප්‍රශ්නයක් අපිට ප්‍රසම්පාදන ක්‍රියාවලිය යායුතු වෙනවා.එක ඉතිහාසයේ කොහොම වුණත්,එම ක්‍රියාවලියට බැඳිලා සිටිනවා.සමිතියකට ලබා දුන්නත්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සුදුසු කම් බලා මොකක් හරි ක්‍රමවේදයකට අනුව කරන්න වෙන්නේ.විගණනයට ලක්වෙනවා ඉස්සරත් එහෙම වුණාද නැද්ද මම දන්නේ නෑ.දැන්නුත් විගණනයට අසුවන බව පවසන ලදි..ඒ කමිටුවට සහභාගි වෙන්නේ මමයි අපේ කාර්මික නිලධාරිතුමියයි.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරිතුමියක් මෙය වඩාත් සාධාරණ ලෙස කරන්න හදන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

අප කියන්නේ එක ප්‍රජා මණ්ඩලය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙහි දී අප සඳහන් කර ඉල්ලීම් කිරීම හොඳ නැති බවත්,අප කියන එක ඔබතුමා සංශෝධනය කර ගන්නවාද අපකියන එක නැතුව නම් යෝජනාව ගැන සලකා බැලිය හැකි බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි,අප කියන එක ඉවත් කර ඒකට දාන්න එක්සත් වීර සංවිධානය මණ්ඩලය යනුවෙන්.ඔක වැරදි පූර්වාදර්ශනයක් සියලුම මන්ත්‍රීවරුන් අපි මොකක් හරි ප්‍රාදේශීය සභා යෝජනා ඉදිරිපත් කරනවා නම් මේක දෙන්න ඕනෑ කාටද කියලා කියන්න උදාහරණයක් වශයෙන් මම යෝජනා කරනවා නම් අපේ බොලගම එක්සත් වීර අවමංගල්‍යාධාර සමිතියට දෙන්න කියලා. මං හිතන්නේ මේ ක්‍රමය වැරදිය.මම කණ්ඩායමක් විදිහට එතුමාගේ දෙවැනි හා තුන්වැනි යෝජනාට අපේ විරුද්ධත්වය පළ කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ඔබතුමා පැහැදිල කර ආකාරයට ප්‍රජා මණ්ඩලයෙන් ඉදිරිපත් කරපු එකද වැරදි කියලා සඳහන් කරන්නේ. ශ්‍රමදායත්වයෙන් තමා මේක කරන්නට ඉල්ලන්නේ. ශ්‍රමදායත්වයෙන් හා ප්‍රජා මණ්ඩලයෙන් හෝ කිසියම් සමිතියක් ඉදිරිපත් වෙන්නේ නැත්නම් කොහොමද ඉල්ලුම් කරන්නේ. ඔබතුමන්ලා ප්‍රජා මණ්ඩලයෙන් ඉල්ලිම කිරීම අගෞරවයක් ලෙස සලකනවා නම් ශ්‍රමදායකත්වයෙන් මේ වගේ විදහට සම්පාදන කර ගන්න එක බොහොම වටිනා දෙයක්. මේකද ඔබතුමන්ලා ඉදිරිපත් කරන වැඩ කටයුතු ශ්‍රමදායත්වයෙන් තමා සිදු කරන්නේ. ඒකට චෝදනා කරනවාට වඩා අගය කරන්න එක හොඳ. මේක හොඳ යෝජනාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සියල්ලම හොඳයි. මහජන නියෝජිතයන් විදහට ප්‍රියන්ත මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට මේක නිකන් දෙන්න කියලා නැත. ඒ වැඩි වගකීමක් මට තිබෙනවා ඒක ඉතිහාසයේ කොහොම වුණාද කියලා දන්නේ නෑ.ඒ නිසා මේ යෝජනාව අපි සංශෝධනය කර ගත්තා නම් හොඳයි. ශ්‍රමදාන පදනමෙන් හරි මොකක් හරි අප ප්‍රජා මණ්ඩලයෙන් කිය එක වැරදි බව මන්ත්‍රීතුමා අදහස් කරන්නේ කලේ. යනුවෙන් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

සභාපතිතුමනි,ඒක අපට ගම්වාසීන් ශ්‍රමදානයෙන් කර ගැනිමට සුදානම් ලෙස සඳහන් නම් අපි පිළිගන්නවා. එකේ එක්සත් වීර කියක එක අපේ හරි මොකක් හරි නමක් හින්දා තමා ප්‍රශ්නේ තිබෙන්නේ.අපේ ගම්වාසින් විසින් ශ්‍රමදානයෙන් කිරිමට සුදානම් එතකොට අපිට දෙන්න පුළුවන් සද්භාවයෙන් කරන වැඩක් කියලා.සමිතියෙන් ඉල්ලුම් කරන්නේ නැතිව ගල්පස් ටික සභාවෙන් දෙන්න අපි කරන ලෙස ඉල්ලුම් කරන්න.එතකොට සමිතියෙන් නොවෙයි. ගල්පස් ටික සභාවෙන් අපි වැඩේ කරනවා යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

දැන් කාට හරි අපේ ගමේ වැඩකට ගල්පස් ටික දෙනවා නම් සභාපතිතුමාට දෙන්නට නොහැකි බවත්,මොකක් හරි සමිතියක් හරහා දෙන්න පුළුවන් බව පවසන ලදි.ඒක තමා මේතුමා යෝජනාවෙන් පැහැදිලි කරලා දුන්න බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

යෝජනාව අනුව කියනවා නම් මන්ත්‍රීතුමා සභාවේ මුදලක් වියදම් වියදම් කර ශ්‍රමදාන මට්ටමෙන් අදාළ මන්ත්‍රීතුමාගේ ගමේ යම්කිසි වැඩක් කරනවා නම් අදාළ සමියේ ගිවිසුම් ගත විය යුතු බව පවසන ලදි.අදාළ සමිතිය වන්නේ උඩුගම ග්‍රාම සංවර්ධන සමිතියට හරි, එක්සත් වීර සමිතියට හරි ගිවිසුම් ගත වීමක් කල පසු තමා මේ භාණ්ඩ යවන්නේ.එකට තමා මේ යෝජනාව සභාවට යොමු කර අනුමත කර ගැනිම සිදු කරන්නේ ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ප්‍රජා සංවර්ධන යෝජනාවක් ලෙස මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ.එය නියෝජන වන සේ මෙය ඉදිරිපත් කර ඇති බවත්. එහි වරදක් නොමැති බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

එක වෙන්න පුළුවන් එහෙත් එක දෙවනුව කරන වැඩක් යෝජනාව සම්මත කර ගෙන. කාහටද දෙන්නේ කියන එක ඒ ගිවිසුමට පසුව කරන වැඩක් බවත්,එම නිසා සමිතිය තීරණය කරන එක කරන්න පසුව යෝජනාවට සමිතිය ගෙන එම අවශ්‍ය නොවන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

එතුමා පවසන දේ සත්‍යයි.එතුමාගේ යෝජනාවත් හොඳයි.දැන් පවසන ආකාරයට ඔබතුමාලා සමිතියට ලසු වීම දැම්මම කරන්න අවශ්‍ය දෙයක් නොවෙයි.අපි ප්‍රසම්පාදනයට කර ඊළඟට මිල ගණන් කැඳවීමක් සිදු කර ඉන්පසුව ඔබතුමන්ලා දන්න ආකාරයට සමිතියක් ඉදිරිපත් කර ගම් වාසින් විදහට ඉදිරිපත් වෙන්න.මෙහෙම එකපාරටම සමිතියකට ඉල්ලුම් නොකරන ලෙසත්,මගේ ගමෙත් මාර්ගය සකස් කරනවා.එතකොට මමත් ගල්පස් ටික සමිතියෙන් කරන්න මම ඉල්ලුම් කරන බවත්,මේ හැමෝම පූර්වාදර්ශනයක් කර ගන්නා බවත්, ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මුල සිට අපි කථා කලේ අධිමානය ගැන ඒ වටිනාකම නැතිකර ගැනිම සිදු කර ගන්න එපා.ලයනල් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව හොඳයි එහෙත් අඩුපාඩුවක් තිබෙනවා.එය නිවැරදි කළ යුතුයි.උපසභාපතිතුමා පැවසූ කාරණය නිවැරදිය.ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව කරන්නේ එකට යන්නේ නැතුව අපි මොකුත් කරන්නේ නැති බවත්,එයට වගඋත්තර කර මම නිසා.ප්‍රසම්පාදන ක්‍රියාවලිය ගැන මට හොඳ අවබෝධක් තිබෙනවා මොකද එක මගේ සේවය නිසා.ඔබතුමා කොහොම කීවත්,මම ඒ ක්‍රමය මත තමා වැඩ කරන්නේ මීට පසු යෝජනා ගෙනෙන විට එක එක්කෙනාට දෙන්න කියලා ගෙන්න නොගෙනෙන ලෙස පවසන ලදි.එය දෙවනුව තුන්වනුව තියා ගමු.ඔතුමාගේ යෝජනා ටික සැලකිල්ලට ලක් කරනවා.අඩුපාඩු සකස් කර ගන්නා ලෙසත්, පළමු යෝජනාවට අයිතිකරුගේ ලිපිය ලබා දෙන්න.අපි අනෙක් ටික කාර්මික නිලධාරි සමඟ සාකච්ඡා කර කිරිම බලාපොරොත්තු වන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමනි,දන්න කවුරු හරි වැඩිහිටි සමිතියෙන් යෝජනාවක් ඉදිරිපත් කරනවා මන්ත්‍රී කෙනෙකුට මෙන්න මෙතෙනට ගල්පස් ටිකක් දමලා දෙන්න කියලා අපි මේක සමිතියක් හරහා යන්නේ කියලා එතකොට මම මේ යෝජනාව ගෙනවා කියලා සිතමුකෝ මේකේ ගල්පස් ටික ගිහින් දමන එක නොවෙයි රාජකාරිය එක ශ්‍රමදානයෙන් කර ගන්නා එක අපි යෝජනාව ගෙනවා අපේ වැඩිහිටි සමිතිය හරහා මෙන්න මේකට ගල්පස් ටික ගන්න ඔබතුමාලාගේ අවධානය යොමු කරන්න. යෝජනාවේ තිබෙන අකාරය වැරදි නැති බවත්,පවසන ලදි.ප්‍රසම්පාදන හරි මොනවා හරි ක්‍රියාමාර්ගය ගන්න.මෙය එක පාරට කිරිම හැකියාවක් නැ.හැකියා සහතික,වෙනත් වාර්තා ලබා ගැනිමට වැනි ලොකු වැඩ කොටසක් තිබෙනවා.මට හිතෙන විදිහට නම් උඩුගම එක්සත් වීර එක්ක පෞද්ගලික තරහක් තිබෙන බව හැඟණු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාවේ ගැටළු පවතිනවා. එම ගැටළු සංශෝධනයන්ට යටත්ව කිරිමට සලකා බලන බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

යෝජනා වල ගැටළු සංශෝධනය කර ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

i. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති සියලුම පොදු සුසාන භූමි හඳුනා ගෙන විධිමත් ආකාරයෙන් මායිම් ලකුණු කොට ශුද්ධ පවිත්‍ර කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කරන අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙම යෝජනාව විශේෂයෙන්ම ගෙන එමට අදහස් කරන්නෙ මේ වන විට පොදු සුසාන භූමි විශාල ප්‍රමාණයක් තියෙනවා මේ අතුරින් අපට නුගවෙල, මිරිහාගොඩ,කාඩවට්ටිය ,නත්තඹුර සුසාන භූමි යන ඒවායේ වැට මායිම් කර එම සුසාන භූමි ඉදිරියට ගෙන ඒම හොඳ බව පවසන ලදි. නත්තඹුර සුසාන භූමියේ මේ වන විට මායිම් වල ගැටළුවක් ඇති බවට ගම්වාසින් විසින් කිහිප අවස්ථාවක අපට ප්‍රකාශ කර තිබෙන බවත්,පසුගිය සභාවාර වලදීත් විධ අවස්ථාවලදීත්,මේවායේ සීමා ලකුණු කෙට රැක ගැනිමට යෝජනා කළ නමුත් විවිධ ගැටළු නිසා ඒ අවස්ථාවේදී කර ගෙන යාමට නොහැකි විය.විශේෂයෙන් සඳහන් කරන්න කැමතියි.දොඹේමඩ ,සිල්ලුගල පොදු සුසාන භූමිය ගැන සඳහන් කරන විට ඒ පොදු සුසාන භූමියේ අපිට පර්චස් 48 ක භූමි ප්‍රමාණයක් ලබාදි තිබෙනවා. අධිවේගි මාර්ගය සුසාන භූමිය හරහා යාම නිසා අපිට ඒ භූමිය අහිමි වුණා.ඉදිරියේ දී අපිට ඒකට භූමිය ලබාදී තිබුණත් එහි සීමාව කොතනද කියන එක හඳුනාගෙන නැත. භූමි ප්‍රමාණය පමණයි. භූමි ප්‍රමාණයේ සීමාව කොතනද යන්න තවම අවදානයට යොමු වී නැත.පසුගිය සභාවාරයේ දී අපි මේ පිළිබඳ උත්සහයක් දැරුව බව පවසන ලදි.ඔබතුමන්ලා පසුගිය සමයේ

ස්ථානයට ගොස් ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බවට අපට ආරංචි විය.එය බොහෝම වටින වැඩක් ඒ වගේම මේ ගැන කොට්ඨාශය භාර මන්ත්‍රීතුමිය සිටිනවා.එතුමිය අදහස් පළ කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.මොකද දොඹේමඩ ගම්වාසින්ගේ මෘත ශරීර මිහිදන් කිරිමට ඉඩපහසුව ගැටළුවක් ඇති වී තිබෙනවා.එය ලබා ගෙන ඇති පචර්ස් ප්‍රමාණය වඩා අඩු ප්‍රමාණයක් තමයි දීලා තිබෙන්නේ බලාපොරොත්තු වුණ ප්‍රමාණයටත් වඩා වැඩියෙන් අල්ලාගෙන අධිවේගී මාර්ගයට මුදා හැර තිබෙනවා.අපේ මන්ත්‍රීතුමිය ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි කියලා බලාපොරොත්තු වන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි වී.ආර්.ඊ.නිසංසලා වීර බණ්ඩාර මැතිතුමිය**

අපේ සභාපතිතුමයි,අපේ නදීර මන්ත්‍රීතුමිය,කැලුම් මන්ත්‍රීතුමා මේ සියලුම දෙනා ගොස් පරීක්ෂණයක් කළා එදින මට සහභාගී වීමට නොහැකි වුණ බව පවසන ලදි.ඒ පිළිබඳ අදහස් නදීරා මන්ත්‍රීතුමිය දක්වන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි වී.ආර්.ඊ.නිසංසලා වීර බණ්ඩාර මැතිතුමිය පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ කාරණය බර පතලයි.ඉතිහාසයේ සිද්ධිය මතකනේ අලුත්ම එක තමයි දවස් තුන හතරකට උඩ දී ගහක් කපලා කියලා ඔත්තුවකට ගියේ ගහ සොයා ගැනිම ගිය පසු මෙම ඉඩම සොයා ගත්තා.හෙට දවසේ එයාලා අපට මායිම් කර දෙන බව පවසුවා.පර්චස් හතළිහයි.දොඹේමඩ මාර්ගයයි.අධිවේගී මාර්ගයයි. මැද ඉතිරි කොටස මායිම් කර පෙන්නුවා .මම ඉල්ලීමක් කළා ශුද්ධ කර දෙන ලෙසට.මෘත දේහයක් මිහිදන් කිරිමට පුළුවන් තරමට අලුතෙන් හම්බවෙන්නේ පර්චස් 40 ක ප්‍රමාණයක් මේක අපි කරපු දෙයක් නොවෙයි.ඉතිහාසයේ එකහ වු දෙයක් අපට අසාධාරණයක් වෙලා තිබෙන්නේ දැන් එක කොතනින් පටන් ගන්නට ද කියලා සොයා ගැනිමට නොහැකිය.තිබුණ සුසාන භූමිය අධිවේගි මාර්ගය නිසා කොටස් දෙකකට බෙදිලා එකක් දොඹේමඩ මාර්ගයටත්,අනෙක අධිවේගී මාර්ගයෙන් එහා පැතතෙන් දොඹේමඩ පැත්තට මායිම් සවි කර තිබුණේ.පවරා ගැනිම් වල ලිපි ලේඛන නැත.ඒවා සොයා ගැනිමට වන බවත්,සිල්ලුගල ප්‍රශ්නය අද හෙට සිදු කළහැකි වෙන බවත්,පර්චස් 40 ක්ද 50 ක්ද කියන එන නොවේ. මෘත දේහයක් මිහිදන් කිරිමට පැහැදිලි ඉඩක් තිබුණොත් හොඳ බව ප්‍රකාශ කරන ලදි.ඉන්පසුව එන ප්‍රශ්න බේරා ගෙන පවරා ගැනිමක් සිදු කර ගැනිමට.අක්කර තුනක ප්‍රමාණයක් අපට අහිමි වී ඇත.එකඟතායවක් පමණක් තිබිලා තිබෙනවා.කොස් ගස් විශාල සංඛ්‍යාවක් ඉවක් කර ඇත. ඒවගේ වටිනාකමක් ලැබිලා නැත.2021 යොමු කර ලිපියකට පිළිතුරු ලිපිය ලැබුණේ ඊයේ තමා ඉතිහාසයේ මොකක් හරි වෙලා තිබෙනවා.වර්තමානයේ එය නිවැරදි කරන බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

සුසාන භූමි ගැන ප්‍රකාශ කරන විට පුවක්මොටේ ,යටගම,තිස්මල්පොළ සුසාන භූමි යන සියල්ල වල්ගම කොට්ඨාශයට අයිති ඒවා බව පවසන ලදි.එම සුසාන භූමි ද ශුද්ධ පවිත්‍ර කර මායිම් ලකුණු කර දෙන ලෙසට

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපට රඹුක්කන කොට්ඨාශයේ සුසාන භූමි 65 ක් පවතිනවා.මායිම් කිරිමට සිතියමක් නැති බවත්,මිනිසුන්ගේ ඇසිමට ගිය විට ප්‍රශ්න ඇතිවන බවත්,හරි ලිපි ලේඛන නැත ගැටළු නිරාකරණය කර ගැනිමට පුළුවන් ඒවා පමණක් ශුද්ධ කර ශ්‍රමදාන මට්ටමින් සිදු කර ගෙන යාම ආරම්භ කරන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

මෙම යෝජනාව ගැටළු නිරාකරණය කර ගෙන කිරිමට අනුමත කිරිම තීරණය විය.

ii. නාරම්බැද්ද,යටගම ප්‍රදේශ යා කරමින් මා ඔය හරහා ඉදි කිරිමට යෝජනා වී තිබූ පාලම නැවත ඉදිකිරිමට ඇති හැකියාව සොයා බලා ඉදිකිරිමට සඳහා අවශ්‍ය කටයුතු සම්පාදන කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

අපේ සභාවේ නොවුණත් ප්‍රදේශයේ මහජනතාවගේ සුභසිංසනය සඳහා මේ යෝජනාව ඉදිරිපත් කලේ.නාරම්බැද්ද ,යටගම ප්‍රදේශය යා කරන පාලම අවුරුදු 15 කට පෙර මුල් ගල තබා ඉදිකිරිම් ආම්භ කර ඇත.මේ යෝජනාව ගෙන ඒමට හේතුව පනලිය දුම්රිය මාර්ගයට සම්බන්ධ විමට පුළුවන් විම

නිසා.ඒ වගේම අධිවේගී මාර්ගය ඉදි කිරිම මගින් ඒ හරහා ගමන් කිරිමට හැකි කෙටි මාර්ගයක් විමත්,මේක ක්‍රියාත්මක කිරිමේදී ප්‍රායෝගික ප්‍රශ්න තිබෙනවා කියලා මම හිතනවා.මේ ගැන සොයා අපිට සභාවක් විදිමට සිදු කිරිමට පුළුවන් දෙයක් පවති නම් ඒ සඳහා අපි ඉරිදිපත් විමක් වෙමු.ඒ පිළිබඳ මා උනන්දු වෙන් සිටින බවත්,පවසන ලදි.මහා මාර්ග අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කර මෙය කිරිමට ඔබතුමාගේ අවධානය යොමු කරයි කියලා සිතන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

මම නාරන්බැද්ද ප්‍රාදේශීය සභා මන්ත්‍රී වශයෙන් සිටින කාලයේ මේ සඳහා අපි පළමුව වැඩ කටයුතු කිරිමට මහා මාර්ග අමාත්‍යාංශය මගින් මැනුම් කටයුතු කළ බවත්,අදාළ ස්ථානය පරීක්ෂා කර අනුමත කර ඇති බවත්,සභාවක් හැටියට අපට මහා මාර්ග අමාත්‍යාංශය දැනුවත් කර එය ක්‍රියාත්මක කිරිමට යෝජනා කරන ලෙස ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **පී**.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙය කාලෝචිත යෝජනාවකි.කලිනුත් පැවති බවත්,එය කිරිම සලකා බලන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව කිරිමට අනුමත කිරිම තීරණය විය.

iii. C.T.B බස් නැවතුම්පල හා ඒ අවට භූමිය අදාළ ආයතනයන් සමඟ සාකච්ඡා කොට ප්‍රතිසංස්කරණය කටයුතු සුදානම් කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ඇත්තෙන්ම කියනවා නම් C.T.B බස් නැවතුම්පල අදාළ ප්‍රදේශයේ අපට අමුතු දෙයවක් නොවන බව පවසන ලදි.මේ සභාවට, ඉංජිනේරු කාර්යාලයට අයිති ද නැත්නම් මාළිගාවට අයිති ද කියන එක අදාළ නැති බවත්,සේවාව සපයන එක තමා හොඳ බවත්.මහජනතාව වෙනුවෙන් සිටිනවා නම් අපි ඒ ගැන කථා කිරිමට අවශ්‍යයි.නමුත් පසුගිය කාලයේ මෙය ප්‍රතිසංස්කරණය තිරිමට විවිධ අවස්ථාවලදී උත්සහ ගෙන තිබුණත්,නාගරික සංවර්ධන අධිකාරිය මගින් සාකච්ඡා කර ඒ වගේම C.T.B එක සමඟ විවිධ අවස්ථාවලදී සාකච්ඡා කර ඇත.මමත් එම සාකච්ඡා වලට සහභාගි වුණා. නමුත් එය ක්‍රියාත්මක කර ගැනිමට හැකියාවක් ලැබුණේ නැති බවත් පවසන ලදි.වාර්තමාන රජය මැදිහත් වී කඩිනමින් එම භූමිය පිළිසකර කරන බව සාකච්ජාවක් කළ බව මට ආරංචි වී තිබෙනවා.එක බොහොම අගය කොට සලකනවා.ඔබතුමාගේ මැදිහත් විමෙන් මෙය කඩිනමින් සිදුකර දෙන ලෙස ඉල්ලා සිටින බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම සභාවට මම ආධුනික මන්ත්‍රීවරයෙක් ලෙස පැමිණි අවස්ථාවේ මාගේ පළමු වැනි යෝජනාව ඔය යෝජනාවයි.ඔබතුමන්ලා දැන් එක නැවත මට භාර දෙනවා.මන්ත්‍රීතුමන්ලා අපි එකට යෝජනාවක් යවලා තියෙන්නේ.එතකොට දැන් රථ වාහන පාලනය කරන එකයි.ඔය ප්‍රශ්නය දියුණු කරන එකයි. ගත්තාම අපි මාර්ග සංවර්ධන අධිකාරිය ,විධායක ඉංජිනේරු කාර්යාලය,ඩිපෝ අධිකාර්ය කාර්යාලය හා පෞද්ගලිකව එකතු වෙලා මේ යෝජනාවට එකහව ඇස්තමේන්තු සකස් කර තිබෙනවා.අපි ඒක කඩිනමින් කර ගැනිමට උත්සහ කරන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
C.T.B බස් නැවතුම්පල ප්‍රතිසංස්කරණ කිරිම අනුමත කිරිමට තීරණය විය.

iv. පුද්ගලික බස් නැවතුම්පල ඉහළ මාලයේ ඇති කඩකාමර හා ගැටලු පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සූදානම් කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා පී.ජී.කිත්සිරි සුමනරත්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මෙම යෝජනාව කිහිප අවස්ථාවලදී සභාවට ඉදිරිපත් වුණා.මම මේ යෝජනාව නැවත ඉදිරිපත් කිරිමට අදහස් කලේ.මෙහි තිබෙන අඩුපාඩු පෙන්වා දීම.ඒ වගේම කඩකාමර වල දැනට තිබෙන ව්‍යාපාර වල විවිධ අවශ්‍යතාවයන් මතු වී තිබෙනවා.උදාහරණයක් වශයෙන් ගත්තොත් මේ ප්‍රශ්නය නම් රඹුක්කනටම බලපා තිබෙන ගැටළුවක් විදිහට අපට ආරංචි වී ඇත්තේ.පෞද්ගලිකව පවත්වාගෙන යන සැලුන් වල හිස කෙස් ඉවත් කිරීමේදී ගැටළුවක් ඇති වී තිබෙනවා.මම හිතන්නේ මේක සෞඛ්‍ය ප්‍රශ්නයක් පසුගිය කාලයේ සභාවේ කුණු ලොරි වලට ලබා මෙම හිස කෙස් ලබා ගැනිම සිදු වුණේ නැත.නමුත් වර්තමානයේදී එහෙම නොකරයි හිතනවා.මේක සෞඛ්‍ය ගැටළුවක් නිසා.ගිවිසුම් වල පොරොන්දු වෙලා අයතන වල අය පෞද්ගලිකව බැහැර කරන බවට.නමුත් දැන් එය ප්‍රායෝගික ගැටළුවක් වී ඇත.උදාහරණයක් විදිහට ගත්තොත් එහෙම බැද්දවල කෙනෙක් මෙහෙ සැලුන් එකක් කරනවා නම් හිස කෙස් බැද්දවලට අරන් යන එක අපහසු කරුණකි.අපි ජනතා නියෝජිතයක් විදිහට මේ අයට සහන සපයන්න තමයි ඇවිත් සිටින්නේ.මේකට නිසි වැඩ පිළිවෙලක් අපිට සාකච්ඡා කර ගෙන කිරිමට පුළුවන් නම් වටිනවා.විශේෂ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම ක්‍රියාත්මක කරමින් මෙම හිස කෙස් වෙනම එකතු කිරිමට හැකියාවක් තිබෙන බවට මම විශ්වාස කරනවා.විශේෂයෙන්ම ව්‍යාපාර පිරිසක් කළ ඉල්ලීමක් විදිහට තමා මේක ඔබතුමාට ඉදිරිපත් කලේ.මේ සඳහා ගරු සභාවේ අවධානය විශේෂයෙන් යොමු කරන ලෙස ඉල්ලා සිටින බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පෞද්ගලික බස්නැතුම් පළෙහි ඉහළ මාලයේ ලොකු ප්‍රශ්න ටිකක් තිබෙනවා.ඉදිකිරිම් එක්ක නැවති ඇත.පසුගිය සඳුදා අපි ව්‍යාපාර මහතුන් දෙදෙනෙක් එක්ක පොඩි එතකඟතාවයට පත් වුණා.කඩකාමර විවෘත කිරිමට ඒ අයගේ පොඩි ඉල්ලීම් කිහිපයක් තිබුණා.ඒවා සියල්ල ඉෂ්ට කර ගැනිමට ඊළඟ 15 වැනි දිනය සාකච්ඡා කිරිමට ඇත.ඒ සඳහා අපේ පළාත් ඉංජිනේරුතුමාත් පැමිණෙනවා.එතුමාගෙත් උපදෙස් ලබා ගෙන ඒ උපදෙස් එක්ක එකඟතාවයකට ඇවිත් අපි එක ක්‍රියාත්මක කිරිම සිදු කරනවා.ඒ වැඩේ කර ගැනිමට හැකි වෙයි කියලා සිතනවා.ඊළඟට හිස කෙස් ප්‍රශ්නෙත් තිබෙනවා.එක පරිසර කමිටුවේ සාකච්ඡා කර ගනිමු.මෙකට පුද්ගලික විසඳුමක් දෙන්න වන මේ ගැන නිසා පුළුල්ව කථා කිරිමට අවශ්‍ය වන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
පුද්ගලික බස් නැවතුම්පලෙහි ඉහළ මාලයේ තිබෙන ගැටළු නිරාකරණය කිරිමට තීරණය විය.

v. සියලු සභා මාර්ග අනුමත සීමාවන් (මාර්ගයේ පළල )ලකුණු කර මායිම් කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ ගැටළුව රඹුක්කන ආසනය පුරා පමණක් නොව ලංකාව පුරාම පවතින ගැටළුවකි.අඩි 10 ක මාර්ග තිබුණත්, එම මාර්ග අඩි 08 ට කොන්ක්‍රීට් කිරීම නිසා කාලයක් යන විට මිනිසුන් අඩි 08 ප්‍රමාණයට වැටවල් සකස් කිරීම සිදු කරනවා.එක මිනිසුන්ගේ ආකල්පයකි.විශේෂයෙන් වෙල්යායවල් වල තිබෙන මාර්ග වල දී කුඹුරු හිමියන් විසින් මාර්ගය දෙපස කපා මාර්ගය ළඟට ගෙන එනවා.වාහන යන විට විවිධ හේතුන් නිසා මාර්ගය කඩතොළු වී කැඩී යාම සිදුවන බවත් පවසන ලදි.ඒ නිසා අපි විශේෂයෙන් මායිම් ලකුණු කිරීම සිදු කිරීමට යෝජනා කරන අතරම ඔබතුමන්ලාගේ විශාල වැඩපිළිවෙලවල් තිබෙනවා.පක්ෂයක් විදිහට ඒ පකෂය හරහා හරි අපට පුළුවන් වෙයි කර ගැනීමට. එම මායිම් ලකුණු කර ඒවා නිසි අයුරින් නඩත්තු කරගෙන යන්නට හැකියාව තිබෙන නිසා මේ යෝජනාව ඉදිරිපත් කළ බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපි එකත් ක්‍රියාත්මක කරමු. කිසිම කෙනෙකුගේ විරුද්ධත්වයක් නැති බව පවසන ලදි. එසේ නොමැති බව ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

මාර්ග වල මායිම් නිසිපරිදි ලකුණු කිරීම අනුමත කිරීම තීරණය විය.

vi. ගල්කරුවත්ත හා කාඩවට්ටියවත්ත කොටස සඳහා ප්‍රජා ජල ව්‍යාපෘතිය 02 ක් ඉදිකිරීමට සුදුසු බවට යෝජනා කළ අතර එම යෝජනා පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගල්කරුවත්ත හා කාඩවට්ටියවත්ත ප්‍රදේශ පවතින්නේ වහව පාලමෙන් එහා ජල සම්පාදන මණ්ඩලය මගින් ලබා දෙන ජල මාර්ග ගමන් කරන්නේ නැති නිසා උග්‍ර ජල ගැටළුවකට පත්ව තිබෙනවා.පායන කාලවලදී විශේෂයෙන් ගල්කරුවත්ත, කාඩවට්ටියවත්තයන ප්‍රදේශ වලට අපිට පුළුවන් ප්‍රජා ජල ව්‍යාපෘති ඉදිකිරීමට.ඒ වගේම මේ ගැටළුව දඹුල්ල,දොඹේමඩ, ප්‍රදේශවලටත් මේ ගැටළුව විශාල වශයෙන් තිබෙනවා.දැනට දොඹේමඩ ප්‍රදේශයේ ජල ටැංකියක් ස්ථාපනය කර තිබෙනවා.ඒ වගේම ගල්කරුවත්ත කියන ප්‍රදේශ මේ සඳහා ස්ථානයක් පවති.එම ස්ථානය ප්‍රජා ජල ව්‍යාපෘති වලට භාවිතා කිරීමට පුළුවන.ලොකු ළිඳක් සකස් කර ඒ හරහා ජලය ලබා දී ජනතා සේවයක් සපයන්න පුළුවන්. .ඒ වගේම කාඩවට්ටියවත්ත ප්‍රදේශයේ මේ ගැටළුව උග්‍රව පවතිනවා.ඒ සඳහා අපි විවිධ අවස්ථාවලදී විවිධ උත්සහයන් දැරුවා මේ සඳහා.ගරු ඇමති සනත් නිශාන්ත මැතිතුමා සිටින කාලයේ මමත් යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා.එම යෝජනා සාර්ථකව ගමන් කරන අවස්ථාවේදී රටේ තිබුණ ප්‍රශ්න එක්ක එම යෝජනා ක්‍රියාත්මක කර ගැනිමට අපොහොසත් විය.කනක හේරත් මැතිතුමා විශේෂ අවදානයක් තිබුණා නිසා එම යෝජනා ඉදිරිපත් වුණා. එසේම දොඹේමඩ, ගල්කරුවත්ත, හා කාඩවට්ටියවත්ත ප්‍රදේශ වලට ජලය ලබා ගැනිමට උත්හයක් දරුවා.වර්තමානයේ සභාව හරහා එන ප්‍රජා මුල ව්‍යාපෘති දෙකක් ඉදිකිරීමට හැකියාවක් තිබෙන බවත්,ඒ සඳහා මෙම සභාවේ අවධානය යොමු කරන බව මම විශ්වාස කරනවා.කලින් යෝජනාවේ සබරගමුව පළාත් සභාවේ ජල ව්‍යාපෘති වගයක් ඇවිත් බවට ද අපට දැන ගැනිමට ලැබුණා. ගරු සභාපතිතුමනි, ජල ව්‍යාපෘති ඇවිත් තිබෙනවා නම් අපටත් දෙන එක නම් හොඳයි.මිනිස්සුන්ට ජලය වැදගත් ආහාර සපයා ගැනිමට ,මුලික අවශ්‍යතා ඉටු කර ගැනිමට ජලය අවශ්‍ය වේ.මේ සඳහා සභාවක් විදිහට මැදිහත් වෙයි කියලා සිතන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මම ඔය ප්‍රශ්නයට මැදිහත් වීමට ගිය විට ජල මූලාශ්‍ර කිහිපයක් හමුවුණා.ඒවා බිම් ජලය නොවන බව පවසන ලදි.ඒ වෙලාවේ යෝජනා කිරිමට අවස්ථාවක් තිබුණේ නැත.ඔබතුමා කළ යෝජනාව පිළිගෙන අපි එය කාර්මික කමිටුව වෙත යොමු කර ඔබතුමා සම්බන්ධ කර ගෙන ව්‍යාපෘති වාර්තාවක් සකස් කර කිරිමට අදහස් කරන බව පවසන ලදි.නැත්තම් වෙන්නේ යෝජනාවක් විතරයි.ප්‍රතිලාභීන් කොපමණ ද යන්න සඳහන් කර ව්‍යාපෘති වාර්තාව සකස් කිරිම අවශ්‍යයි.උපාලි රෝහණ මන්ත්‍රීතුමාට ඒ යෝජනාව ඊළඟ කමිටුවට යොමු කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ව්‍යාපෘති වාර්තාව සකස් කර කාර්මික සේවා කාරක සභාව කමිටුවට ඉදිරිපත් කිරිම අනුමත කිරිම තීරණය විය.

**(ඊ)4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

i. ඉඹුල්ගස්දේණිය මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ තුන්වන මහල සැලැස්මේ පරිදි සාදා නිම කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මේ යෝජනාව මම ඉදිරිපත් කිරිමට අදහස් කලේ රඹුක්කන ප්‍රාදේශිය සභාවේ පුස්තකාල දෙකක් තිබෙනවා.එකක් ඉඹුල්ගස්දෙණිය පුස්තකාලය එහි පහල මහල දැනට සෞඛ්‍ය කටයුතු සඳහා භාවිතා කරන ලදි.දෙවැනි මහලේ තමා පුස්තකාලය පවත්වා ගෙන යනු ලබන්නේ.සාමාජිකයන් 1650 ක් පමණ සිටිනවා.දැනට ක්‍රියාකාරි සාමාජිකයක් 300 ක ප්‍රමාණයක් සිටින බව පවසන ලදි.තුන්වන මහල සඳහා ආම්භයේදී දමන ලද කොන්ක්‍රීට් එක තමා තිබෙන්නේ.එය නිම කර නොමැති බැවින් කොන්ක්‍රිට් එකෙන් පුස්තකාලයට වතුර වැටෙන බවත්,ඒ වගේම පුස්තකාලයට පොඩි අඩුවක්ව පවතිනවා එහි ස්භාවය .එම ස්භාවය අනුව පුස්තකාලය පරිහරණය කරන පිරිස අඩු බවක් පෙනි යනවා. පුස්තකාලය පරිහරණය කිරිම හොඳ දෙයක් දැන් සමාජ මාධ්‍ය විශාල ප්‍රමාණයක් පරිහරණය කරන්නේ.එම නිසා මම උත්සහයක් දැරුවා එහි පෙනුම වෙනස් කර පුස්තකාලයට සාධාරණටක් ඉෂ්ට කිරිමට.ඒ නිසා මම පළමුව ඉදිරිපත් කරන්නේ ගොඩනැගිල්ල සම්පුර්ණයෙන් ගලවා ඉවත් කර සකස් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

අපේ ආසනයේ තිබෙන විශාල සම්පතක් තමා ඉඹුල්ගස්දෙණිය පුස්තකාලය භූමිය හා පුස්තකාලය එක ප්‍රධාන අමාත්‍යය ගරු මහීපාලමැතිතුමා සිටින කාලයේ ගොඩනැගිල්ල මහල් දෙකක සාදන ලදි.ඔබතුමාගේ මේ යෝජනාවට මම එකඟ වෙනවා.ඊළඟ මහල අත්‍යවශ්‍යයි මොකද උඩින් වතුර දෙවැනි මහලට එන නිසා පසුගිය කාලවලදිත් යෝජනා කළ බව පවසන ලදි.මේ සඳහා යම්කිසි වියදම දරන්නේ නම් විශාල අදායමක් ලබා ගැනිමට පුළුවන් බවත්,තුන්වන මහල සකස් කිරිම හැදුවේ එහි රැස්විම් ශාලාවක් දැම්මට හා උත්සව ශාලාවක් සඳහා.ඔබතුමා මේ ගැන අවධාන යොමු කර මෙය සකස් කර දෙ න ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මගේ පළමුවැනි සංචාරය තිබුනේ ඉඹුල්ගස්දෙණිය පුස්තකාලය.එක මම උපාලි රෝහණ මන්ත්‍රීතුමාට වගකිම භාර දෙනවා. ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා පැවසුවා වගේ මෙය අපිට කුලියට දීම

පුළුවන්ය.මංගල උත්සවයකට ගැළපෙන පරිදි සකස් කර ගැනීම සුදුසු බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ඉඹුල්ගස්දෙණිය මහජන පුස්තකාල ගොනැඩගිල්ල සකස් කිරිමට අනුමත කිරීම තීරණ විය.

ii. ළමා උයන නවීකරණය සඳහා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

මම අදහස් කලේ මේය භාවිතා කරන ප්‍රමාණය හරි අඩුයි.එයට හේතුව පරිසරයේ ඇති ස්වභාවය නිසා වෙන්න ඇති බවත්,ඒ නිසා සියලු අංගෝපාංග යොදලා ළමයින්ට භාවිතා කිරීම හා ප්‍රදේශයේ පෙර පාසල් වල ළමයින් සඳහා විවිධ ක්‍රියාකාරකම් කිරීම සුදුසු ස්ථානයක් බවට පත් කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම රාජකාරිය අයිති ඔබතුමාට නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ සභාපති ඔබතුමා නිසා ව්‍යාපෘති වාර්තාව ගෙවිත් ඊළඟ සභාවේදී එම ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කර ඔබතුමන්ලාගේ අදහස් එකතු කර ගෙන කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ළමා උයන සකස් කිරිමට තීරණය විය.

iii. පෙර පාසල හා ළමා සුරකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

මම මේ යෝජනාව ඉදිරිපත් කිරිමට අදහස් කලේ.පුස්තකාලය නවීකරණය කිරීම මුදල් වියදම් කරලා කරන වැඩක් නිසා සභාවට ආදායමක් ලබා ගැනිමට පුළුවන් වන ආකාරයට ළමා උද්‍යානය හා පෙර පාසල් ඇති කිරිමට සුදුසු බව ද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

මෙම පුස්තකාලයේ පෙර පාසලක් තිබුණු බවත්,එය අක්‍රීය වී ගිය බව පවසන ලදි.මෙහි පෙර පාසලක් කර ගෙන යනවා නම් හොඳයි.රඹුක්කන ආසනයේ පෙර පාසල් දෙකක් තිබුණත් මෙහි එකක් කරන්නට පුළුවන්.මේක ද ග්‍රාම නිලධාරී වසම් 6,7 ක් තිබෙන නිසා.සභාවේ යෝජනාවක් හැටියට අපි මේක කරමු. යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාවෙත් අයිතිකරු ඔබතුමා නිසා කර ගෙන යන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
පෙර පාසලක් හා ළමා උද්‍යානයක් ඉදිකිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

i. සූරියපුර ක්‍රිඩාපිටිය පිහිටි ඉඩමේ 30*10 ග්‍රාමීය ආර්ථික මධ්‍යස්ථානයක් ඉදි කිරිමට(ප්‍රධාන පාරට මුහුණු ලා) සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී. ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

සූරියපුර ක්‍රිඩාපිටිය සභාවට අයිති ඉඩමකි.ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම අනුව ඒ තුළ කෘෂි භෝග වෙළදාම් කිරිමට හැකිවන පරිදි අඩි 10 ක් පළල අඩි 30 ක් දිග ප්‍රවේශ මාර්ගයට යාබදව සකස් කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත.කණු සකස් කර කොන්ක්‍රීට් කර දිම ප්‍රමාණවත් බව ජනතාව පවසන ලදි.ප්‍රදේශයේ කෙසෙල් වගාව,කෘෂි භෝග කරන අය හා ඇදුම් කර්මාන්තය නියැලි සිටින අයගේ ඉල්ලීම පරිදි හා ග්‍රාමීය ජනතාවගේ අහාර වෙළදාම් කිරිමට හෙළ බෝජුන් හලක් දැමීමට ද ඉල්ලීම් කර ඇත.ඒ අනුව මෙම යෝජනාව ඉදිරිපත් කරන ලදි.නාරම්බැද්ද කොට්ඨාශයේ ජනතාවට කරන දෙයක් බැවින් මම ඉල්ලීම් කර සිටිනවා අපේ මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලබා දෙන ලෙසටත්.ග්‍රාම සංසදයෙන් කථා කර පැවසුවේ රුපියල් ලක්ෂ දෙකක තුනක වියදම් යන බවත්ය. ඒ අනුව ඇස්තමේන්තුවක් සකස් කර මෙන් දන්වා අතර මෙය ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නංවාලිමට හොද වැඩසටහනක් ලෙස සැලකිමට පුළුවන් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී. ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මේ යෝජනාව හොඳයි.ඔය ඉඩම් කුඹුර මම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවෙලා සිටින කාලයේ මේ ඉඩම L.R.C.එකට අයිතිව තමා තිබණේ.ඒ කාලයේ ගැටළුවක් වුණා සභාව සතු නොවුණ ඉඩමකට සභවේ මුදල් යොදවිම. එම නිසා L.R.C .එකෙන් පචර්ස් 20 ක් ඉල්ලිමක් කර පවරා ගෙන ඒකෙ සමිති ශාලාවක් ඉදිකළා නිලධාරි තුන්දෙනෙකු සඳහා සිටිමට පුළුහන් ආකාරයට එක නිසා මෙම යෝජනාවහොඳයි.එකේ වැඩ කටයුතු කර ගැනිමට පුළුවන්.පවරා ගැනිමක් සිදු කිරිමටත් පුළුවන්ය.එම ප්‍රදේශයේ සිටින්නේ වගාකරන පිරිසක් නිසා වෙළදාම් කිරිමට වුණත් සුදුසුය.මේ සඳහා අවධානය යොමු කර මෙය ක්‍රියාත්මක කරක ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ **මැතිතුමා**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දැන් එක L.R.C.එකෙන් නිදහස් කරලාද තිබෙන්නේ.අපිට පවරලා දන්නේ නෑ යනුවෙන් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

පර්චස් 20 ක් නිදහස් කරලා තිබෙන බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපි එහෙනම් එකත් කාර්මික කම්ටුවට යොමු කර වෙනත් මන්ත්‍රීතුමන්ලා දෙන්නෙක් සම්බන්ධ කර ගෙන අපි කරමු ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
කාර්මික කම්ටුවට යොමු කර ක්‍රියාත්මක කිරිම අනුමත කිරිම තීරණය විය.

ii. රඹුක්කන ,පොල්ගහවෙල මාර්ගයේ තුනේකන්ද අබලන් වී ඇති පානීය ජල ටැංකිය අලුත්වැඩියා කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී. ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

මෙම ජල ටැංකිය හිටපු උප සභාපතිතුමා වන ගරු නිමල් ජයවීර මැතිතුමා විසින් පිළිසකර කර දී තිබෙන්නේ.එය ස්වභාවික ජල මාර්ගයක් සම්බන්ධ කර ගෙන ප්‍රධාන මාර්ගයේ ඉදිකර ඇත.මෙය සියලුමදෙනාගේ පිපාසය සංසිඳීලිම සඳහා හොඳ දෙයක්ය.ඇත්තටම ඒ අවට කඩයක් වැනි කිසිම දෙයක් නොමැති නිසා එය ප්‍රයෝජනවත්ය.ඩිලිවරි කරන අය කැමබීම කන්නේත් එම ස්ථානයේ නිසා එම ජල ටැංකිය අබලන් වී ජලය අපතේ යන බැවින් මෙම ජල ටැංකිය අලුත්වැඩියා කරන එක හොඳය.හැමෝටම පොදු ස්ථානයක් නිසා සංවර්ධනය කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී. ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පාර කැඩුණු තැන තිබෙන ජල ටැංකිය ද? යනුවෙන් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ජල ටැංකිය අලුත්වැඩියා කිරිම අනුමත කිරිම තීරණය විය.

iii. නාරම්බැද්ද,නැගෙනහිර කරදගස්තැන්න ප්‍රජා ශාලාවේ ඉතිරි වැඩ නිම කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ආර්.ප්‍රදිපා රංජනී මැත්තුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී. ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

මේය නාරම්බැද්ද,නැගෙනහිර කරදගස්තැන්නට අයිති ප්‍රජා ශාලාවක් එහි වහලය ගසා ගොඩනැඟිල්ල ඉදිකර තිබෙන්නේ.වටේ කපරාදු කර ගැනිමට තිබෙන බැවින් ඒ ගැන සලකා බලා කටයුතු කරන එක හොඳ බව **ගරු ප්‍රාදේශීය සභා** මන්ත්‍රීනී ජී. ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපට අයත් ගොඩනැඟිල්ලක් ද?එහෙනම් ගැටළුවක් නැති බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාල ගොඩනැඟිල්ලේ ඉතිරි වැඩ නිම කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

i. අප ප්‍රාදේශය සභාවට ලොකු අඩුපාඩුවක් වන ගිනි නිවීමේ ඒකකයක් ලබා ගැනිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා විසින් ස්ථිර කිරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.මල්ලිකා මැතිතුමිය**

අප ප්‍රාදේශය සභාවට ලොකු අඩුපාඩුවක් වන ගිනි නිවීමේ උපකරණයක් නොව ගිනි නිවීමේ ඒකකයක් ලෙස නිවැරදි කරන ලදි.ගරු සභාපතිතුමනි,මීට පෙර සභාවට මම මේ යෝජනාව ගෙන එමට හදන විට ලේකම්තුමිය විසින් පැවසුවා අපි එකක් ගැනිමට තමයි සිතාගෙන සිටින්නේ කියලා එම නිසා මම මේ යෝජනාව ඉදිරිපත් කලේ නැත.නමුත් මේ වෙනකල් නැති බව ප්‍රකාශ කළා.මේකට විශාල මුදලක් යන වැඩක් බවත්,මාවනැල්ලේ පමණක් තිබෙන බවත්,කෑගල්ලේවත් නැති නිසා හදිසි අවස්ථාවකදි ගෙන්නා ගැනිමට අපහසු බව පවසන ලදි.මාවනැල්ලේන් ගෙන්වා ගැනිමට සිදුවන බවත්,එම නිසා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදි.සභාවේ මුදල් නොමැති නිසා මුදල් තිබෙන අවස්ථාවක හරි මෙවැනි දෙයක් ලබා ගන්නේ නම් හොඳ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

පී.ජී.මල්ලිකා මැතිතුමිය ඉදිරිපත් කළ යෝජනාවට මමත් අදහස් ඉදිරිපත් කරනවා නම් හොඳ බව පවසන ලදි. මාවනැල්ල හා කෑගල්ල අතර ගිනි ගැනිමක් සිදු වුණෝත් ඒ සඳහා මෙය අවශ්‍ය දෙයක්ය. ගිනිවිමේ ඒකකයක් නොමැති වීම ලොකු අඩුපාඩුවක් බවත් පවසන ලදි.ඔබතුමාට හැකියාව තිබෙනවා නම් පළාත් සභාවෙන් හරි ඉල්ලීමක් සිදු කර මෙම ගිනි නිවිමේ ඒකකයක් ලබා ගැනිමට කටයුතු ලෙසත්,ඒ නිසා මෙම යෝජනාව සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මල්ලිකා මැතිතුමියගේ අදහසට මමත් කරුණු ටිකක් සඳහන් කරන්නම්.මේ ප්‍රදේශයේ

අපිට ගිනිනිවිමේ ඒකකය අවශ්‍ය දෙයක් මොකද දැනට අවුරුදු තුනකට කලින් වගේ රඹුක්කන නගරය රාත්‍රියේ ගිනි ගැනිමක් සිදු වුණා.ඒ අවස්ථවේදී මම කුරුණෑගලට හා මාවනැල්ලට කථා කර ගෙන්නුවා එහිදී මාවනැල්ලේ වාහනයේ ධාරිතාවට මදි.කුරුණෑගලට කථා කර තිබුණු නිසා දෙකම භාවිතා කර ගෙන ගින්න මැඩපැත්තුවා.වත්මන් ආණ්ඩුවේ පළාත් සභාව දැනුවත් කර හරි අපිට වාහනයක් ලබා ගන්න.මම 2011 වර්ෂයෙන් පසු මේ සභාව නියෝජනය කලේ ඒ අවස්ථාවේදීත් මෙම යෝජනාව දැම්මා මේ වෙන කම් එය ඉෂ්ට වී නොමැත.ඒ නිසා මම යෝජනා කරනවා යම්කිසි ආපදා අවස්ථාවේදී වෙන ආයතන වලට දැනුම් දීම සිදු වෙනවා.ඒ නිසා ගිනිනිවිමේ වාහනයක් සභාව මඟින් ලබා ගැනිමට වත්කම නැතිනම් පළාක් සභාවෙන් හෝ මධ්‍යම ආණ්ඩුවෙන් හරි සිදු කර දෙනවානම් හොඳ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එක හරි අපි පිළිගන්නවා.මේක ලොකු අඩුපාඩුවක් ඒ ගිනි නිවීමේ ඒකකයක් ලබා ගැනිමට ක්‍රියාත්මක වෙන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

ගිනිනිවීමේ ඒකකයක් ලබා ගැනිමට කටයුතු කිරිම අනුමත කිරිම තීරණය විය.

ii. සංචාරක කලාපය දියුණු කිරිම සඳහා පදවිගම්පල පිහිටා ඇති පැරණිතම ගල්මැස්ස,කැලැඳඹුල්ලලේ රජමහ විහාරය,දැලිවල කොටවෙහෙර යන ස්ථාන දියුණු කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය**

ගරු සභාපතිතුමනි,මෙම ගල් ඇන්ද ඉතිහාස ගත වී තිබෙන ගල් මැස්සක් මෙම පදවිගම්පොළ ගල් මැස්ස මීට පෙර නිශ්ශංක විජේරත්න මැතිතුමා සංස්කෘතික ඇමති වශයෙන් සිටින කාලයේදී මේ ගල් මැස්ස දියුණු කිරිම ආරම්භ කරන ලදි.මේ ගල්මැස්ස සම්බන්ධයෙන් තිබෙනවා රක්ෂිතයේ මීටත් වඩා ලස්සන ගල්ගුටි.ඒ ගල්කුටි ටිකත් සම්බන්ධ කර ගෙන මේ ගල්මැස්ස දියුණු කිරිම සුදුසු බව පවසන ලදි.එහි මාර්ගය ඉංජිනේරු කාර්යාලය ළඟින් දොඹේමඩ පාරේ ගමන් කළ යුතුය. එම මාර්ගය දෙපස කැලැදඹුල්ල රජමහ විහාරය,දැලිවල කොටවෙහෙර තිබෙනවා.මාර්ගය කාපට් කර තිබෙන නිසා අපිට දියුණු කර ගැනිමට අවශ්‍ය පදිවිගම්පොළ ගල්මැස්සය.ඒ සඳහා රක්ෂිතයෙන් අවසර ගැනිමක් සිදු කළයුතුය.රඹුක්කන නගර සංවර්ධනය තිබෙන නිසා මේක දියුණු කර ගත්තානම් හොඳය.අපට ලොකු ආදායම් මාර්ගයක් බිහි වෙයි.ඒ අවට ජනතාවගේ අදායම් මාර්ගය ඇති කර ගැනිම පුළුවන් වෙන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සංචාරක කර්මාන්තය දියුණු කිරිමට පුළුවන් වෙනවා.පදිවිගම්පළ මුල් කරගෙන ගරු මහීපාල හේරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සංචාරක කර්මාන්තය දියුණු කිරිම ක්‍රියාත්මක වුණා.කනක හේරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවිධ ව්‍යාපෘති ගෙන එන ලදි.පසුගිය කාලයේ දැලිවල විහාරයේ සනිපාරක්ෂණ කටයුතු කරගෙන ගිය බව පවසන ලදි.2023 වර්ෂයේ නගර සංවර්ධන සැලැස්මටද ඇතුළත් වුණා.සේනානායක මැතිතුමා මෙය ඉදිරියට ගෙන යන්න ඉදිරිපත් වුණ බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

අපේ රාජ්‍ය ප්‍රතිපත්තියේ කොටසක් තමයි සංචාරක ව්‍යාපාරය දියුණු කිරිම.ඒ අනුව අපි තීරණය කළා පින්නවල සංචාරක ගමනාන්තයක් බවට පත් කිරිමට ඒ අනුව තමයි රඹුක්කන දුම්රිය ස්ථානය නවීකරණය කිරිමට සැලසුම් කලේ.ලංකාවෙන් 100 ක් අරගෙන තිබෙනවා එයට රඹුක්කනත් අයිති වන බව පවසන ලදි.අපි පසුගිය සතියේ ශ්‍රමදානයක් සිදු කර ඒ සීමාව සම්පූර්ණයෙන්ම ශුද්ධ පවිත්‍ර කිරිම ආරම්භ කළා.එහි සංචාරක ගමනාන්තය වෙනුවෙන් ,ඉඹුල්ගස්දේණිය රණවන මාර්ගය සංචාරකයින්ට සුදුසු තැන් තිබෙනවා.ඒඅනුව ප්‍රාදේශීය සභාවේ සීමාව ඇතුළත සියලුම තැන්වල තොරතුරු ඇතුළත් කිරිම සිදු කරන බවත්,සංචාරක අමාත්‍යාංශය යටතේ රජයේ මැදිහත් වී සංචාරක කර්මාන්තය දියුණු කිරිමත් සමඟම සංචාරකයින්ගේ සුබවිහරණයට වැඩකටයුතු කරන බව පවසන ලදි.ඒ නිසා මෙය හොඳ යෝජනාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව ක්‍රියාත්මක වෙමින් පවතින යෝජනාවකි.අපේ ආණ්ඩුවේ ප්‍රමුඛතම ව්‍යාපෘතිය සංචාරක අමාත්‍යාංශය හරහා සංචාරක කර්මාන්තය දියුණු කිරිමයි.එම නිසා ඔබතුමියගේ යෝජනාව සැලකිල්ලට ගෙන අපිත් මැදිහත් වී කිරිමට හැකි බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

යෝජනාවේ සඳහන් ස්ථාන දියුණු කිරිමට ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ).යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගෙවීම් අනුමැතියට**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාරය සංකීරණය ඉදිකිරිම් කර්මන්තයේ බිල්පත තමා විශාල මුදලකට තිබෙන බව පවසමින් සභා අරමුදලින් පහත සඳහන් සියලුම ගෙවීම් සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ,අනීස්

මැතිතුමා සඳහන් කළ සංශෝධනයන්ට යටත්ව ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. kegalle Distributors(pvt)Ltd – රු105,420.00
(ආදාහනාගාරය සඳහා 37.5 kg ක ලිට්රෝ ගෑස් සිලින්ඩර් 06 ක් ලබා ගැනිම වෙනුවෙන් )
ලීලා ස්ටෝර්ස් ,A.K.W.පුෂ්ප කුමාර මයා -රු105,420.00
(ආදාහනාගාරය සඳහා 37.5 kg ක ලාෆ් ගෑස් සිලින්ඩර් 06 ක් ලබා ගැනිම වෙනුවෙන්)

ii. ජලම්පාදන හා ජලාපවාහන මණ්ඩලය -රු රු130,944.94
(2025 මැයි හා ජුනි මස ජල බිල්පත් ගෙවීම වෙනුවෙන්)

iii. ලංකා විදුලි බල මණ්ඩලය -රු47,365.80
(2025 මැයි ,ජුනි මාස වලට අදාළ විදුලි බිල්පත් ගෙවීම වෙනුවෙන්)

iv. S.D.S.කන්ස්ට්‍රක්ෂන් - රු5,273,445.93
(රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණය ඉදිකිරිම කර්මාන්තයේ 03 වන බිල්පත් වටිනාකම ගෙවීම වෙනුවෙන්)

v. නීතීඥ ප්‍රසාද් විමලරත්න මහතා - රු29,000.00
(නඩ අංක 47813 ට 2025.06.27 දින මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටිම වෙනුවෙන් ගෙවීම)

vi. Asian Eiectrical - රු5000.00
(විද්‍යුත් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම)

vii. පෝස්ට් මාස්ටර් ජනරාල් - රු30,000.00
(තැපැල් මුද්‍රණ වටිනාකම අලුත් කිරිම වෙනුවෙන් ගෙවීම)

viii. H.G.ලයනල් සරත් කුමාර මයා - රු25,000.00
(උඩුගම පුංචි වැලිකන්ද ජනපදයට ජල සම්බන්ධතාව ලබා ගැනිමට තබන ලද ඇප මුදල නැවත ලබා ගැනිම වෙනුවෙන් ගෙවීම)

ix. නීතීඥ එස්.සේනක ඉලංගන්තිලක මහතා - රු38,500.00
(2025.04.01 සිට 2025.05.31 දක්වා පැවති නඩු කටයුතු වෙනුවෙන් ගෙවීම)

x. කාර්යාල නිලධාරිනගේ ගමන් වියදම් රු8,485.00 ක මුදල ගෙවීම.
R.M.S.A.රත්නායක -රු3741.79
K.A.S.D.කලුආරච්චි -රු654.00
K.A.S.D.කලුආරච්චි -රු654.00
M.A.L.මාලනි -රු660.00
S.J.S.සමරසිංහ -රු2776.00

xi. සී/ස වි.සේ.ස.සමිතිය (රඹුක්කන) - රු412,380.50
(2025 වර්ෂයේ මැයි මස 01 දින සිට 31 දක්වා ඉන්ධන බිල්පත් සඳහා ගෙවීම වෙනුවෙන්)

xii. 2025.06.26 දින පවත්වන ලද සැලසුම් කමිටුව සඳහා සහභාගි වූ සභාපතිතුමා,නිලධාරින් 5 දෙනෙක් සහ කා.කා.ස.සඳහා රු15,500.00 ක දීමනා ගෙවීම.

xiii. 2025.07.25 දින රඹුක්කන මහජන පුස්තකාලය සහ ඉඹුල්ගස්දෙණිය මහජන පුස්තකාලය එක්ව ගැබිණි මාතාවන් සඳහා පෝෂණ වැඩසටහනේ සංග්‍රහ වියදම් වන රු9600.00 ක මුදල ගෙවීම.

xiv. ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි - රු 15,250.00
(2025 මාර්තු මස නිදහස් දුම්රිය බලපත්‍ර සඳහා ගෙවීම වෙනුවෙන්)

xv. බ්‍රවුන්ස් ඇන්ඩ් කම්පැණි පී.එල්.සී. ආයතනය - රු78,166.67
(RD -4337 අංක දරණ ටැෆේ ට්‍රැක්ටරයේ සුක්කානම ගැලවී යාමක් සිදු වී ඇති අතර එය සකස් කිරිම වෙනුවෙන් ගෙවීම.)

xvi. රංජනී බෙක් හවුස් - රු11,959.00
(2025.06.11 හා 2025.06.20 දින පැවැත් වූ මහ සභාවට සංග්‍රහයන් සඳහා ගන්නා ලද ද්‍රව්‍ය සඳහා ගෙවීම.)

xvii. ශ්‍රී ලංකා රජය මුල්‍ය ගණකාධිකාරි ආයතනය -රු20,000.00
(ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ රාජ්‍ය අංශය වන ශ්‍රී ලංකා රාජ්‍ය මුල්‍ය ගණකාධිකාරි සංගමය පවත්වන වාර්ෂික වාර්තා තරඟාවලියට අදාළ ගාස්තුව මුදල ගෙවීම.)

xviii. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝප්පරේෂන් ජෙනරල් ලිමිටඩ් -රු11,531.85
(SG RD -4337 අංක දරණ ටැෆේ ට්‍රැක්ටරයේ 2025.06.26 දින සිට 2026.06.25 දින දක්වා රක්ෂණාවරණය (පූර්ණ) ලබා ගැනිම වෙනුවෙන් ගෙවීම.)

xix. M.L.ටයර් වර්ක්ස් ආයතනයේ P.G.L.C.කුමාර මයා -රු500.00
(PF -7429 අංක දරණ ස්පෙටරෝ L -200 ඩබල් කැබ් රථයේ ඉදිරි වම් රෝදයේ පැච් දැමීම වෙනුවෙන් ගෙවීම.)

xx. M.L.ටයර් වර්ක්ස් ආයතනයේ P.G.L.C.කුමාර මයා - රු600.00
( RX -1980 අංක දරණ ගලි බවුසරයේ(ට්‍රැක්ටර් ටේලරයේ ) දකුණුපස රෝදයේ පැච් දැමීම වෙනුවෙන් ගෙවීම.)

xxi. නිමල් සර්විස් සෙන්ටර් -රු24,525.00
(52-6699 අංක දරණ ඉසුසු කැබ් රථයේ පූර්ණ වාර සේවාව සිදු කිරිම වෙනුවෙන් ගෙවීම.)

xxii. S.P.චෛතියවර්ධන මයා - රු2000.00,
W.A.J.P.විජේසිංහ මයා-රු2000.00
(ජල නල එලීම සඳහා මාර්ගය පළුදු කිරිමට තබන ලද ඇප මුදල් ගෙවීම වෙනුවෙන්)

xxiii. M.L.ටයර් වර්ක්ස් ආයතනයේ P.G.L.C.කුමාර - රු500.00
(RD -5925 අංක දරණ ට්‍රැක්ටර් රථයේ ඉදිරි වම් රෝදයේ පැච් දැමීමක් වෙනුවෙන් ගෙවීම.)

xxiv. I.N.P.ජයවර්ධන මයා - රු500,000.00
(මධ්‍යම අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පස් ප්‍රවාහනය කිරිමට මාර්ගය භාවිතා කිරිමට තබන ලද ඇප මුදල ගෙවීම වෙනුවෙන්)

xxv. M.L.ටයර් වර්ක්ස් ආයතනයේ P.G.L.C.කුමාර -රු600.00
(RV – 8542 අංක දරණ ටේලරයේ වම්පස රෝදයේ පැච් දැමීම වෙනුවෙන් ගෙවීම.)

xxvi. 2025 ජුනි මස අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියට අදාළ කම්කරුවන්ට දින වැටුප් රු134,400.00 ක මුදල ගෙවීම.

xxvii. කේ.ඒ.එස් ඩී.කලුආරච්චි මයා -රු63,325.00
(විශ්‍රාමික කාර්මික නිලධාරි 2025 මැයි මස දීමනාව ගෙවීම වෙනුවෙන්)

xxviii. 2025/06/02 සිට 2025/06/30 දක්වා සභික දීමනා රු478,500.00 ක මුදල ගෙවීම.

xxix. P.G.සෝමාවති මිය - රු2000.00
P.L.I.නිල්මිණි මිය -රු2000.00
W.J.U.මධුෂාන් මයා -රු2000.00
(ජල නල එලීම සඳහා මාර්ගය පළුදු කිරිමට තබන ලද ඇප මුදල් ගෙවීම වෙනුවෙන්)

**(ඊ).II.යථාපරිදි කල් දී නොමැති යෝජනා**

01.රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසලේ අලුත්වැඩියාවන් කිරිම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

1. රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසලේ පැවති නාම පුවරුව දිරාපත්ව ඇති බැවින් අලුත් නාම පුවරුවක් ලබා ගැනිම.
2. පුටු ඔන්චිල්ලාවේ පතුලේ තහඩුව දිරාපත් ව ඇති බැවින් එය පිළිසකර කර ගැනිම
3. ළිඳ අසල ආරක්ෂිත දැල කැඩී ඇති බැවින් එය පිළිසකර කර ගැනිම සඳහා පෙර පාසල් පාලිකාව ඉල්ලීම් කර ඇත.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

1.ප්‍රාදේශීය සභා පෙර පාසලේ නාම පුවරුව දිරාපත් වී ඇත.එක පැත්තක් පමණක් තිබෙන බවත් එය සකස් කර ගැනමට අවශ්‍ය බව පවසන ලදි.

2. පුටු ඔන්චිල්ලාවේ අබලන් වී ඇති නිසා එය සකස් කිරිමට අවශ්‍ය බව පවසන ලදි.

3. ළිඳ අසල ආරක්ෂිත දැල කැඩී නිසා ළිඳ ආරක්ෂිත වෙනවා එම නිසා එයට සකස් කර ගැනිම අවශ්‍ය බව පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
පෙර පාසලේ අලුත්වැඩියාවන් කිරිම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.02.**රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු නිෂ්කාර්ය වාහන හා යන්ත්‍ර 09 වර්තමාන තත්වය හා ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග වල නිර්දේශයන්ද සහිතව අනුමැතියට සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙහි කාර්මික වාර්තාව මන්ත්‍රීතුමන්ලාට නොමැති බැවින් එය ඊළඟ සභාවාරයේදී සාකච්ජා කිරිමට තීරණය වු බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**(ඊ).II.03.**රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු ZA – 0108 අංක දරණ බොබ් කැට් යන්ත්‍රයේ එන්ජින් පද්ධතියේ සම්පූර්ණ අළුත්වැඩියාවක් සඳහා ඉදිරිපත් කරන ලද මිල ඇස්තමේන්තුව සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බොබ් කැට් යන්ත්‍රය අලුත්වැඩියා කර ගෙනවිත් දවස් දෙකක් වැඩ කළපසු එම යන්ත්‍රයේ ඔවර් හීට් වෙනවා.එම රථය අළුත්වැඩියාව කළ ආයතනයේ නිර්දේශය තිබුණත් ඔවර්හීට් රේපයාර් එක කිරිමට අදාළ මිල ඇස්තමේන්තුව ඉදිරිපත් කරන බව පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ රු1,262,014.41 මිල ඇස්තමේන්තුව අනුමත කිරිම තීරය විය.

**(ඊ).II.04.**සභාව සතු 52 – 6699 අංක දරණ කැබ් රථයට ටයර් 04ක් , මඩ කවර 04ක් හා ඇතුළත කාපට් ලබා ගැනීමට හා PF- 7429 කැබ් රථයට ටයර් 04 ක් ලබා ගැනීම අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

52 – 6699 අංක දරණ කැබ් රථයට ටයර් 04 ද ගෙවී ගොස් ඇති බවත්, මඩ කවර 04ක් හා ඇතුළත කාපට් ලබා ගැනීම අවශ්‍ය බවත්, පවසන ලදි.ඒ වගේම PF- 7429 කැබ් රථයට ටයර් 04 ද ගෙවී ගොස් ඇති බව පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
52 – 6699 අංක දරණ කැබ් රථය අලුත්වැඩියා කිරිම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.05.**2025.04.01 සිට 2025.06.30 දක්වා දෙවන කාර්තුවට අදාළ මුද්දර බදු මුදල වන රු.34,772.00 ක මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම මුද්දර බදු මුදල ගෙවීම සිදු කරන්නේ.දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එම මුදල ගෙවිමට අවශ්‍ය බව පවසන ලදි.
අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට අනුමත කිරිම තීරණය විය.

**(එ).සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම.**

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

බොබ් කැට් යන්ත්‍රයේ ඕවර් හීට් වුණා කියන නිසා කියන්නෙ.මෙම සභාවේ වාහන අලුත්වැඩියා කරන්නේ ගාරාජ් වලින් විතරයි.වාහන ගැන සොයා බැලීමට හරිහැටි පුද්ගලයෙක් පත්කර නොමැත.අනෙක් එක ආයතනවලින් කොටේෂන් අරගෙන තමා මෙම වාහන හදනනේ.හදලා අවසන් වූ පසු පැහැදිලි පරීක්ෂණයකින් තොරව තමා නැවත රැගෙන එන්නෙ.එම දිරාපත් වූ වාහන නතර කර ඇත්තේ අපෙ මන්ත්‍රීතුමන්ලා පවසන විදිහට වාහන අංගනයේ ඒවා ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ඉවත් කිරිම කරනවා නම් හොඳ බවත්, සභාවේ වාහන සුදුසු පුද්ගලයකු යොමු කර පරීක්ෂා කර බලා නිසි අධීක්ෂණයක් යටතේ එම වාහන ධාවනය කිරිම සුදුසු බවට පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

පෙර පාසල් අලුත්වැඩියා කිරිමේ යෝජනාව ඉදිරිපත් වූ නිසා මම හිතුවා ඒ එක්කම මේය ප්‍රකාශ කිරිමට පෙර පාසලේ උගන්වන පාලිකාවන් සඳහා දීමනාවක් ලබා දී තිබෙනවා. එම දීමනාව දැන් අවුරුදු දෙකක තුනක සිට නවත්නා ඇති බව පාලිකාවන් සඳහන් කළා.ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර එම දීමනාව ලබා දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් පවසන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එම දීමනාව ලබාදීමට සැලකිලිමත් වන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා පවසන ලදි.

<u>අවසානය</u>

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ,ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,මාධ්‍ය වේදීන්ටත් ස්තුතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.40 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව,